24 වන කාණ්ඩය
15 වන කලාපය

බදාදා
1983 අගෝස්තු 10

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

**1983 අගෝස්තු 9 වන අඟහරුවාදා**

[වැඩ කටයුතු ඉදිරියට ගෙන යෑම]

**රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) කල් තැබීමේ යෝජනාව පනත් කෙටුම්පත :**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

---

**1983 අගෝස්තු 10 වන බදාදා**

**නිවේදනය :**

කථානායකතුමාගේ සහතික

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**මැතදී වූ සිද්ධීන් : ආණ්ඩුවෙන් ප්‍රකාශයක් ඉල්ලීම**

**පළාත්පාලන ණය සහන සභා පනත් කෙටුම්පත :**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

**සමුපකාර සමිති (සංශෝධන) පනත් කෙටුම්පත :**

දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදී

**කල් තැබීමේ යෝජනාව**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 24
இல. 15

புதன்கிழமை
10 ஓகஸ்ட் 1983

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

## பிரதான உள்ளடக்கம்


**செவ்வாய்க்கிழமை, 9 ஓகஸ்ட் 1983**

[நிகழ்ச்சித் தொடர்]

அரச காணிகள் (ஆட்சி மீளப் பெறுதல்) (திருத்தம்) சட்டமூலம் :
  இரண்டாம் மூன்றும் மதிப்புக்களிடம்பெற்று நிறைவேற்றப் பட்டது

ஒத்திவைப்புப் பிரேரணை

---

**புதன்கிழமை, 10 ஓகஸ்ட் 1983**

அறிவிப்பு :
  சபாநாயகரின் சான்றிதழ்கள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

சமீபகால சம்பவங்கள் : அரசாங்க அறிக்கைக்குக் கோரிக்கை

உள்ளூராட்சிக் கடன் வழங்கு சபைகள் சட்டமூலம் :
  இரண்டாம் மூன்றும் மதிப்புக்களிடம்பெற்று நிறைவேற்றப் பட்டது

கூட்டுறவுச் சங்கங்கள் (திருத்தம்) சட்டமூலம் :
  இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை


---

**Volume 24**
**No. 15**

**Wednesday**
**10th August 1983**

# PARLIAMENTARY DEBATES

(HANSARD)

OFFICIAL REPORT

**(Uncorrected)**

## PRINCIPAL CONTENTS


**Tuesday, 9th August 1983**

*(Continuation of Proceedings)*

STATE LANDS (RECOVERY OF POSSESSION) (AMENDMENT) BILL :
  Read a Second, and the Third time, and passed.

ADJOURNMENT MOTION

---

**Wednesday, 10th August 1983**

ANNOUNCEMENT :
  Speaker's Certificates

ORAL ANSWERS TO QUESTIONS

RECENT EVENTS : REQUEST FOR GOVERNMENT STATEMENT

LOCAL GOVERNMENT CREDIT COUNCILS BILL :
  Read a Second, and the Third time, and passed

CO-OPERATIVE SOCIETIES (AMENDMENT) BILL :
  Second Reading–Debate adjourned

ADJOURNMENT MOTION


2–A 71764–2,550 (83/8)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**1983 අගෝස්තු 9 වන අඟහරුවාද**
***செவ்வாய்க்கிழமை, 9 ஓகஸ்ட் 1983***
*Tuesday, 9th August 1983*

*1983 අගෝස්තු 9 වන අඟහරුවාද නිලවාර්තාවේ 1526 වන තීරුවේ සිට ඉතිරි වැඩ කටයුතු*

*[1983 ஓகஸ்ட் 9 செவ்வாய்க்கிழமைய அதிகார அறிக்கையின் பத்தி இலிருந்து நிகழ்ச்சித் தொடர்.]*
*(Continuation of Proceedings from col. 1526 of* OFFICIAL REPORT *for Tuesday, 9th August 1983)*

## රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත
### *அரச காணிகள் (ஆட்சி மீளப் பெறுதல்) (திருத்தம்) சட்டமூலம்*
## STATE LANDS (RECOVERY OF POSSESSION) (AMENDMENT) BILL

අ. භා. 5.58

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා** (කලවාන)
*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*
(Mr. Sarath Muttetuwegama–Kalawana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත පිළිබඳව, යම් යම් කාරණා සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවීම පිණිස වචන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මෙම පනතට උපත දුන්නේ එක්තරා හේතුවක්ය කියා ගරු ඇමතිතුමාම පිළිගෙන තිබෙනවා. මුල් පනත, එනම් රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත, යටතේ ඉඩමක් පිළිබඳව දමූ නඩුවකදී ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කරන ලද අර්ථ නිරූපණයක් අනුව දුන් තීන්දුවක් හේතුකොටගෙන මේ සංශෝධනය ගෙනෙන්නට සිද්ධ වී තිබෙනවාය යන්න ඇමතිතුමා මේ ගරු සභාවට අද ප්‍රකාශ කළා. මේ සංශෝධනයෙන් ඇමතිතුමා විශාල බලතල රජයේ නිලධාරින් කීප දෙනෙකුට පවරනවා. ඇත්තවශයෙන්ම රජයේ නිලධාරියාට—අදාල නිලධාරියාට—යම්කිසි ඉඩමක් "රජයේ ඉඩමක්" යයි සහතික කිරීමේ පූර්ණ බලතල මේ පනත යටතේ පවරනවා.

විශේෂයෙන්ම මේ මට්ටමේ රජයේ නිලධාරින් අතර යම්කිසි කටයුත්තක් කෙරෙන විට යම්කිසි පිළිගත් සම්ප්‍රදයක් තිබෙනවා. ග්‍රාමසේවකවරු, උප දිසාපතිවරු, දිසාපතිවරු යන විවිධ මට්ටම්වල නිලධාරින් මේ ප්‍රශ්න පිළිබඳව තමන්ගේ සොයා බැලීම යොමු කර අවසානයේ දී තීරණයක් ගැනෙනවා. අවසාන තීරණය කෙනෙක් ගත්තත් නිලධාරී පැලැත්තිය ගෙන බැලුවොත් මූලික තීන්දුව ගත් තැනැත්තාගේ රෙකමදරුවයි බොහෝ විට අවසාන තීන්දුව ගන්න නිලධාරියාත් අනුමත කරන්නේ. දැන් මේ තත්ත්වය යටතේ, කාලාන්තරයක් තිස්සේ—මේ රජයේ කාලසීමාවේදී පමණක් නොවෙයි—ලංකාවේ රජයේ නිලධාරින්ට ස්වාධීන නිලධාරින් හැටියට කටයුතු කිරීමෙ ඇති හැකියාව ක්ෂයවී තිබෙනවා. බොහෝ දුරට රජයේ නිලධාරින්-විශේෂයෙන්, ඒ පැලැත්තියේ නිලධාරින්—රජයේ නිලධාරින් හැටියට නොවෙයි වැඩ කරන්නේ. දේශපාලන බලවතුන්ගේ උපදෙස් පිටයි ඒ අය වැඩ කරන්නේ. මා නැවතත් කියනවා එය මේ රජය යටතේ පමණක් සිදුවුණු දෙයක් නොවන බව. පසුගිය රජය කාලයේදීත් ඊට ප්‍රථම රජයයන් යටතේත් විවිධ මට්ටම්වලින්, විවිධ ප්‍රමාණයෙන් මේ කටයුත්ත මේ විදියට සිදුවී තිබෙනවා. උප දිසාපති කෙනෙකු, ග්‍රාමසේවක කෙනෙකු බොහෝවිට දිසාපති වරයෙකු ඒ කටයුතු කරන විට ඔවුන්ට උපදෙස් දෙන, ඔවුන්ට නියෝග දෙන දේශපාලනඥයෝ ඉන්නවාය යන්න අද විවෘත රහසක්. එය එක පැත්තකින් රජයේ නිලධාරියාගේ තීරණය වන්නට පුළුවන්. සමහර විට, අනෙක් පැත්තෙන් ඒ තීරණවලට දේශපාලන බලපෑම් තිබෙන්නටත් පුළුවන්. එය රහසක් නොවෙයි.

අප දන්නවා, ශ්‍රේෂ්ඨාධිකරණය විටින් විට කියා තිබෙනවා, රජයේ ඉඩම් පවරා ගැනීමේදී පමණක් නොව, පෞද්ගලික ඉඩම් පවරා ගැනීමේදීත් නොයෙක් රජයයන් බොහෝවිට පවරා ගන්නේ තමන්ට විරුද්ධ දේශපාලන මත දරණ උදවියගේ ඉඩම්ය කියා. ඒ බව ගරු ඇමතිතුමා දන්නවා. මේ රජය පමණක් නොවෙයි ; මීට පෙර තිබුණු රජයයන් යටතේත් එහෙමයි. ඒ නිසා, මෙවැනි තත්ත්වයත්, මෙවැනි වාතාවරණයත්, මේ තරම් බලතල—

**ගාමිණී දිසානායක මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා)**
*(திரு. காமினி திஸாநாயக்க—காணி, காணி அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி அமைச்சரும்)*
(Mr. Gamini Dissanayake–Minister of Lands & Land Development and Minister of Mahaweli Development)

ගරු කලවාන මන්ත්‍රීතුමාට මම මතක් කරන්නට කැමතියි, ඉඩම් නිරවුල් කිරීමේ ව්‍යාපාරය යටතේ කිසිම දේශපාලන මතභේදයක් අප සැලකුවේ නැති බව. එය ගරු කලවාන මන්ත්‍රීතුමා ඒත්තු ගන්නවා ඇති.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

ඒක වෙනම කාරණයක්. ඒකට මම එනවා. මම කියන්නේ මේ පරිපාලන නිලධාරින්ට මෙවැනි බලතල දුන්නාම වන හානියයි. ඒක එතුමා දැක තිබෙනවා. ඒ නිසයි මෙම ගරු සභාවට අද ඇවිත් කිව්වේ "මම නීතියක් ගෙන එනවා ; නීතිය මෙයයි ; නමුත්නාත්සේලා මෙම නීතිය සම්මත කරන්න" කියා. නීතිය සීමාවෙන්නෙ මේ පනතෙ ඇතුලත් වගන්තිවලට පමණයි. නමුත් එතුමා තවදුරටත් කියනවා, මම මේ කාරණා සියල්ලම සැලකිල්ලට භාජනය කර තිබෙනවාය, ඒ අනුව මම මේ සභාවට යම්කිසි ප්‍රතිඥවක් දෙනවාය, එනම්, පරිපාලනමය වශයෙන් යම් යම් නියෝග මත මේ කටයුතුවලදී සිදුවන වැරදි හරි ගැස්සීමට මම බලතල ඉතිරි කරගෙන තිබෙනවාය, කියා.

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

I have got it here.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

ප්‍රශ්නය තිබෙන්නේ මෙයයි: නීතිය නීතියමයි. එතුමා දන්නවා, හදිසියේ වෙනස් වන යුගයක අප ජීවත්වන්නේ කියා. සමහර විට මේ ඇමතිතුමා මීට වඩා බලතල තිබෙන වෙනත් අමාත්‍යාංශයකට යන්න පුළුවන්. එතුමාට එවිට දෙන්න පුළුවන් සහතිකය මොකක්ද? ඊළඟට එන ඇමතිවරයාට එතුමා කල්පනා කරන විධියටම මේ ප්‍රශ්නය ගැන කල්පනා කරන්න පුළුවන් වෙයිද? මොකද? නීතිය එක් පැත්තකින්. එයත් අපි මතක තබා ගන්න ඕනැ. නීතිය අනුව නිලධාරියා දෙන සහතිකය අවසානයයි. එතුමා කිව්වා "මම පරිපාලනමය වශයෙන් යම් යම් ආරක්ෂිත මාර්ග අනුගමනය කරන්න යනවා" කියා. ඒ එතුමා අවංකවම හිතන විධිය වෙන්න ඇති. එතුමා කිව්වා වාගේ යම් යම් අවස්ථාවල එතුමා පෙන්නුම් කර තිබෙනවා, දේශපාලන මත භේදවලින් තොරව එතුමාට ක්‍රියා කරන්න පුළුවන් බව. අර ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ කරන ලද යම් යම් කටයුතුවලදී එතුමා අපක්ෂපාතව ක්‍රියා කර තිබෙනවා. නමුත් මම කියන්නෙ මෙය පුද්ගලික ප්‍රශ්නයක් නොවන බවයි. නීතිය නීතියමයි. මේ සංශෝධනය නීති පොතට ඇතුලත් වුණාට පසුව ඒ සංශෝධන නීතිගත වෙනවා. එතුමා ඔය දරන තනතුර දරන තෙක් එතුමා දෙන සහතිකය අපි පිළිගන්නවා. නමුත් ඊටපසුව මොකද වෙන්නෙ? ඊටපසුව වෙන දේ ගැන එතුමාට සහතික වෙන්නත් බැහැ. මේ සංශෝධනය සම්මත කරන මේ සභාවට කිසි සහතිකයක් දෙන්නත් බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

සංසාරය වගෙයි.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவேகம)*
(Mr. Sarath Muttetuwegama)

නැහැ, නැහැ. සංසාරය වගේ නොවෙයි. අපි සංසාරය ගැන කතා කරන්න ගියොත් හුඟක් දුරට කතා කරන්න ඕනෑ. ප්‍රශ්නය තිබෙන්නෙ මේ සංශෝධනය ගැන කතා කරන එකයි. සංශෝධනය නීතිගත වුණාට පසුව සංසාරය කොතෙක් දිගට තිබුණත්, හැමෝටම—ග්‍රාමීය සංවර්ධන ඇමතිතුමා කියන උදවියටත්—එසේයි. අපේ ගම්වල ජීවත්වන අර දුප්පත් දිළිඳු, ඉඩම් නැති. ඒ නිසා රජයේ ඉඩමක ජීවත්වන ගැමියන්ටත් එසේමයි. එතුමාට ඒ ගැන කිසිම සහතිකයක් දෙන්න බැහැ. එතුමාගෙන් පසුව—ගරු ඇමතිතුමාගෙන් පසුව—ඒ තිලයට එන පුද්ගලයා ගැන මොකක්ද අපි හිතන්නෙ? ගරු ඇමතිතුමා එතුමා වෙනුවෙන් කරන ප්‍රතිඥව සියයට සියයක් මම පිළිගන්නවා. නමුත් ඊළඟට එන එක්කෙනා? මම කියන්නෙ නමුන්නාන්සේගේ ඇමතිකම නැති වෙනවා කියා නොවෙයි. ඔය තත්ත්වයට වඩා උසස් තත්ත්වයක් ලැබෙනවා කියලයි. ඊළඟට එන එක්කෙනා මොකක්ද කරන්නෙ? ඔහු ගැන අපට තිබෙන සහතිකය මොකක්ද? ඒ නිසා තමයි මම කියන්නෙ මෙය අවදානම් ප්‍රතිපත්තියක්ය කියා. ඒ කියන්නේ එක නීතියක් සම්මත කරගෙන, ඒ ඒ නීතියෙන් ඇතිවිය හැකි අමාරුකම්, පරිපාලනමය චක්‍රලේඛන මගින් මම මැඩපවත්වනවාය කියා ඇමතිතුමාට කියන්න පුළුවන්. නමුත් නීතිය සම්මත වී ඒ නීතිය අප ඉදිරිපිට සදහටම තිබෙනවා. ඒ නිසා තමයි මම කියන්නෙ මේ පනතේ තිබෙන දුෂ්කරතාවයන්, අපහසුතාවයන් ගැන නීතිමය පිළියමක්ම අවශ්‍යයි කියා. පරිපාලනමය චක්‍රලේඛනවලින් දෙන සහතිකය මේ ඇමතිතුමාගේ කාලයට පමණයි වලංගු වෙන්නෙ. ඒ නිසා මෙයින් අපේ පළාත්වල ගැමියන්ට විය හැකි අපහසුතාවයන් ගැන කල්පනා කරන්න ඕනෑ.

මේ සංශෝධන පනතේ උත්පත්තිය බැලුවත් පෙනෙන්නෙ මොකක්ද? මට ආරංචි හැටියට නුවර පැත්තේ සේනානායක කියා මහත්මයෙක් බිත්තියක් කඩන්න කළ නියෝගයක් උඩයි මේ පනත බිහිවී තිබෙන්නෙ. එය මේ සංශෝධනයේම ඇවිත් තිබෙනවා. මෙහි බලතල බොහොම වැඩියි. නිලධාරීන්ට තිබෙන බලතල වැඩියි. නිලධාරීන්ට තිබෙන බලතල කිව්වාම අයිති වෙන්නෙ ගම්වල ඉන්න දේශපාලනඥයින්ට තිබෙන බලතලයි. අද නිලධාරීන් බොහෝ දුරට ස්වාධීන පුද්ගලයන් නොවෙයි. සමහර විට ග්‍රාමෝදය මණ්ඩලයේ කෙනෙක් වෙන්න පුළුවන්. වෙන කවුරු හරි දේශපාලනඥයෙක් වෙන්න පුළුවන්. මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන්. කවුරු හරි හෝ වෙන්න පුළුවන්. ඔහුගේ බලපෑම යටතේ නිලධාරියා දෙන සහතිකය අවසාන සහතිකය බවට පත් වෙනවා. ඒ නිසා සැඟවුණු භයානකකමක් නොවෙයි, විවෘත භයානකකමක් මෙහි තිබෙනවා.

ගරු ඇමතිතුමා කිව්ව වුවමනාවත් මම පිළිගන්නවා. රජයට තමන්ටම අයිති ඉඩම් පවරා ගන්න බැරිකමක් තිබෙනවා නම්, ඒ රජය අක්‍රීය රජයක්. ඒ නිසා මම ඒ අපහසුතාවයන් නම් පිළිගන්නවා. නමුත් ඒ අපගසුතාවයන් මැඩපැවැත්වීමට බරපතල බලතල නිලධාරි මහත්වරුන්ට දුන්නාම මේ වගේ වාතාවරණයක් යටතේ ඇති විය හැකි හානිය සහ ඉතාම අනතුරුදායක තත්ත්වය පිළිබඳව තමන්ගේ කල්පනාව නැවත වරක් යොමු කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අ. භා. 6.08

**අමරසිරි දොඩන්ගොඩ මහතා** (බද්දේගම)
*(திரு. அமரசிறி தொடங்கொட—பத்தேகம)*
(Mr. Amarasiri Dodangoda–Baddegama)

නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කළ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී අදහස් දැක්වූ මන්ත්‍රීවරුන් විශේෂයෙන් උඩරට සහ උතුරු මැද පළාත පිළිබඳව අවධානය යොමු කළා. එම නිසා මේ අවස්ථාවේදී මා විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා, දකුණු ප්‍රදේශයේ ඉඩම් නොමැති ජනතාවට මේ පනතෙන් ඇති වන බලපෑම් පිළිබඳව කරුණු කීපයක් මේ ගරු සභාව ඉදිරියේ තබන්න.

මෙම සංශෝධනයට තුඩු දුන් නඩු තීන්දුවට පස්සේ ඉඩම් කොමසාරිස් තුමා විසින් මේ අවුරුද්දේම චක්‍රලේඛයක් නිකුත් කරනු ලැබ, මෙවැනි ඉඩම්වල සන්තකය නැවත ලබා ගැනීම පිළිබඳව විශේෂ ක්‍රමයකුත් ඉදිරිපත් කර තිබුණා.

අනවසර පදිංචිකරුවන්ගෙන් ඉඩම් සන්තකය නැවත ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මේ සංශෝධනය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවිය යුතු විශේෂ කාරණයක් තිබෙනවා. එයේ ඒ අනවසර පදිංචිකරුවන්ගෙන් ඉඩම් සන්තකය නැවත ලබා ගැනීමට කලින් ඒ පදිංචිකරුවන්ගේ ආර්ථික තත්ත්වය නැත්නම් ඉඩම් අයිතිය පිළිබඳව සැලකිලිමත් වුණොත් හොඳයි කියා මා කල්පනා කරනවා. මා එහෙම කියන්නේ විශේෂ හේතුවක් නිසයි. අනවසරයෙන් රජයේ ඉඩම් අයිති කර ගෙන ඉන්නා අය අතර ප්‍රධාන කොටස් දෙකක් ඉන්නවා. ඒ විධියට රජයේ ඉඩම් අක්කර කීපයක් බලහත්කාරයෙන් වගා කරගෙන ඉන්නා ඇතැම් කොටසකට වෙනත් තැන්වල ඉඩම් අයිතිය තිබෙනවා. ගාලු දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් අනවසරයෙන් අයිති කරගෙන ඉන්නා, වෙනත් තැන්වල තමන්ට ඉඩම් අයිතිය තිබෙන අය පවා සටන් කරනවා, අර රජයේ ඉඩම්වල අයිතියත් තහවුරු කර ගන්න.

ඒ වගේම තමන්ගේ පදිංචියට නිවසක් තනා ගැනීම සඳහා බිම් අඟලක්වත් නැති විශාල පිරිසකුත් රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී ඉන්නවා. එම නිසා, මේ කොටස් දෙකටම මෙම සංශෝධනය එකම ආකාරයට බල පාන්න ගියොත්, ජීවත් වීම සඳහා ගෙපළක් හද ගන්න බැරි සැහෙන පිරිසකට විශාල අසාධාරණයක් වන බව පෙන්වා දෙන්න කැමතියි.

මේ සම්බන්ධයෙන් මම ඇමතිතුමාට නිදර්ශනයක් ඉදිරිපත් කරන්නම්. ගිං ගඟ ව්‍යාපාරයට ගොදුරු වුණු, මැදිවුණු සැහෙන පිරිසකට තවම ඒ වෙනුවෙන් වෙනත් ඉඩම් ලැබී නැහැ.

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

ගිං ගඟ යෝජනා ක්‍රමය පිළිබඳ සැලසුම් සකස් කළේ නමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයේ සිටි කාලයේදියි. ඒ පිළිබඳ ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී අදාල පුද්ගලයන්ට වන්දි ගෙවීමට හෝ වෙනත් තැන්වලින් ඉඩම් ලබා දීමට හෝ වෙනත් සහනයක් සැලසීමට හෝ කිසිම සැලැස්මක්, ප්‍රතිපාදනයක් ඊට ඇතුළු කර නොතිබීම ගැන මා බොහොම කනගාටු වෙනවා. මා කළේ ඒ ආණ්ඩුව අත්සන් කර තිබුණු වැඩ පිළිවෙළ අවසන් කළ එක පමණයි.

නමුදු දැන් අපේ දිසා ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් සමහර විට නමුන්නාන්සේලාත් ඉදිරිපත් කරන ඉල්ලීම් උඩ අපි ක්‍රියා කරගෙන යනවා, වෙනත් තැන්වලින් ඉඩම් ලබා ගෙන ඒ පිරිසට ඒවා බෙදා දෙන්න.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
*(திரு. அமரசிறி தொடங்கொட)*
(Mr. Amarasiri Dodangoda)

ඒ ක්‍රියා මාර්ගය ගැන ස්තුතිවන්ත වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! We have to take the vote in about twenty minutes' time. I would request all other Members to finish their speeches taking 5 minutes each.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
*(திரு. அமரசிறி தொடங்கொட)*
(Mr. Amarasiri Dodangoda)

මම අදහස් කළේ ගිං ගඟ ව්‍යාපාරය තුළින් නිදර්ශනයක් දැක්වීමටයි. ඒ මන්ද? ඔක්තෝබර් මාසය පමණ වන විට ඒ ප්‍රදේශයට ගංවතුර ගලනවා. එහෙම ගංවතුර ගලන විට ඒ ගංවතුරට මැදි වුණු, වේලිවලට මැදි වුණු පිරිස් ගංවතුරින් බේරෙන්නට හදිසියේ රජයේ ඉඩමක පදිංචි වුනොත් ඒ අයත් අනවසර පදිංචිකරුවන් බවට පත්වෙනවා. එවැනි අයට ඉඩම් නැතිකම නිසා, ඒ අයගේ ප්‍රශ්නයට ඉක්මනට විසඳුමක් නොලැබීම නිසා හදිසි අවස්ථාවක එසේ පදිංචි වුණත් ඒ අයත් අනවසර පදිංචිකරුවන් වෙනවා. ඒ අයටත් මේ සංශෝධනය බලපානවා නම් එතැනදී අසාධාරණයක් සිදු වෙනවා. මෙන්න මේ නිසා මේ සංශෝධනයේදී, රජයේ අනවසර ඉඩම්වල සන්තකය ආපසු ලබා ගැනීමේදී ඒවායේ පදිංචිකරුවන්ගේ ඒ පදිංචියේ අභිප්‍රාය පිළිබඳව සැලකිලිමත් විය යුතුය කියන එකයි, අපේ අදහස.

ඒ වාගේම රක්ෂිත කැලෑ පිළිබඳව ගරු නියෝජ්‍ය ඇමතිවරයෙක් මේ ගරු සභාවේදී සඳහන් කළා. වැව්ලි සංස්ථාවට පැවරුණු මේ වාගේ කැලෑ අද කොන්ත්‍රාත්කරුවන් විසින් කපාගෙන යනවා. ඒ කැලෑ කැපීමෙන් වන හානිය පිළිබඳව මම විස්තර කරන්නට වුවමනා නැහැ. නාකියාදෙනිය වතුයායේ අක්කර සියයකට වැඩිය තිබුණු රක්ෂිත කැලෑවෙන් අක්කර පණහකටත් වඩා දැන් කපා හමාරයි. එම නිසා ගම් කීපයක් හරහා ගිය ජල මාර්ගයක් අද වියළී ගොස් තිබෙනවා. මෙන්න මේ වාගේ රක්ෂිත කැලෑ පිළිබඳව විශේෂ සොයා බැලීමක් කරන්නය කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒ වාගේම තවත් කාරණයක් පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්නට කැමතියි. රජයේ ඉඩම් සන්තකය නැවත ආපසු ලබා ගැනීමට පමණක් මෙම පනත සීමා වී තිබෙනවා. රජයේ ඉඩම් සෑහෙන ප්‍රමාණයක් ඉඩම් කච්චේරිවලින් බෙදා දීමෙන් සහ ජනතාව කලක් තිස්සේ පදිංචි වීමෙන් අත්පත් කර ගත්තාට පස්සේ විශේෂයෙන් අද දකුණු පළාතේ ඉඩම් හිඟයට පිළියමක් යෙදිය හැකි වී තිබෙන්නේ රාජ්‍ය වැව්ලි සංස්ථාවට පවරනු ලැබූ ඉඩම්වලින් පමණයි. රාජ්‍ය වැව්ලි සංස්ථාව සතු එම ඉඩම් මුඩු ඉඩම් හැටියට හඳුන්වන්නට පුළුවනි. එවැනි ඉඩම් සෑහෙන ප්‍රමාණයක් අපේ දිස්ත්‍රික්කවල තිබෙනවා. නමුත් සංස්ථාව විසින් එකී ඉඩම් උකස් තැබීමේ හේතුවෙන් ඒ ඉඩම්, ඉඩම් නැති අය සඳහා පැවරීමට හෝ බෙදා දීමට අපහසු තත්ත්වයක් ඇති වී තිබෙනවා. එම නිසා මේ ඉඩම් සන්තකය පවරා ගන්නවා වගේම මුඩු ඉඩම් වශයෙන් රාජ්‍ය වැව්ලි සංස්ථාව සතුව තිබෙන ඉඩම්, නැවත වගා නොකරන ඉඩම් ජනතාවට පැවරීමේ වැඩ පිළිවෙළකුත් මේ අවස්ථාවේදී ඇති කිරීම ඉතාමත් වැදගත් වෙනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමා වැදගත් අදහසක් ඉදිරිපත් කළා. ඒ එම ප්‍රදේශවල ඉඩම් පිළිබඳ අනවසර භාවයේ සහ අනවසර නොවන භාවයේ වැදගත්කම පිළිබඳව ප්‍රදේශයේ මන්ත්‍රීවරයාගේ අනුමැතිය ඉතා වැදගත්ය කියන එකයි. ඇත්ත වශයෙන්ම ඒ අදහසට අපි ගරු කරනවා. මම මීට වැඩිය කතා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මගේ වචන ස්වල්පය මෙයින් සමාප්ත කරනවා.

**දිනේෂ් ගුණවර්ධන මහතා** (මහරගම)
*(திரு. தினேஷ் குணவர்த்தன—மஹரகம)*
(Mr. Dinesh Gunawardene–Maharagama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාරණා බොහොමයක් පළ වුණු නිසා මා ඒ කාරණා නැවත ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ රටේ ජනතාව සන්තකව තිබුණු ඉඩම් රජය සන්තක බවට පත් කළේ සුද්දන්ගේ කාලයේදී බව අපි දන්නවා. ඉන් පසු තමයි රජයේ ඉඩම් කියා ඉඩම් වර්ගයක් ඇති වී තිබෙන්නේ. විජාතික කොම්පැනිවලට—පිටරට කොම්පැනිවලට—මේ රටේ යම් යම් ව්‍යාපාර ගෙන යෑමට අවස්ථාව ලබා දීමට අදහස් කර තිබීම ගැන මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඇමතිතුමා කිව්වා රජයේ කාර්යයන් සඳහා පමණයි මේ නීතිය පාවිච්චි කරන්නේ කියා. රජයට සම්බන්ධ අධිකාරි මගින් යෝජනා කරල, කරන්නට බලාපොරොත්තු වන යම් යම් වැව්ලි කර්මාන්ත, පිටරට කොම්පැනිවලට දෙන්නට බලාපොරොත්තු වෙනවා. අපේ රටේ ගම් නියම් ගම්වල ජනතාව ඒවායේ—රජයේ ඉඩම්වල—කාලයක් පදිංචි වී සිටියා. ඒ අය ඉවත් කරන්න උත්සාහ දැරුවේ නැහැ. ඒ ගැමියන් ඉවත් කරල, මේ රටේ පාරම්පරික ජන්ම භූමිවලින් ඔවුන් සදහටම ඉවත් කරල, පිටරට කොම්පැනිවලට ඒ භූමි පවරා දෙන්නට මේ නීතිය පාවිච්චි කරනවද නැද්ද කියා ඇමතිතුමා ප්‍රකාශ කළේ නැහැ.

මා විශේෂයෙන් මේ ප්‍රශ්නය නගන්නේ වෙල්ලස්සේ මේ ප්‍රශ්නය පැන නැගී තිබෙන නිසයි. ඒ වගේම මේ ප්‍රශ්නය තවත් ප්‍රදේශවල පැන නගින්නට පුළුවන්. මේ ගැන ගරු ඇමතිතුමා මෙම සභාවට අද ප්‍රතිඥාවක් දෙනවා නම් අපි එය ඉතා අගය කරනවා. ඒ වාගේම ගරු ඇමතිතුමාගේ කථාවේදී, මන්ත්‍රීවරුන් මාර්ගයෙන් මේ කාර්යභාරය ඉෂ්ට කරනවාය කියන එක කියැවුණා. එහි අදහස ජනතාවට අසාධාරණයක් සිදු වෙනවා නම් මන්ත්‍රීවරුන්ගේ නිර්දේශ මතයි එය සිදු වෙන්නේ කියන ටිකයි. ඒ කියන්නේ මන්ත්‍රීවරුන් මැදිහත් වුණොත් ආණ්ඩුවට ඉඩම් ගන්න එක නවත්වන්නට අවකාශය ලැබෙන්නට ඉඩ තිබෙනවාය කියන එකයි. මේ ප්‍රශ්නය පිළිබඳ විශේෂ ප්‍රශ්නයක් අපේ ග්‍රාමීය කර්මාන්ත ඇමතිතුමා නැගුවා. තොන්ඩමන් ඇමතිතුමා නැගූ ප්‍රශ්නය අනුව, රජයේ ඉඩම්වල පදිංචිකරුවන් විය යුත්තේ බලහත්කාරයෙන් පදිංචි වෙලා ඉන්න අයද කියන නිර්දේශය කරන්නට උතුරු පළාතෙත්, නැගෙනහිර පළාතෙත් මන්ත්‍රීවරුන්ට අයිතිය දෙනවාද කියන ප්‍රශ්නය ගැනත්. ඒ තත්ත්වයට තීරණයක් ගත්තොත් අපි ඒ සන්තකය ආපසු ලබා ගන්නේ කෙසේද කියන එක ගැනත් මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි. විශේෂයෙන් වවුනියා ප්‍රදේශයේ, මුලතිව් ප්‍රදේශයේ [බාධා කිරීම්].

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

මන්ත්‍රීවරුන්ට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ඒවා පිළිගන්නවාද නැද්ද කියන එක මගේ තීරණයක්.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)

ගරු ඇමතිතුමා දැන් කිව්වා, මන්ත්‍රීවරුන්ට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්ය. ඒ මන්ත්‍රීවරුන්ගේ කරුණු පිළිගන්නවාද නැද්ද කියන එක තමන්ගේ තීරණයක්ය කියා. ඒ කියන්නේ මන්ත්‍රීවරුන්ගේ නිර්දේශයත් සම්පූර්ණයෙන් පිළිගන්නට ඇමතිතුමා සූදානම් නැහැ කියන එකයි. [බාධාකිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please!

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)

ඒ වගේ විශේෂ ප්‍රශ්න තිබෙන ප්‍රදේශවල—[බාධාකිරීම්]

**ඒ. එම්. එස්. අධිකාරි මහතා**
*(திரு. ஏ. எம். எஸ். அதிகாரி)*
(Mr. A. M. S. Adikari)

ආණ්ඩු පක්ෂයේ හෝ වේවා විරුද්ධ පක්ෂයේ හෝ වේවා ඒ ඉල්ලීම් සාධාරණ වෙන්න ඕනෑ. ඇමතිතුමාට සාධාරණයි කියා හැඟී ගියොත් පමණයි ඒ තීරණ ගන්නේ. අසාධාරණ ඉල්ලීමක් වුණොත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ වුණත් අපි එය ප්‍රතික්ෂේප කරනවා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)

ආණ්ඩු පක්ෂයේ හෝ වේවා, විරුද්ධ පක්ෂයේ හෝ වේවා ලංකාවේ පුරවැසියෙකු නැති අයට මේ රටේ ඉඩම්වල—රජයේ ඉඩම්වල—විවිධ සිටීමට අද ඇති කර තිබෙන තත්ත්වයට ඉඩ දෙන්නට එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

කියන එක සඳහායි මේ පනත සම්මත කිරීම සඳහා මා ඡන්දය පාවිච්චි කරන්නේ කියා මා ප්‍රකාශ කර සිටිනවා. මේ රටේ පුරවැසියන් නොවන අයට මේ අයිතිය පාවිච්චි කරන්නට ඉඩ දෙන්න එපා. මේ රටේ පුරවැසියන් වන අය කාලයක් තිස්සේ වගා කළ ඉඩම්වල ඒ අයිතිවාසිකම තහවුරු කරන්නට මේ පනත පාවිච්චි කරන්නටය කියන ඉල්ලීම පමණයි මා අවසාන වශයෙන් කරන්නේ.

අ. භා. 6.23

**එච්. ජී. පී. නෙල්සන් මහතා (ත්‍රිකුණාමලය දිසා ඇමතිතුමා)**

*(திரு. எச். ஜீ. பி. நெல்சன்—திருகோணமலை மாவட்ட அமைச்சர்)*

(Mr. H. G. P. Nelson–District Minister, Trincomalee)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා මෙවැනි වැදගත් පනතක් මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීම ගැන. මෙම පනත ඉදිරිපත් කළයුතුව තිබුණේ ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේ ; සී. පී. ද සිල්වා ඇමතිතුමාගේ කාලයේ. ප්‍රමාද වී හෝ අපේ ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා හා මහවැලි සංවර්ධන ඇමතිතුමා මේ පනත ඉදිරිපත් කිරීම ගැන පොලොන්නරුවේ ප්‍රදේශවාසීන් වෙනුවෙන් මගේ ගෞරවය එතුමාට පිරිනමනවා. පොලොන්නරු දිස්ත්‍රික්කයේ බොහොමයක් තිබෙන්නේ රජයේ ඉඩම්. ඒ ඉඩම්වලත්, රජයට අයත් ගොඩනැඟිලිවලත් බලෙන් පදිංචිව සිටින්නත් ඒවායින් ඉවත් කර ගැනීම අපට ලොකු ප්‍රශ්නයක්ව තිබෙනවා. උසාවියට ඒ නඩු ගෙන ගියත් නීතියේ අඩුපාඩු නිසා ඒවා ඉවත දමනවා. මේ පනතෙන් ඒ කාර්යය ඉෂ්ට වීම නිසා මේ පනත ඉතාමත්ම වැදගත්ය කියන එකයි මගේ හැඟීම.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයත් ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. නිවාස යෝජනා ක්‍රම ආදිය ඇති කිරීමට ඒ ඉඩම් ලබා ගැනීමට යැමේදී නොයෙකුත් ප්‍රශ්න ඇති වුණා. ඒ නිසාම සමහර නිවාස යෝජනා ක්‍රම අත්හරින්නට අපට සිදු වුණා. කෙසේ වෙතත් මේ පනතෙන් ඒ කාර්යයත් ඉෂ්ට කර ගන්නට පුළුවන් වේ යයි මම හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්න කැමතියි අපේ ප්‍රදේශයේ අනවසර ඉඩම් හිමියන් දහස් ගණනක් හිටිය බව. ගරු ඉඩම් ඇමතිතුමාගේ විශේෂ ක්‍රියා මාර්ගය නිසා ඒ අනවසර ගොවි මහත්වරුන්ට ඔප්පු ලබා දීමට, බලපත්‍ර ලබා දීමට මේ රජය ක්‍රියා කර තිබෙනවා. ඒ වාගේම කොත්මලේ ගරු මන්ත්‍රීතුමා කිව්වා එතුමාලාගේ කාලයේ ඉඩම් ප්‍රතිපත්තිය ගැන. අද මාදුරුඔය ජලාශය යටතේ අක්කර 1,25,000 ක් මහජනයා සන්තක කරවීමට කටයුතු කරගෙන යනවා දකින්න පුළුවන්. ඒ වාගේම ස්වර්ණ භූමි ව්‍යාපාරය යටතේ ඇතිකර තිබෙන තත්ත්වය නිසා, අනවසර ගොවියන්, අනවසර ඉඩම් හිමියන් ආදී වශයෙන් කියන්නට පුළුවන් තත්ත්වයක් අද නැහැ. අද හැම දෙනාටම බලපත්‍රයක් ලබා දීමට කටයුතු කර තිබෙනවා. ඒ හැමටම සින්නක්කර ඔප්පු ලබාදීමට කටයුතු කර තිබෙනවා.

මෙම පනත යටතේ ඉදිරිපත් කරන්නට මට කරුණු රාශියක් තිබුණත් කථාව විනාඩි පහකට සීමා කර තිබෙන නිසා ඒවා ඉදිරිපත් කරන්නට අවස්ථාවක් නොලැබීම ගැන කණගාටු වෙමින් මම නිහඬ වෙනවා.

අ. භා. 6.26

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)**

*(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க—கண்டி மாவட்ட அமைச்சர்)*

(Mr. W. P. B. Dissanayake–District Minister, Kandy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය සීමා කර තිබෙන නිසා, මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ දීර්ඝ කතාවක් කරන්න. රජයේ ඉඩම් සන්තකය ආපසු ලබාගැනීම අවශ්‍ය වූ නිසා, පසුගිය දිනක ගරු ඉඩම් ඇමතිතුමා මේ සභාවට පනතක් ඉදිරිපත් කළා. එය මේ සභාව අනුමත කළා. ඒ පනතේ එක් ස්ථානයක තිබෙන දුර්වලකමක් නිසා, ඒ පනත ක්‍රියාත්මක කිරීමේදී ඇති වී තිබෙන ඝට්ඨනයක් උඩ අද එය සංශෝධනය කරනවා.

මම හිතනවා මේ පනත ගැන සාකච්ඡා කිරීමක්, වාද විවාද කිරීමක් අවශ්‍ය නැහැ කියා. නමුත් මේ පනත මේ සභාවට ඉදිරිපත් කිරීමේ හේතුවෙන් මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ කරුණු එකක් දෙකක් ගැන මට මතක් කරන්නට සිද්ධ වෙලා තිබෙන නිසයි මම නැඟී සිටියේ. රජයේ නිලධාරීන්ට මේ පනතෙන් විශේෂ බලතල ලැබීමෙන් ඒවා අයුතු ලෙස පාවිච්චි කිරීමේ හේතුවෙන් විශාල ප්‍රශ්නයක් ඇති වෙන්නට පුළුවන්ය කියා භයක් එක්තරා මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කළා.

මම රජයේ නිලධාරීන්ගේ අද්වකාත් කෙනෙක් වශයෙන් කටයුතු කරනවා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් අංශයේ කටයුතු කරන නිලධාරීන් ගැන මම දන්නවා. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කටයුතු කරන නිලධාරීන් ගැන මම දන්නවා. ඉඩම් අංශයේ ඉන්න නිලධාරීන් ගැනත් දන්නවා. මේ වාගේ වගකීමක් ඇති උසස් නිලධාරීන් කරන කටයුතු ගැන අපි මේ විධියට සැක පහළ කිරීම ඉතාමත්ම අසාධාරණයි කියා මම කියන්න ඕනැ. අද වනතුරු කිසිම අවස්ථාවක මේ සභාවේදී හෝ පිටතදී හෝ උසාවියකදී හෝ මේ නිලධාරීන්ගේ අවංක භාවය ගැන තර්කයක් කවදාවත් ඇති වෙලා නැහැ. එම නිසා එවැනි බියක් ඇති කර ගන්න එපාය කියා මම අවංකවම ප්‍රකාශ කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් එක් කාරණයක්, එනම්, මේ පනත ක්‍රියාත්මක කිරීමෙන් පරම්පරා ගණනක් පදිංචි වී සිටින ඉඩමෙන් දේශීය පුරවැසියන්ට එහෙම නැතිනම් අපේ රටේ පුරවැසියන්ට තම අයිතිවාසිකම් අහිමි වෙයිද කියන ප්‍රශ්නය මතු වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටින උදවිය සම්බන්ධයෙන් සමීක්ෂණයක් කළා. එම සමීක්ෂණයෙන් පසුව එක් අයකුවත් ඉඩම්වලින් එළියට දමන්න කටයුතු කර නැහැ. හැම කෙනෙකුටම ඒ ඉන්න තැන්වලම ඉඩම් ලැබුණා. වැඩියෙන් අල්ලාගෙන තිබුණු ඉඩම් පමණක් ආපසු අරගෙන ඒ පවුල්වල වෙනත් උදවියට දුන්නා. මහනුවර ඇති වුණු එක නඩුවක් නිසා තමයි මේක ආවේ කියා මම කිව්වාම මේ මන්ත්‍රීවරුන් අහයි, එහෙම නම් එයාට මොකද වෙන්නට යන්නේ කියා. ඉඩමක් නොවෙයි, රජයට පවරා ගත් ඉඩමක තිබෙන ගොඩනැගිල්ලක්—එයාට වෙනත් ඉඩම් තිබෙද්දී, ආණ්ඩුවෙන් දුන් ඉඩම් තිබෙද්දී—අල්ලාගෙන ඒකෙ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනවා. රජයේ කාර්යාලයක් සඳහා ඒ ඉඩම ලබා ගැනීමට අපට ඕනැ කරනවා. ඒ අන්දමට රජයේ කාර්යාලයක් සඳහා ඒ ඉඩම ඉල්ලන විටත් එය දෙන්නේ නැහැ. ඉතින් උසාවි ගියා. නඩුව පැරදුණා. එහෙනම් ඒ වාගේ පනතක් වෙනස් කරන්නේ නැතුව මේ ආණ්ඩුවට වෙනත් මොකක්ද කරන්න තිබෙන්නෙ කියා මම අහන්න කැමතියි. අපේ ආණ්ඩුවේ ඉඩම් ප්‍රතිපත්තිය ගැන, ඉඩම් අමාත්‍යාංශයේ කටයුතු ගැන, එයින් කර ඇති සේවය ගැන, මට නියමිත කාලය අවසන් නිසා, කතා කරන්න මට අවකාශයක් නැහැ. කෙසේ වුණත් ජන ජීවිතයට විශාල වශයෙන් බලපාන කරුණක් හැටියට, රජයේ ඉඩම් බලහත්කාරයෙන් අනුන් සන්තක කරගෙන තිබීම අපට සලකන්න පුළුවනි. එම නිසා—මේ කටයුතු නීත්‍යානුකූලව කෙරෙන්න ඕනැ නිසා—ඉදිරිපත් කර ඇති මේ සංශෝධන පනතට මගේ සහයෝගය සියයට සියයකින්ම ලබා දෙනවා. අවසාන වශයෙන් මහනුවර දිස්ත්‍රික්කය වෙනුවෙන් මෙය ඉදිරිපත් කළ අපේ ඇමතිතුමාට අපේ සන්තෝෂය සහ ප්‍රසාදය පළ කරමින්, කාලය නොමැති නිසා, මම නිහඬ වෙනවා.

අ.භා.6.30

**ඩබ්. ජ. මු. ලොකුබණ්ඩාර මහතා (ඇමතිතුමා)**

*(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார—அமைச்சர்)*

(Mr. W. J. M. Lokubandara–Minister)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවස වචනයක් කතා නොකරම බැරි දවසක්. විශේෂයෙන්ම අප දිවුරුම් දී අත්සන් කළා, මේ රට කිසිම අකාරයකින් බෙදනවාට අප කැමැති නැත කියා. අපේ ලංකා භූමිය සම්බන්ධයෙන් එබඳු නීතිගත තත්ත්වයකට එළඹුණු දවසක රජයේ ඉඩම් සන්තකය ආපසු ගැනීමට කටයුතු කිරීමත් මා හිතන්නෙ අපේ දෛවයට සරදමක් වාගේ දෙයක්. පොළොව අපට අයිතිද, අපි පොළවට අයිතිද කියන කතන්දරෙයි මෙහිදී මතක් වෙන්නෙ. අපි සියලු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙනාම කවද හරි පොළොවට පස් වෙනවා. ඉතින්, පොළොවට පස් වන අපි පොළොව නිසාම මේ තරම් රණ්ඩු කරන්නෙ මොකටද කියා මට හිතෙනවා.

මේ සන්නකයයි අයිතියයි කියන වචන දෙකේ තිබෙන අර්ථය ගැන කල්පනා කළාම, අපට අමතක කරන්න බැහැ, සන්නකය නොවෙයි ඇත්ත වශයෙන්ම වටින්නේ අයිතිය කියන එක. එහෙම නම් මේ ලංකා පොළොවේ තිබෙන අයිතිය තිබෙන්නේ ඉඩම් අමාත්‍යාංශයට නම් මේකෙ හරියට පාලනයක් තිබෙන්නට ඕනැ. මේ අවුරුදු හය ගැන කල්පනා කළත් අපේ ආසන සම්බන්ධයෙන් සලකා බලන විට, අපට සතුටු වෙන්න බැරි තත්ත්වයක් පවතිනවා. මා කියන්නේ සන්නකය ආපසු ලබා ගන්නා ඉඩම් සම්බන්ධයෙනුයි. මේ ඉඩම් රජයට ලැබුණේ මුඩුබිම් පනත යටතේයි. මුඩුබිම් පනත නිසා අපේ වාගේ උඩරට පළාත්වල, විශේෂයෙන්ම මුඩුබිම් පනත යටතේ විශේෂයෙන්ම අපේ වාගේ උඩරට පළාත්වල, අපේ අත්තලා, මුත්තලාගේ ඉඩම් ටික තමයි, කොම්පැනිකාරයන්ට තේ අටවා ගන්න ගත්තේ. අද අපේ මව් බිමේ අපි ආගන්තුකයෝ වන තත්ත්වයකට පත් වී සිටිනවා. මේ ඉඩම් ටික තමයි රජයට ලැබුණේ. රජය ආපසු ගන්න යන්නේත් අපේ මුත්තලාගේ ඉඩකඩම්. මේවා අපේ ඉඩම්. අපට වෙන කොහේවත් වෙනත් ඉඩමක් ඇත්තේත් නැහැ.

අපේ ස්වදේශ කටයුතු භාර නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළ ප්‍රශ්නය මගේ ආසනයටත් බලපානවා. අපේ ද්‍රවිඩ වතුකම්කරු සහෝදරයන් පමණක් නොවෙයි, බොහෝ විට ලෙනතෝර් වාගේ වතුවල සිංහල පවුල් පවා වත්තේ තිබෙන රක්ෂිත ඉඩම් එළි කරනවා. මේ නිසා සිදු වී තිබෙන හානිය අසීමිතයි. කන්ද පාමුල ජීවත් වන අහිංසක ගොවීන්ට ලැබෙන වතුර ටික නැතිවීම නිසා සිදු වී ඇති හානිය අසීමිතයි. මේ ගැන නොයෙක් අවස්ථාවලදී කරුණු ඉදිරිපත් කළත් තවමත් ඉල්ලීම් ඉටු වී නැහැ. එම නිසා මේ අවස්ථාවේදී අපේ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා—එතුමා ප්‍රකාශ කළා, මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනවාය කියා—මේ කාරණයත් සටහන් කර ගන්නා ලෙස. එතුමා මිනිත්දේරු කඳවුරට ගිය වේලාවේදීත් මේ ගැන මම එතුමාට කිව්වා. හපුතලේ ආසනයේ අහිංසක ජනතාව තරම්, මේ විධියට ඉඩම් මංකොල්ලයට අහුවන වෙනත් පිරිසක් නැහැ. එක පැත්තකින් යුද හමුදාවට යට වෙලා ; අනික් පැත්තෙන් පයිනස් වගාවට යට කරලා ; තවත් පැත්තකින් රාජ්‍ය වැවිලි සංස්ථාවට යට වෙලා. හපුතලේ ජනතාව යුදහමුදාවට හැම නැතිත්ම හිරවී ඉන්න පිරිසක්. එම නිසා ඒ අහිංසක ජනතාවගේ අයිතිය තහවුරු කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

දැන් මේ වන විට, දියතලාව සමීපයෙන් ඉඩම් රාශියක්ම යුද හමුදාව අත්පත් කර ගන්නා තත්ත්වයක් ඇති වී තිබෙන බව සමහර විට අපේ ගරු ඇමතිතුමා දන්නේ නැතුව ඇති. එම නිසා, මේ අහිංසක ජනතාවට සහනයක් සලසන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදුල්ලේ විශේෂයෙන්ම හපුතලේ ආසනයේ ඉඩම් සම්බන්ධයෙන් බදුල්ලේ සංවර්ධන සභාවේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම තීන්දුවක් කර තිබෙනවා. පිල්ලෙගෙදර දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුවේ වාර්තාව අනුව විශේෂයෙන්ම හපුතලේ ආසනය ගැන විශේෂයක් කරන්නය කියා අපි ඉල්ලීමක් කරනවා.

පාර්ලිමේන්තුවේ දේශපාලකයන් ගැන බය වෙනවා නම් ඒ ගැන මා ලජ්ජා වෙනවා. තමුන්නාන්සේ දන්නවා දේශපාලකයාට තිබෙන්නේ දේශය පාලනය ·කිරීම බව. එසේ නම් දේශය පාලනය කරන නැතැත්නත් හැර වෙන කවුද අපි විශ්වාස කරන්නේ මේ වැඩේට? එම නිසා ගරු ඇමතිතුමා දුන් ප්‍රතිඥාව හරි. අපි මේ වැඩේ භාර දිය යුත්තේ දේශපාලකයන්ට තමයි. සැබවින්ම අපට වඩා වෙන කවුද දන්නෙ ඉඩම් දිය යුත්තෙ කාටද කියල? සමහර අය ඒ අයගේ ආණ්ඩු කාලයේ කළ විධියේ වැරදි මේ ආණ්ඩුවත් කරයි කියන හැඟීමෙන් කටයුතු කරනවා. අපියි ජනතාවට වගකියන්නේ. ඔබතුමායි බලපිටියේ ජනතාවට වගකියන්නේ. ඒ විධියට බැලුවාම දේශපාලකයාට නැතිව වෙන කාටද මේ බලය දෙන්නේ? දේශපාලකයා තමයි විශ්වාස කළ යුත්තේ. ඉඩම් ඇමතිතුමා මේ කාරණයේදී විශේෂයෙන්ම දේශපාලකයා විශ්වාස කරන්නට සිතීම මා අගය කරන අතර හපුතලේ ජනතාවගේ වගකීම මට ඉෂ්ට කරන්නට එතුමාගේ සහයෝගය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 6.35

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
*(திரு. றிச்சட் பத்திரன—அக்மீமன)*
**(Mr. Richard Pathirana–Akmeemana)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ඉඩම් (සන්නකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත ගැන විවාද කරන මේ අවස්ථාවේදී අක්මීමන ආසනයේ රජයේ ඉඩම් සම්බන්ධව වචන කීපයක් ප්‍රකාශ කරන්නට මා අදහස් කරනවා. අක්මීමන ආසනයේ ජනතාවගේ ලොකුම ඉල්ලීමක් තමයි 1962 කාලයේ සිටම බෙද දී තිබෙන ඉඩම්වලට ඔප්පු දෙන්නැයි කරන ඉල්ලීම. මේ වන තෙක් ඒ කිසිම ඉඩමකට කිසිම රජයක් මගින් ඔප්පු ලබා දී නැහැ.

විශේෂයෙන්ම ජනපද ඉඩම් රාශියක් අක්මීමන ආසනයේ තිබෙනවා. ගාල්ලේ දිසාපති කාර්යාලය මගින් සමහර ජනපද ඉඩම්වල පදිංචිකරුවන්ගේ ප්‍රදාන පත්‍ර ලබා දීම සඳහාය කියා රු. 100/- බැගින් මුදල් එකතු කරලත් තිබෙනවා. නමුත් මේ වන තෙක් ඒ අයටවත් ඒ ප්‍රදාන පත්‍ර ලබා දී නැහැ. අක්මීමන ආසනයේ දිවුලාන ජනපදයේ ඉඩම් බෙද දී තිබෙන්නේ 1962 කාලයේ සිටයි. 1980 මාර්තු මාසයේ 30 වැනිද ගාල්ලේ දිසාපති කාර්යාලය මගින් ඒ ජනපදවාසීන්ගෙන් රු. 100/- ය බැගින් එකතු කරගෙන තිබෙනවා ප්‍රදාන පත්‍ර ලබා දීම සඳහා. ඒ වාගේම අක්මීමන ආසනයේ තවත් ඉඩම් රාශියක පදිංචිකරුවන්ගෙන් ඒ විධියට මුදල් එකතු කරගෙන තිබෙනවා ප්‍රදාන පත්‍ර ලබා දෙන්නය කියල. නමුත් මේ වන තෙක් ඒ ප්‍රදාන පත්‍ර ලබා දී නැහැ.

අනුරාධපුරයේ දිසා ඇමතිතුමා කථා කරමින් පසුගිය රජයේ ඉඩම් බෙද දීමේ ප්‍රතිපත්තියත් ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රතිපත්තියත් දැඩි විවේචනයට ලක් කළා. නමුත් මා කියන්නට කැමතියි, මේ රජයේ ඉඩම් බෙද දීමේ ප්‍රතිපත්තිය යටතේත් අක්‍රමිකතා සිද්ධ වී තිබෙන බව. මට උදහරණයක් පෙන්වන්නට පුළුවනි. පසුගිය අතුරු මැතිවරණවලදී අක්මීමන ආසනයට ඉදිරිපත් වූ එක අපේක්ෂක මහත්මයෙක්—පියදාස මහත්මයා—සැම මැතිවරණ වේදිකාවකම කියාගෙන ගියේ මොකක්ද? "මම වගේ මුදලාලි කෙනෙකුටත් මේ ආණ්ඩුවෙන් අක්කරයක ඉඩමක්—හියාරේ ගම්මානයෙන් අක්කරයක ඉඩමක්—ලැබුණා" ය කිව්වා. ඒ මහත්මයා සෑහෙන තරම් ඉඩම් තිබෙන කෙනෙක්. නමුත් ඔහුටත් ඉඩමක් ලබා දී තිබෙනවා. ඒ විධියට මෙම රජය යටතේත් ඉඩම් බෙද දීමේදී අක්මීමන ආසනය තුළ අක්‍රමිකතා සිද්ධ වී තිබෙනවා.

ඉඩම් අත්පත් කර ගැනීම ගැන සඳහන් කළ අනුරාධපුරයේ දිසා ඇමතිතුමා පසුගිය රජය මගින් ඉතාම අසාධාරණ විධියට ඉඩම් අත්පත් කර ගත්තාය කිව්වා. මේ පාර්ලිමේන්තුවේදී බොහෝ විට අපට අසන්නට ලැබෙන්නේ පසුගිය රජය කාලයේ කළ වැරදි ගැනමයි. මේ රටේ ජනතාව 1977 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ අනෙකුත් පක්ෂ පරාජයට පත් කළේ සමහර විට ඒ වැරදි නිසා වෙන්න ඇති. එහෙම නම්—මේ රජයත් ඒ වැරදිම කරනවා නම්—මා සිතන විධියට තමුන්නාන්සේලාට අත් වෙන්නේත් 1977 දී අපට අත් වූ ඉරණමමයි.

රජයේ කැලෑ කැපීම සම්බන්ධව ගරු මන්ත්‍රීවරු රාශියක්ම අදහස් ප්‍රකාශ කළා. මා ගරු ඉඩම් ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නට කැමතියි, අක්මීමන ආසනයේ හියාරේ නැගෙනහිර ගම්මානයේ සිදු වූ අනවසර ලී කැපීමක් සම්බන්ධව. ඒ ගැන පරීක්ෂණ රාශියක් තිබෙනවා. 1980 ඔක්තෝබර් මාසයේ 3 වැනිද අක්මීමන හියාරේ නැගෙනහිර ගම්මානය අයත් ප්‍රදේශයේ එද වැඩ බැලූ ග්‍රාම සේවා නිලධාරීතුමාගේත් උප දිසාපතිතුමාගේත් හදිසි අවසරයක් මත රජයේ ඉඩමක ගස් කැපීමේ සිද්ධිය සම්බන්ධව පරීක්ෂණයක් තිබෙනවා. මා ගරු ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නේ ඒ සම්බන්ධව සාධාරණ පරීක්ෂණයක් පවත්වා කවුරුන් හෝ වේවා වැරදිකරුවන් වන අයට දඬුවම් ලබා දෙන ලෙසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජිවර්ධ පතිරණ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1977 ට පෙර රජයට පවරාගත් ඉඩම් කීපයක් අක්මීමන ආසනයේ තිබෙනවා. ඉඩම් කච්චේරි නොපවත්වා තිබෙන නිසා වහාම ඉඩම් නැති ජනතාව අතර පක්ෂ භේදයෙන් තොරව—ඉඩම් නැතිකමම ප්‍රමුඛ හේතුව හැටියට සලකා—ඒ ඉඩම් බෙද දෙන්නය කියා ගාල්ලේ දිසාපති කාර්යාලයට නියෝග කරන මෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා. ඒ ඉල්ලීම ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 6.40

**ගාමිණී දිසානායක මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා)**

*(திரு. காமினி திஸாநாயக்க—காணி, காணி அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி அமைச்சரும்,*

(Mr. Gamini Dissanayake–Minister of Lands & Land Development and Minister of Mahaweli Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සංශෝධන පනත සම්බන්ධව ආණ්ඩු පක්ෂයත් විරුද්ධ පක්ෂයත් අතර ඉතාම උණුසුම් විවාදයක් තිබුණත් මේ සංශෝධනය සම්බන්ධව නම් අවංකව කියන්න පුළුවනි එතරම් විවාදයක් අවශ්‍ය නැති බව. මම හිතන්නෙ හැම මන්ත්‍රීවරයෙක්ම පිළිගන්නා මේ සංශෝධනය ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව ගැන.

රටක් වශයෙන් බලන විට, දේශයෙක් කියා කියන්නේ ඒ රටේ භූමි ප්‍රමාණයයි. අපේ රටේ භූමි ප්‍රමාණය අපි ආරක්ෂා කරන්නට ඕනෑ. මේ ආණ්ඩුවේ පරමාර්ථය මේ රටේ ඉඩම් ප්‍රශ්නය කුමන ආකාරයකින් හෝ විසඳීමයි. ඉඩම් ප්‍රශ්නය විසඳන්නට නම් ඉඩම් කොල්ලය නවත්වන්නට ඕනෑ. ඉඩම්වල අනවසරයෙන් පදිංචිම නවත්වන්නට ඕනෑ. ප්‍රමාණයට වඩා අල්ලාගෙන ඉන්න උදවියගේ සංඛ්‍යාව අඩු කරන්න ඕනෑ. මේ ප්‍රශ්නයට අපි මුහුණ දුන්නෙ නැත්නම් කවදාවත් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. සමහර අවස්ථාවල සමහර ඉඩම්වල අවුරුදු විස්ස තිහ පදිංචි වී සිටිනවා. එහෙත් ඒ ඉඩම මැනලා නැහැ. ස්ථිර ගෙවල් නම් හදගෙන තිබෙනවා. සමහර විට ලියවිල්ලකින් කිසිම අයිතියක් නැහැ. මේ හැම ප්‍රශ්නයකටම අපි මුහුණ දී තිබෙනවා. නමුත් මේ ප්‍රශ්නය විසඳන්න වුවමනා කරන බලතල දිසාපතිවරුන්ට, අතිරේක දිසාපතිවරුන්ට සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට 1980 දී මේ පාර්ලිමේන්තුවෙ සම්මත කළ පනතින් ලැබුණා. නමුත් නීතිමය ප්‍රශ්නයක් නිසා මේ පනත අක්‍රිය වුණා ; අක්‍රියාත්මක වුණා. අද මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ පාර්ලිමේන්තුව පිළිගත් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමටයි. ඒක ක්‍රියාත්මක කරන්නෙ නැත්නම් මේ රටේ ඉඩම් ප්‍රශ්නය ගැන අපට කථා කරන්න ඉඩක් නැහැ.

කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) ගිය ආණ්ඩු කාලයේ අක්කර 2000 ක්ද කොහේද කොත්මලේ ආසනයේ බෙදුවාය කියා ප්‍රකාශ කළා. ඒ ප්‍රකාශය කළ නිසා මම කියන්න කැමතියි, ඒ බෙදුවෙ කොහොමද කියා. ජයසිංහ කියා උපදිසාපති කෙනෙක් හිටියා. කිසිම කෙනෙකුගෙන් අවසරයක් ගන්නෙ නැතිව ඉඩම් මනින්නෙ නැතිව කොහු ලණුවකින් මැනලා—තමා මතු දිනයක ඒ ආසනයට අපේක්ෂකයෙක් හැටියට අර කුමාර් රූපසිංහගේ අනුග්‍රහයෙන් ඉදිරිපත් වන්නට බලාපොරොත්තු වුණු නිසා—උපදිසාපතිවරයා හැටියට ඒ ඉඩම් බෙදන්නට ඔහු පටන් ගත්තා. ඒ වකවානුවේ කටයුතු කළ දේශපාලන අධිකාරීතුමා වූ ජේ. ඩී. වීරසේකර මැතිතුමා එයාගෙ ඒ ක්‍රියා කලාපයට විරුද්ධව එවකට සිටි ඉඩම් ඇමතිවරයාට පැමිණිලි කළ නිසා එයාව වහාම එතනින් ඉවත් කළා.

ඒ පදිංචි කළ උදවියට කිසිම අයිතියක් තිබුණේ නැහැ. ඒ අයිතිය ලැබුණේ මේ ආණ්ඩුව ආවාට පස්සෙ. අපි සමීක්ෂණයක් කර නිසි විධියට ඒ ඉඩම් බෙදූ නිසයි ඒ අයිතිය ලැබුණේ. එම නිසා ඒක ගිය ආණ්ඩුව කළ දක්ෂකමක් හැටියට ඉදිරිපත් කරන එකේ කරුණු විරහිත භාවයක් තිබෙන බව කොත්මලේ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න මම කැමතියි.

අනික මෙයයි. කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) සහ මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) ප්‍රකාශ කළා, නිලධාරීන්ට ලැබෙන බලතල සම්බන්ධව. මේ ආණ්ඩුව 1977 සිට අද දක්වා ප්‍රාදේශීය බලතල හුඟක් දුරට විමධ්‍යගත කළා. අපි එසේ එය විමධ්‍යගත කර විශේෂයෙන්ම දිසාපතිවරුන්ට බලතල පැවරුවේ නැත්නම් කොළඹින් නම් කවදවත් මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. ඒ ප්‍රතිපත්තිය තව දුරටත් ක්‍රියාත්මක කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. මේ පනතින් විශේෂයෙන් බලධාරියාට—රජයේ ඉඩම් කියන්නේ නමුත්නාත්සේලාගේ ඉඩම්. අපේ ඉඩම්. ඊළඟ පරම්පරාවට භාර දෙන්නට තිබෙන ඉඩම්. මේවා අපේ ඉඩම්. මේවා කැමති කෙනෙකුට කැමති විධියට පාවිච්චි කරන්නට ඉඩ දෙන්න බැහැ—ඒ බලතල පාවිච්චි කර රජයේ ඉඩම් රජයේ යම් යම් පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස පවරා ගන්නට බලාපොරොත්තු වෙනවා. එසේ කිරීමේදී යම් අසාධාරණයක් කුමන කරුණක් නිසා හෝ සිදු වෙනවා නම් ඒ කරුණු ඉදිරිපත් කළ යුත්තේ කවුද ? ඒ කරුණු ඉදිරිපත් කරන්නට සුදුසුකම තිබෙන එකම පුද්ගලයා ප්‍රදේශයේ මන්ත්‍රීවරයාය කියන එකයි, මම නම් පිළිගන්නේ. මහරගම ගරු මන්ත්‍රීතුමා කියනවා නම් තැගෙනහිර ප්‍රදේශයේ හා උතුරු ප්‍රදේශයේ මන්ත්‍රීවරු කියන යම් යම් කරුණු අනුව කටයුතු කරන්නට එපා කියා මම ප්‍රසිද්ධියේ කියන්න කැමතියි, මම එසේ කටයුතු කරන්නේ නැත කියා.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Order, please ! The Hon. Speaker will take the Chair now.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தி னின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

**ගාමිණී දිසානායක මහතා**

*(திரு. காமினி திஸாநாயக்க)*

(Mr. Gamini Dissanayake)

අනුරාධපුර—නැගෙනහිර ගරු මන්ත්‍රීතුමා (යසපාල හේරත් මහතා) ප්‍රකාශ කළා, බෝගහවැව වාරිමාර්ග ව්‍යාපාරය යටතේ පදිංචිව සිටි පවුල් 400 ක් පමණ එතැනින් ඉවත් කොට දුන් අනුරාධපුරේ නගරයට පැමිණ සිටිනවා කියා. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියා මට ආයාචනයක් කළා. මම ඒ ගරු මන්ත්‍රීතුමාට ආයාචනයක් කරන්න කැමතියි, ඒ පවුල් 400 නැවත වරක් බෝගහවැව පදිංචි කරවීමට කටයුතු කරන්නය කියා. ඒ සඳහා අපේ සම්පූර්ණ අනුග්‍රහය එතුමාට දෙනවා. කිසි බියක් නැතිව දෙවරක් කල්පනා නොකර ඒ කටයුත්ත කරන්න. මම කල්පනා කරනවා ඒ පවුල් 400 ට පූර්ණ අයිතිය තිබෙනවා කියා ඒ බෝගහවැව ව්‍යාපාරය යටතේ කෘෂිකාර්මික ජීවිතයක් ගත කරන්නට. වැවෙන් යම්කිසි අඩුපාඩුවක් තිබෙනවා නම් එයත් ප්‍රතිසංස්කරනය කර දෙන්නම්. [බාධාකිරීම්]

**යසපාල හේරත් මහතා**

*(திரு. யசபால ஹேரத்)*

(Mr. Yasapala Herath)

ගරු ඇමතිතුමාගේ සම්පූර්ණ සහයෝගය මට දෙන්න ඕනෑ. ඒ අය වවුනියාවට පිටත් කරන්නට.

**ගාමිණී දිසානායක මහතා**

*(திரு. காமினி திஸாநாயக்க)*

(Mr. Gamini Dissanayake)

ඒක දෙනවා. [බාධාකිරීම්]

**ජී. ඩී. මහින්දසෝම මහතා (වවුනියාව දිසා ඇමතිතුමා)**

*(திரு. ஜி. டி. மஹிந்தஸோம—வவுனியா மாவட்ட அமைச்சர்)*

(Mr. G. D. Mahindasoma–District Minister, Vavuniya)

මේ ප්‍රශ්නය වවුනියාව දිස්ත්‍රික්කය සම්බන්ධව නිසා මම මේ ගරු සභාවේදී ප්‍රකාශ කරන්න කැමතියි, වවුනියාව දිස්ත්‍රික්කයේ කිසිම සිංහල පවුලක් ඒ දිස්ත්‍රික්කය අත්හැර ඇවිත් නැත කියා. [බාධාකිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**යසපාල හේරත් මහතා**
*(திரு. யசபால ஹேரத்)*
(Mr. Yasapala Herath)

ගරු දිසා ඇමතිතුමාත් සමග මම පවුල් එක් දහස් ගණනක් අනුරාධපුර නගරයේ නබාගෙන කන්න දෙනවා. නමුත්නාත්සේ මොනවා කථා කරනවාද මම දන්නේ නැහැ. වවුනියාවෙන් ඇවිත් සිටිනවා ; බෝගහවැවෙන් ඇවිත් සිටිනවා; මූලතිව්වලින් ඇවිත් සිටිනවා. මගේ පඩියෙන් තුනෙන් එකක් ඒ ස්ථානයට දීලයි ආවේ. පාන් ගන්නට. එක් දහස් ගණනකට කන්නට දෙන්නේ මමයි ගරු දිසා ඇමතිතුමයි. *I do not know what they are doing at Vavuniya.*

**ජී. ඩී. මහින්දසෝම මහතා**
*(திரு. ஜீ. டி. மஹிந்தசோம)*
(Mr. G. D. Mahindasoma)

You are talking rubbish !

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Hon. Member for Anuradhapura, please follow the order of the Chair.

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

ගරු කථානායකතුමනි, හෙට අනුරාධපුර—නැගෙනහිර මන්ත්‍රීතුමාත් වවුනියාවේ දිසා ඇමතිතුමාත් මගේ කාර්යාලයට කැඳවා මම මේ ප්‍රශ්නය විසඳන්නම්.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) වැදගත් අදහසක් ඉදිරිපත් කළා. ඉඩම් නිරවුල් කිරීමේදී ඉඩම්වල පදිංචි වී සිටින තැනැත්තන්ගේ ආර්ථික තත්ත්වය පිළිබඳව සමීක්ෂණයක් පවත්වා පැවරිය යුතු ඉඩම් ප්‍රමාණය සහ අයිතිය මනින්නට ඕනැයයි එතුමා ප්‍රකාශ කළා. අපි ඒ පදිංචිකරුවන්ගේ ආර්ථික තත්ත්වය හා ඒ පිළිබඳ සමීක්ෂණය අඩි කෝදුවක් හැටියට ගෙන දිගටම කටයුතු කළ බව මම ප්‍රකාශ කරන්න කැමතියි. අනාගතයේදීත් ඒ අනුවම කටයුතු කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

මේ රටේ ඉඩම් අයිතිය රජයට පවරා ගන්නා ලද්දේ අධිරාජ්‍යවාදීන් මේ රටට පැමිණියාට පසුවයයි මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) ප්‍රකාශ කළා. මම හිතන හැටියට එතුමා එයින් එහාට ඉතිහාසය කියවන්නට ඕනැ. අධිරාජ්‍යවාදීන් අපේ රට අල්ලා ගන්නට පෙරත් හැම බිම් අඟලක්ම අයිති වුණේ රජයටයි. වැඩවසම් ක්‍රමය යටතේ ඉඩම් පාලනය කළේ රට පාලනය කළ රජ්ජුරුවෝමයි. රජයේ ඉඩම් කියන්නේ රජ්ජුරුවන්ට අයිති ඉඩම්. ඒ ඉඩම් සන්නස් පත්‍ර යටතේ, වැඩවසම් යුගයේ නොයෙකුත් වගකීම් අනුව නොයෙකුත් පවුල්වලට පවරා දුන්නා. ඒ ප්‍රතිපත්තිය අනුගමනය කර, කොළඹ සිට මහනුවර දක්වා යන පාර දෙපැත්තේ ඉඩම් හරක් හමෙන් මැනලා, අධිරාජ්‍ය වාදීන්ට කන් ඇද්ද පවුල්වලට බෙදා දුන්නා. ප්‍රතිපත්තියෙ වෙනසක් නැහැ. නමුත් ඉඩම් අයිතිය හැමදාම තිබුණේ රජයට. ඒ නිසා මෙය අධිරාජ්‍යවාදීන් ඇති කළ ප්‍රතිපත්තියක් නොවෙයි. අප රටේ අවුරුදු දෙදහස් පන්සියයක ඉතිහාසයේ සම්පූර්ණ වකවානුව තුළම ඉඩම් අයිතිය තිබුණේ රජයට. අදත් අපි ඒ ප්‍රතිපත්තිය අනුගමනය කරනවා.

මේ පනත ඉදිරිපත් කරන්නේ රජයේ ඉඩම් සම්බන්ධයෙන්. රජයේ ඉඩම් පාලනය කළ යුතු අන්දම සම්බන්ධයෙන් අප අතර විවාදයක් තිබිය යුතුයයි මම හිතන්නේ නැහැ. නොයෙකුත් ප්‍රශ්න ඇති වී තිබුණා. අද අප රටේ සමහර ප්‍රදේශවල ජනතාවට යන්න එන්න මගක් නැහැ. සමහර මිනිසුන්ට වැසිකිළියක් හදගන්න පවා බිම් අඟලක් නැහැයි එක් මන්ත්‍රීවරයෙක් කිව්වා. මේ ප්‍රශ්නයට අපි මුහුණ දෙන්නට ඕනැ. එක් එක් ප්‍රදේශවල, දිස්ත්‍රික්කවල ජනගහනය ඉඩම්වල අවශ්‍යතාම, බෙදන්න පුළුවන් ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් අපි සමීක්ෂණයක් කරන්න ඕනැ. එක් දිස්ත්‍රික්කයකට අදාළ වන තත්ත්වය වෙනත් දිස්ත්‍රික්කයකට අදාළ වන්නේ නැහැ.

1987 වන විට අප රටේ ජනතාවගේ පදිංචිය සඳහා ඉඩම් අක්කර තුන් ලක්ෂ පනස් දහක් පමණ බෙදන්නට පුළුවන් වාතාවරණයක් අපට ඇති වන බව මම ප්‍රකාශ කරන්නට කැමතියි. ලුණුගම්වෙහෙර ව්‍යාපාරය ලබන අවුරුද්දේ අවසාන වෙනවා. ඉඟිනිමිටිය ව්‍යාපාරයත් එහෙමයි. මේවා විශාල වාරිමාර්ග ක්‍රම. ඒ මාර්ගයෙන් පමණයි, ඉඩම් ප්‍රශ්නය විසඳන්නට පුළුවන්. යම් කිසි වත්තකින් අක්කර පහක් දහයක් අරගෙන මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please ! How long is the Hon. Minister going to take ?

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

I have finished.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

We have to finish this before the adjournment.

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

I have finished.

ඒ නිසා මම ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය පතමින් මේ සංශෝධනය පනත් කෙටුම්පත ගරු මන්ත්‍රීවරුන්ගේ කල්පනාවට භාජන කරනවා.

*"පනත් කෙටුම්පත දෙවනවර කියවිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදී.*

*කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.*

*"சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டது.*

*குரல்களின்படி "ஆம்" மேலோங்கிற்றெனச் சபாநாயகர் அவர்களால் பிரகடனப்படுத்தப்பட்டது.*

*Question, "That the Bill be read a Second time," put.*

MR. SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

Divide !

*පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ— පක්ෂව 144; විරුද්ධව නැත; යනුවෙන්—බෙදුණේය.*

*பாராளுமன்றம், 43 ஆம் நிலைக் கட்டளையின் கீழ் பிரிந்தது : சார்பாக 144 ; எதிராக இல்லை.*

*The Parliament divided under Standing Order No. 43 : Ayes 144 ; Noes Nil.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*

*இதன்படி சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Bill accordingly read a Second time.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී දිසානායක මහතා]

**මතු පළවන යෝජනාව සභාසම්මත විය:**

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"–[ගාමිණී දිසානායක මහතා]

*தீர்மானிக்கப்பட்டது :*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." [திரு. காமினி திஸாநாயக்க]*

*Resolved :*

"That the Bill be referred to a Committee of the whole Parliament."–[*Mr. Gamini Dissanayake*]

**කාරක සභාවෙහිදී සලකා බලන ලදී.**

*[කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் ஆராயப்பட்டது.*

*சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Considered in Committee.*

[MR. SPEAKER *in the Chair.*]

*1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*1 ஆம் வாசகத்திலிருந்து 4 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

Clauses 1 to 4 ordered to stand part of the Bill.

**5 වන වගන්තිය–(ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම)**

***வாசகம் 5.**—(மூலச்சட்டம் 18 ஆம் பிரிவுக்குத் திருத்தம்)*

CLAUSE 5.–(*Amendment of Section 18 of the principal enactment.*)

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

I want to raise a matter, but it is not anything very serious. Under Clause 5 there are two or three authorities mentioned.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Are you moving any amendment ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

No, Sir. I am asking for some clarification.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Carry on.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

There is the Chairman of the National Housing Development Authority, which is being controlled by the Hon. Prime Minister, the Ports Authority which is being controlled by the Hon. Minister of Trade and Shipping. I believe when some power is being given the entire power has to be obviously exercised through the Minister of Lands and Land Development. What type of control are you going to have pertaining to all these lands that belong to the State ? I raise this matter because from yesterday I believe there has been the creation of a new type of State lands consequent on the latest events that took place. I want to ask this. Who is going to be the authority, who is going to give directives ? Is it the Minister of Lands or the appropriate Minister ?

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

A directive in relation to what ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

To implement this Bill.

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

This Bill will be implemented by the Ministry of Lands and Land Development.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

You have passed this with a 2/3rds majority–

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

I want to inform the hon. Member for Attanagalla–

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please ! Does the House have any objections to continuing for a few minutes to conclude this Bill ?

**මන්ත්‍රීවරු**
*(அங்கத்தினர்)*
(Members)

No.

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

The hon. Member for has been the Deputy Minister of Defence–the Acting Minister of Defence also on some occasions. He knows that the statutory Minister to implement the land policies of the Government is the Minister of Lands, but that Minister always acts at the request of other Ministers who may want land for public purposes.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**5 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

5 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.

*Clause 5 ordered to stand part of the Bill.*

**6 වන සහ 7 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම් පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.**

6 ஆம் 7 ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தமின்றி அறிகை செய்யப்பட்டது.

*Clauses 6 and 7 ordered to stand part of the Bill.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendment.*

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

I move,

"That the Bill be now read the Third time."

**ප්‍රශ්නය විමසන ලදී.**

**කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

வினா விடுக்கப்பெற்றது.

குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.

*Question put.*

MR. SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

**ගාමිණී දිසානායක මහතා**
*(திரு. காமினி திஸாநாயக்க)*
(Mr. Gamini Dissanayake)

Divide!

**පාර්ලිමේන්තුව මතු පළ වන අන්දමට—පක්ෂව 144; විරුද්ධව නැත: යනුවෙන්—බෙදුණේය.**

*பாராளுமன்றம் பிரிந்தது : சார்பாக 144 ; எதிராக இல்லை.*

*The Parliament divided : Ayes 144 ; Noes Nil.*

**පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.**

*அதன்படி, சட்டமூலம் மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.*

*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திப்போடல்
## ADJOURNMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

I move.

"That the Parliament do now adjourn."

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**ආර්. පී. විජේසිරි මහතා** (හාරිස්පත්තුව දෙවන)
*(திரு. ஆர். பீ. விஜேசிறி—ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர்)*
(Mr. R. P. Wijesiri–Second Harispattuwa)

In relation to the offences against the Public Property Act, I wish to inform hon. Members that already those who misappropriated funds of co-operative societies have been brought within the ambit of that Act. I repeat, in relation to the offences against the Public Property Act, I wish to inform hon. Members that already those who misappropriated funds of co-operative societies have been brought within the impact of that Act. By my amendments today, this would be strengthened further, so that co-operative employees who misappropriate even property or goods, not only cash belonging to the co-operatives will be brought under the provisions of that Act.

Hon. Members are already aware that bail is not normally granted to any person who is charged under this Act. But, in actual fact, many offenders have been enlarged on bail. So it would be doubly necessary to link co-operative offences more directly and closely with the Civil and Criminal Procedure Codes.

Sir, in summing up, I wish to reiterate the basis on which entire range of amendments has been formulated. Firstly, it is to the crdit of our Government since 1977 to re-establish the democratic basis of the co-operative sector. The co-operatives are essentially an organisation of the people where the ordinary people of our country have a stake in their proper working. Most of our farmers have their money in the co-operatives and they obtain loans and material imputs for their cultivation through the co-operatives. The rural banks have accumulated deposits made by the ordinary people of the country, and these funds are handled by the People's Bank which was originally set up in order to support the co-operatives. The co-operatives themselves naturally obtain most of their loans from the People's Bank in which both the people and the Government have a major stake. In operating the Food Stamps Scheme large funds belonging to the Food Commissioner are handled by the co-operatives and a good proportion of these funds are regularly tied up with the co-operatives.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී ජයසූරිය මහතා]

For these reasons, while it is ideologically necessary for us to preserve the democratic structure of the co-operatives, we have an obligation by the people as co-operators to protect and safeguard their funds and interests, and this we do through the machinery of the Registrar of Co-operative Societies. It is for these reasons that most of the amendments to the Co-operative Societies' Law No. 5 of 1972 are focused on Sections 46 and 47, which give the Commissioner and the Registrar the power and authority to examine the assets and liabilities of the societies, investigate the malpractices and frauds and take suitable consequential action against offenders both elected and officilas. Accordingly I have attempted to maintain the balance between the principles of co-operative democracy and the need to supervise the working of these co-opeative societies through amendments to the Act which, with your permission, Sir, I will try to detail as briefly as possible.

The main changes sought by amendments loan facilities for non-members. Section 39(1) is repealed and a new sub-section introduced to enable goods to be supplied on credit to any registered trader functioning as an agent of the society. This has been done to provide the same credit facilities available to co-operative outlets or to the authorised distributors as well to those who handle Food Stamps on behalf of the Commissioner. This change can encourage more authorized distributors to join the scheme to distribute foodstuff where necessary.

Preparation of account and budget, audit and ivestigation : This affects a change in the title of Chapter VIII, Audit, Inquiry, Inspection or Investigations, enlarging it to include the accouts, budget, audit, etc. Also included under this chapter are two new sections 43(*a*) and 43(*b*) making mandatory for co-operatives to prepare annual accounts and an annual budget.

At present books of accounts are referred to at rule 37, and neither the main Act nor the rules framed under section 61 of the Main Act provide for the preparation of an annual budget. These are necessary both for the purpose of financial control and the planning of business. Every assistance will be given by the Department to those people who need assistance and the Department will ensure that they will conform to these rules.

Custody of books and documents and inquiries and investigations : One, at section 44 (4), the amendments involve a minor change whereby the Registrar of Co-operatives is enabled to have access to and to inspect all accounts, documents and securities maintained by or in the possession of employees or members of a co-operative society. This provides for examination of any documents directly in the possession of employees or members. Section 44 (6) (*a*) : Here the reference is to recoveries and surcharges against officers and employees who spend monies contrary to the Act, rules or by-laws and the Society's working rules. These latter are enlarged to cover rules made under any othr law and financial procedure approved by the Registrar or any general directions issued by the Registrar or the Co-operative Employees Commission.

Paragraph 44 (6) (*c*) provides for in the existing law appeals to the Minister against surcharges. This sub-section has been repealed and in its place the provision at 44 (6) (*b*) to recover such monies through a Magistrate's Court under section 66 (2) has been brought up as 44 (6) (*c*). Thereafter sub-section 44 (*d*) has been repealed.

Inquiries and Investigations Proper–Section 46 (*d*) : The change gives authority to the Registrar or his agent to take into custody accounts or documents even where he has reason to believe that there has been a fraud or irregularity in the course of any inquiry. If he has the slightest reason to believe that he can start action on 46 (d).

Section 47 (8) is an entirely new sub-section that has been introduced in order to enable the Registrar or his agent to perform the following duties :

(*a*) Summon both past and present officials of the Society and even any other person who might be able to provide material evidence.

(*b*) Similarly, requires the production of any books or documents by the present and past officials and members and also other persons in possession of such documents.

(*c*) Summon a general meeting of the members if and when necessary.

(*d*) Take into custody books and documents when he has reason to believe that there is fraud or irregularity etc.

Consequential action after inquiries and investigations : These consequential changes are contained in Chapter 9. The heading of this chapter has been widened to include suspension and removal of officers of a registered society and dissolution of the Committee.

Section 48 (1) is repealed and replaced with a minor change as follows : Instead of "After an inquiry under section 46 or inspection made on an application of a creditor under 47" the new sub-section will read as, "After an inquiry under section 47 or an inspection or investigation under 47".

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Section 48 (4) (*b*) is repealed and a new sub-section has been introduced so as to provide the Commissioner or the Registrar with mandatory powers, rights etc., both of the Committee as well as the powers of the general body, to the exclusion of such general body.

4. New sub-section 48 (10) has been added in order to provide the Registrar or the Commissioner, if found necessary after inquiry or investigations, with the power to suspend the Committee of a Co-operative for six months and appoint an interim board to manage its affairs. If he finds this, he has the power to suspend the Committee of the Co-operative Society for six months and appoint an interim board to manage its affairs. This change also requires such an inquiry or investigation should be completed and a decision finalised within such six months of such suspension. That is now law.

New section 48 (*a*) (1) has been introduced to give the Registrar the authority to suspend or interdict any officer or employee where after inquiry or investigation such officer or employee of a registered society is not performing his duties in the proper manner or is unsatisfactory or otherwise unable to discharge his duties efficiently. By this new section the Registrar can suspend any Committee, Chairman, Vice Chairman etc., or interdict an officer pending a full inquiry, but after calling for explanation and objections.

In the case of an employee a more complicated procedure has to be followed in accordance with the CEC regulations. Further, the Committee or its Chairman may not be in a mood to act against an employee against whom a case has been made out by the Registrar. There had been several cases where managers of petrol filling stations had misappropriated large amounts of money, but there was no way of taking prompt disciplinary action against them. Therefore, this new provision meets most of these difficulties. This authority has been granted notwithstanding anything contrary to this Act or in the Co-operative Employee's Commission Act No. 12 of 1972. By sub-section 12 where any such officer or employee is removed under sub-section 1 above, and where such an order for removal has been affirmed by the Co-operative Employees' Commission or no appeal against such order has been preferred within 30 days, any other officer or employee may be elected or appointed. If the person who has been dismissed or interdicted does not appeal within 30 days–he has a right to appeal within 30 days–then a person could be appointed. That is for an employee–these small employees.

At present the Registrar or CCD can act only in terms of Rule 51 (1) where he has to follow certain procedures like issuing a charge sheet, giving a chance to be heard, etc, before removal of a Committee Member, Chairman or Vice-Chairman, or an employee of this society. By this new section the Registrar can directly deal with the officers and employees, suspend and interdict them respectively.

Dissolution of a Co-operative Society: Section 49 (1) has been repealed and a new sub-section introduced with a minor amendment as follows: instead of " an inspection made on the application of a creditor under section 47 ", the following has been substituted. In section 59 (3) the last four lines have been changed so that substantively " the provisions of section 226 and 297 of the Civil Procedure Code shall *mutatis mutandis* apply to and in relation to such seizure and sale ". This has been done to update the correct reference to the law. It is just a consequential amendment. In section 59 (4) the last six lines have been deleted from " under provisions of section 312 except paragraph (*a*) and (*c*) of sub-section 1 of that section of the Criminal Procedure Code had been changed and the provisions of section 312 except paragraph (*a*) and (*c*) of sub-section 1 of that section of the Criminal Procedure Code occurring in that sub-section " and replace it with the words and figures " and the provisions of sub-section 291 except paragraphs (*a*) and (*d*) of sub-section 1 of that section of the Code of Criminal Procedure Act no. 16 of 1979 ". This again has been done in order to bring offences under correct legal provisions and act.

Rules made by the Minister: A new sub-section 61 (2) has been added and by this new sub-section the Minister is empowered to prescribe the disqualifications for a member of a co-operative Society on being elected to the Committee of Management as the present rule 21 of the rules framed by the Minister under section 61 will enable the Minister to specify the disqualifications. Rule 21 has certain disqualifications and the provisions of these have been regularized in the main Act from which these conditions flow. That is a gate to regularize. Miscellaneous powers of the Minister and the Registrar: The words " employees of the society " in lines 9 and 10 of Section 61 has been changed to " employee of the Society who has utilized funds of the society Contrary to the provisions of this Law or any other Law or Rules or Regulations made thereunder by the By-laws and Working Rules of the society or financial Procedures approved by the Registrar or any general directions issued by the Registrar and Co-operative Employees Commission. "

By this amendment, employees who have committed financial mismanagement under this law or any other law or rules of financial procedures approved or directions given by the Registrar and the CEC, have been brought within the purview of Section 66 and especially the legal action such employees can be subjected to under Section 66 (2).

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිනී ජයසූරිය මහතා]

There are two amendments to Section 66 as follows : (*a*) By the substitution for the words " the society " on an application to the magistrate of the words " the Registrar ". This has been done in order to allow the Registrar himself to take follow-up action after he makes the order in terms of Section 66 (1). At present the society may or may not comply with the Registrar's order if the committee of the society and the employees concerned have been acting in collusion. Also, the Registrar or his nominee like an Assistant Registrar in charge of the district can apply to the magistrate of the area. (*b*) The same change as done in the case of Section 59 (4) has been effected here in order to give reference to the correct provision and Law, namely, Section 291 of the Code of Criminal Procedure Act, No. 15 of 1979.

A new Section 66A is proposed in the printed Co-operative Societies (Amendment) Bill. This gives power to the Registrar prospectively to nominate such number of persons to be members of the committee of such registered society as are in his opinion necessary and expedient for such purpose.

Then we have the proviso ; at the end of the new Section add after the words " for such purpose " the words " provided that the number of such nominated members shall be less than one-half of the total number of members of such Committee ". This amendment enables a few people to be nominated to societies where managment problems have been arising and there is danger to funds and investments, especially funds advanced by government or state banks or corporations, because, as you know, there are certain co-operatives where, with all the training or whatever we may give them, and so on and so forth, the elected members–sometimes not one of them–are persons who could do this. So in those rare and few cases where government funds have been given, it is our duty to look after those funds also. It is only in such cases where the Registrar feels it is very necessary that he can take this action, but at the same time to ensure the democratic process the nominated members shall be less than one-half of the total number of members of such Committees. That is different from what took place in 1976, I believe, under Mr. Ilangaratne.

Sections 67 has been replaced by a new section where the main changes are as follows :

Persons who have handled or had dominion over both money and goods have been brought in. Also, the amendment enables recovery of the value of such goods or property in addition to monies that have been shown in the books.

Secondly, the Committee of three Ministers and the Attorney-General appointed by the Cabinet on 1st August, 1979 considered that the present sub-section 67 should provide for a summary trial before a magistrate and imposition of both a term of imprisonment and a fine even though a magistrate may not have that jurisdiction.

New Section 67 (A) has been added to enable Co-operative Department officials of investigate, inquire and conduct prosecution which fall within Chapter XVII of the code of Criminal Procedure Act No. 15 of 1979. This will help to reduce the inordinate delays when the police have to take action in the courts. This also brings the law in line with other Acts, like price control or public health legislation, which enable departmental officials to prosecute.

Section 70 (3) has been repealed and a new section subsitituted which keeps alive all appointments and orders made, notifications and notices issued, suits and other proceedings and all disputes that have arisen under the repealed Co-operative Societies Ordinance. To this has been added awards made by arbitrators, and decisions mabe by the Registrar.

Section 72 (2) has been repealed and a new section has been substituted so that the earlier words maximum punishment of a fine up to Rs. 500 has been changed to simple or rigorous imprisonment for a period not exceeding 2 years or to a fine not exceeding Rs. 12,000 or to both such punishments even if such punishment exceeds the Magistrate's jurisdiction.

Here, the law has made offences under Section 72 (1) for wilful disobedience, concealing information etc., subject to more deterrent punishment.

New Section 72(A) has been added in order to grant immunity to the Registrar, his Deputies, his Assistants and other authorized persons, who have to act under Sections 44, 46, 47, 49, 52, 66 and 67 of this Law.

ගරු කථානායකතුමනි, මෙම සංශෝධනය ගෙන ඒමේ අදහස තමුන්නාන්සේට දත් පෙනී යන්නට ඇති. සමුපකාර ව්‍යාපාරයේ අඩුපාඩුකම් තිබෙනවා. ඒවායේ අයුතු වැඩ, වංචා සහ හොරකම් රාශියක්ම සිද්ධ වෙනවා. කෙසේ නමුත් මේ ව්‍යාපාරය තුළින් අත්‍යවශ්‍ය සේවාවක් ඉටු වෙනවා. එම නිසා අපේ හැඟීමේ හැටියට මෙම සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කරන්නට අපට යුතුකමක් තිබෙනවා. එසේ ආරක්ෂා කරන අතරම ඒ අඩුපාඩුකම්, වංචා සහ වැරදි ආදී දේවල් හැකි තරම් දුරට නැති කර, පාලනය වැඩි දියුණු කිරීම සඳහා රජයෙන් දෙන්නට පුළුවන් හැම උපකාරයක්ම දෙන්නට රජය කටයුතු කරනවා. සමුපකාර ව්‍යාපාරයේ ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපය අනුව, එම සමිතිවල සාමාජිකයන්ට තමන් කැමති පුද්ගලයන් තෝරා ගෙන කටයුතු කරගෙන යාමේ ප්‍රතිපත්තිය පිළිගන්නා අතර, ඒ ආකාරයට වැඩ කටයුතු කරගෙන යන ගමන්, වැරදි කරන්නන්ට විරුද්ධව ඉක්මනින් ක්‍රියා කිරීමටත් අවශ්‍ය පියවර ගන්නවා. මෙතෙක් අඩුපාඩුවක් හැටියට පෙනුනේ වැරදි කරන්නන්ට විරුද්ධව යම් පියවරක් ගැනීමට–ඉවත් කිරීමට හෝ වෙනත් දඬුවමක් කිරීමට–අවුරුදු ගණනාවක් ගත වීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එසේ ප්‍රමාද වීම නිසා චූදිතයෝ බොහෝ විට තව දුරටත් වැරදි කරනවා ; කළ වැරදි හංගාගන්නට උත්සාහ කරනවා. මෙම සංශෝධනයෙන් එම අඩුපාඩුකම් බොහෝ දුරට මගහැරී යනවා ඇත කියා මම විශ්වාස කරනවා.

මම කියන්නෙ නැහැ, හැම දෙයක්ම සම්පූර්ණයෙන්ම හරියාවිය කියා. නමුත් මේ සංශෝධන සම්මත කරගෙන අපට ක්‍රියාත්මක කරන්නට පුළුවන් වුණොත්, සියයට සියයකින්ම බැරි වුණත්—සියයට සියයකින්ම පුළුවන් නම් බොහොම හොඳයි—සෑහෙන තරම් හුඟක් දුරටවත් මහජන මුදල් වංචා වළක්වන්නට පුළුවන් වෙනවායයි මගේ විශ්වාසයක් තිබෙනවා. මේ වැඩ කටයුතු කරගෙන යාමේදී කලක් යන කොට තවත් අඩුපාඩුකම් අපට පෙනී ගියොත් තවත් අපි සංශෝධන ගෙනෙනවා.

මේ ඔක්කොම ඉවත් කර, අලුතෙන්ම පනතක් ගෙන ඒම අවශ්‍ය යයි අපට පෙනී ගියොත් අපි ඒකත් කරනවා. කොහොම නමුත් මේක කල් දමන්නට බැහැ. මේ අඩුපාඩුකම් සියල්ලක්ම හරිගස්සා ගන්නට පුළුවන් විධියට අලුතෙන්ම පනතක් ගෙන එන්නට පුළුවන් වුනා නම් වඩාත් හොඳයි. නමුත් මේ පනත 1978 සිට ක්‍රියාත්මක වන පනතක්ය කියා මම හිතනවා. මේවා තවත් කල් දමන්නට බැහැ. දැන්ම ක්‍රියාත්මක කළ තරමට අඩුපාඩුකම් හරිගස්සා ගන්න පුළුවන් වෙයි. ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ උපදෙස් හා ආධාර ඇතුව, මීට වඩා හොඳ වැඩ පිළිවෙළක් පසු කාලයකදී සකස් කරන්නට පුළුවන් වෙනවාය කියා මම කල්පනා කරනවා. මේ අවස්ථාවේදී නුමුන්නාන්සේලාගේ සම්පූර්ණ සහයෝගය මේ පනතට දෙන්නටය කියා මම ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Quetion proposed.*

අ. භා. 4.11

**දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)**
*(திரு. தினேஷ் குணவர்த்தன—மஹறகம)*
(Mr. Dinesh Gunawardene–Maharagama)

ගරු කථානායකතුමනි, සමුපකාර සමිති (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් ගරු ඇමතිතුමා ප්‍රකාශ කළ අදහස් බොහොමයක් අපි අගය කරනවා. මේ සංශෝධනය ගෙනැවිත් සමුපකාර ව්‍යාපාරය නිවැරදි මගට යොමු කිරීමේ අරමුණක් තිබෙනවාය කියා ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. එසේ වෙන්නට පුළුවනි. නමුත් මේ අවස්ථාවේදී මේ සංශෝධන කිහිපය ගැන සහ අපේ සමුපකාර ව්‍යාපාරය නිවැරදි මගට යොමු කිරීම ගැන අපි දරණ අදහස්ද ගරු ඇමතිතුමාට ඉදිරිපත් කිරීමටයි මා අදහස් කරන්නේ.

මේ ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු සමුපකාර ව්‍යාපාරය ප්‍රතිසංවිධානය කිරීම සඳහා ගරු දේවනායගම් ඇමතිතුමාගේ නායකත්වයෙන් යුත් කමිටුවක් පත් කළා. මේ සංශෝධන ගෙනෙන්නේ ඒ කමිටුවේ වාර්තාවේ යෝජනා කීපයක් මතය කියා ගරු ඇමතිතුමා කිව්වා. දැන් මොහොතකට කලින් පාර්ලිමේන්තුවේ පුස්තකාලයෙන් අපි ඉල්ලා සිටියා, දේවනායගම් වාර්තාවේ පිටපතක්. එය මෙතෙක් අපට ලැබෙන්නට සලස්වා නැහැ. අපි ඒ වාර්තාව දැකලවත් නැහැ. කෙසේ වෙතත්, ඒ වාර්තාවේ තිබෙන්නේ මොනවාද කියා ගරු ඇමතිතුමා කියන දේ අපි පිළිගන්නවා. නමුත් ගරු මන්ත්‍රීවරුන්ට ඒ වාර්තාව කියවන්නට අවස්ථාවක් ලැබුණා නම් ඒ වාර්තාවේ තවත් හොඳ දේවල් තිබෙනවා නම් ඒවා ගැනත් ඒ වාර්තාවට අඩංගු කර ඇති අනෙකුත් නිර්දේශ ගැනත් මේ ගරු සභාවේදී අදහස් ඉදිරිපත් කරන්නට තිබුණා.

දේවනායගම් ඇමතිතුමා ඉතා සාර්ථක වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවාය කියන එක සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ සියලු දෙනා අතර සාකච්ඡා වන දෙයක්. එහෙත් ජනතාව තවම ඒ වාර්තාව දැකලවත් නැහැ. එම නිසා ප්‍රථමයෙන්ම මා ඉල්ලා සිටිනවා සමුපකාර ව්‍යාපාරය ගැන ඉදිරි ක්‍රියා මාර්ගය ගැනීම සඳහා ජනතාවට ඒ වාර්තාව ඉදිරිපත් කරන ලෙස.

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කිව්වා වාගේ තාවකාලික සාමාජිකයන්ගෙන් සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කරන්නට හෝ ඉදිරියට ගෙන යන්නට හෝ බැහැ. අද අපේ රටේ සමුපකාර ව්‍යාපාරය තුළ වැඩියෙන් ඉන්නේ සල්ලි ගෙවා බඳවන ලද සාමාජිකයන් තමයි. ඒ වරද නිවැරදි කිරීමට පියවරක් නොගත්තොත් මේ ගෙනැවිත් තිබෙන සංශෝධන නොවෙයි තවත් කොපමණ සංශෝධන ගෙනාවත් බලාපොරොත්තු වන ඉලක්කයන් කරා ගමන් කරන්නට බැහැ.

අපේ ආසනවල සමුපකාර සමිතිවල සාමාජිකයන්ය කියන තිස් හතළිස් දහස් ගණන් ඉන්නවා. ඒ තිස් හතළිස් දහස් ගණනක් සාමාජිකයන් කවදාවත් රැස්වෙන්නේ නැහැ. ඒ සාමාජිකයන් ඡන්ද පොළකට ඇවිත් ඡන්දය දී ප්‍රාදේශීය කාරක සභා පත් කරනවා. ඊට පසු මහා සභාවක් පත් වෙනවා. අද එපමණයි කෙරෙන්නේ. සාමාජිකයන් සංඛ්‍යාවක් කාරක සභාවට තෝරාගැනීම සඳහා ඡන්දය දීමේ කටයුත්තකට පමණක් අද මුළු සමුපකාර ව්‍යාපාරයම සීමා වී තිබෙනවා. ගරු ඇමතිතුමා අවංකවම සමුපකාර ව්‍යාපාරය ගොඩනැඟීමේ උත්සාහයක යෙදී ඉන්නවාය කියනවා නම් මෙන්න මේ රුපියලේ සාමාජිකයන් ගැන යළිත් සලකා බලන්නට කාලය දැන් පැමිණ තිබෙන බව මා මතක් කරන්නට කැමතියි. [බාධා කිරීමක්] මාවතැල්ලේ ගරු මන්ත්‍රීතුමා කියනවා ඉස්සර සාමාජිකත්වය සඳහා ගෙවිය යුතු වූ කොටස් මුදල රු. 10 ක්ය කියල. රුපියල් පණහෙ සාමාජිකයොත් හිටියා. සමහර තැන්වල ඒ සල්ලිවලට වුණේ මොකක්ද කියලවත් දන්නෙ නැහැ. ඒ නිසා පසුගිය ආණ්ඩුවලින් කරන ලද සංශෝධනවල වැරදි තිබෙනවා නම් ඒවා නිවැරදි කරන්නට දැන් කාලය පැමිණ තිබෙනවා.

ගරු කථානායකතුමනි, සමුපකාර ව්‍යාපාරයට හිතවත්, සමුපකාර දර්ශනය පිළිගන්නා සෑහෙන පිරිසක් මේ රටේ ඉන්නවා. අන්න ඒ අයට තමයි අද සමුපකාරවල තැන දිය යුතුව තිබෙන්නේ. එහෙම නැතිව දේශපාලනඥයන්ට ඕනෑ විධියට හෝ සමුපකාර ව්‍යාපාරයට විරුද්ධ ව්‍යාපාරිකයන්ට ඕනෑ විධියට හෝ වැඩ කිරීමට මේක භාර දීමෙන් සමුපකාර ව්‍යාපාරය නඟා සිටුවන්නට බැහැ. ප්‍රාදේශීය ශාඛා ගණනාවක් තමන්ට වුවමනා විධියට හැසිරවීම සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයන් සල්ලි වියදම් කරල සිය ගණනින් බඳවා ගන්නා සාමාජිකයන්ගෙන් යුත් සමුපකාර ව්‍යාපාරයක්, සමුපකාර ව්‍යාපාරයක් නොවේය කියන එක ආසියාතික කලාපයේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳ ජාත්‍යන්තර සභාරාවේත් පළ කර තිබෙනවා.

අද මේ රටේ සමුපකාර ව්‍යාපාරය 'පිළි පැනල' ඉවරයි. සමුපකාර ව්‍යාපාරය නැවත 'පිල්ලට ගෙන එන්නට' ගරු ඇමතිතුමා උත්සාහයක් දරණවා නම් එය මේ රටේ සමුපකාර ව්‍යාපාරය තුළින් ජීවත් වන තමන්ගේ නැති බැරිකමින් ඔළුව උස්සන්නට උත්සාහ කරන ලක්ෂ සංඛ්‍යාත පිරිසකට දෙන ශක්තියක්.

ඒ වාගේම එය 75,000 කට වැඩි සමුපකාර සේවකයන්ට දෙන සහතිකයක් වන්නේ මේ ව්‍යාපාරය ආරක්ෂා කරගත්තොත් පමණයි. එය, සේවකයන්ට රක්ෂා නැති වී යන විට ආණ්ඩුවට ඇති වන අමාරුවෙනුත්, දහස් ගණනින් සේවකයන් දොට්ටදන විට ආණ්ඩුවට ඇතිවන අමාරුවෙනුත් බේරාගන්න පුළුවන් පිළියමක් වෙනවා. එය කළ හැකි වන්නේ සමුපකාර ව්‍යාපාරය නිවැරදි මගට ගත්තොත් පමණයි. ඒ නිසා ඇමතිතුමා කිව්වා වාගේ මමත් කියන්න ඕනෑ අතීතයේ සමුපකාර ව්‍යාපාරය විෂයෙහි ඉටු වී ඇති කාර්ය භාරයට වඩා කාර්ය භාරයක් වර්තමානය වනවිට ඉටු කරන්න පුළුවන් ආකාරයට එය ඉදිරියට එන්න තිබුණු බව.

බටහිර ලෝකයේ ධනපති රටවල් පවා—ජපානය, ප්‍රංශය, ජර්මනිය, ඇමෙරිකා එක්සත් ජනපදය ආදී රටවල් පවා—සමුපකාර ව්‍යාපාරය ආර්ථිකයේ, යම්කිසි ප්‍රමාණයක බලවේගයක් හැටියට සැලකුවා. අපේ රටේ ආර්ථිකයේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ, ජාතික ආදායම පිළිබඳ ප්‍රශ්නයේදී අපේ සමුපකාර ව්‍යාපාරය කොපමණ බලපෑමක් කරනවාද කියන ප්‍රශ්නය ගැන අපි හිතන්න ඕනෑ. එයට මේ රටේ ඒ තරම් දුරට වැඩෙන්නට අවකාශයක් ලැබුණේ නැහැ. ස්විඩනය වාගේ රටවල පවා—ඇමතිතුමා ඒ නිදර්ශනය ගත් නිසායි, මමත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

කියන්නේ—සමුපකාර ව්‍යාපාරය මුළු මහත් ආර්ථිකයම පාලනය කිරීමේ තත්ත්වයට අද ගොඩනැඟී තිබෙන බව පේනවා. එහෙත් අපේ රටේ අපි කවුරුත් පිළිගන්න ඕනෑ, දේශපාලනඥයන්ගේ ඇඟිලි ගැසීම් නිසා සමුපකාර ව්‍යාපාරය වැරදි මගට යොමු වූ බව. [බාධාකිරීම්] කොයි කාලයේද කියන එක ප්‍රශ්නයක් නොවෙයි. මම මුලින්ම කිව්වා, කාගේ හෝ වැරැද්දක් සිද්දවී තිබෙනවා නම් එය නිවැරදි කරන්න ඕනෑ බව. ඒ නිසා ඒ නිවැරදි කිරීම අපි නොකළොත් අපි කාටත් මේ විනාශයට හවුල් කාරයන් බවට පත් වන්නට වෙනවා.

සමුපකාර ව්‍යාපාරය පිළිබඳ මේ සංශෝධන පනත සකස් කරන්න ඇත්තේ සමුපකාර දෙපාර්තමේන්තුවයි. එහෙත් සමුපකාර දෙපාර්තමේන්තුව ගැනත් කල්පනා කරන්නට කාලය ඇවිත් තිබෙනවාය කියන එක ඇමතිතුමා පිළිගන්න ඕනෑ. සමුපකාර දෙපාර්තමේන්තුව අද වෙනත් දෙපාර්තමේන්තුවලින් මාරු කරන නිලධාරීන්ගෙන් දුවන දෙපාර්තමේන්තුවක් කිරීම නවත්වන්න ඕනෑ. සමුපකාර ව්‍යාපාරය ඒ පිළිබඳව කාලයක් වැඩ කරලා ඒ තුළින් මහන්සියෙන් ඉහළට නැඟපු නිලධාරීන්ම ඒ දෙපාර්තමේන්තුවේ ඉහළ තැන්වලට ආවොත් ඒ අයගේ හැඟීමක් තිබෙනවා, සමුපකාර ක්‍රමය ඉදිරියට ගෙනයන්න. එසේ නැත්නම් එය පරිපාලන ක්ෂේත්‍රයේ කවුරු හෝ මාරු කර යවන දෙපාර්තමේන්තුවක් වෙනවා. එක් නිලධාරියෙක් එනවා; එයාගේ තීරණ ක්‍රියාත්මක කරනවා; එයා යනවා. නව නිලධාරියෙක් එනවා; එයාගේ තීරණ ක්‍රියාත්මක කරනවා; එයා යනවා. දෙදෙනා අතර පරස්පර විරෝධයක් මතු වෙනවා. ඒ ක්‍රමය නවත්වා, මම ඉල්ලනවා ඇමතිතුමගෙන්, කම්කරු දෙපාර්තමේන්තුව වගේ සමුපකාර දෙපාර්තමේන්තුවත් සීමා වූ දෙපාර්තමේන්තුවක් බවට පත් කරන්නය කියා.

සමුපකාර ව්‍යාපාරය පිළිබඳ පුහුණුවක් ලැබූ ඒ පිළිබඳ විෂය හැදෑරූ අයට ඒ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වීමට පවා අයිතිය කෙසේ හෝ ලබා දිය යුතුයි. එතකොට තමයි, සමුපකාර ව්‍යාපාරිකයන්ට පමණක් නොව සමුපකාර දෙපාර්තමේන්තුවේ පල්ලෙහා මට්ටමේ අයටත් විශ්වාසයක් ඇතිවන්නේ. අපි ගන්නා පියවරවල් අවබෝධයකින් යුක්තවයි ගන්නේ කියා. ඔය මුදල් රෙගුලාසි මත හෝ පරිපාලන නීති රීති මත හෝ සමුපකාර දෙපාර්තමේන්තුව පරිපාලනය කරගෙන සමුපකාර ව්‍යාපාරය ගොඩ නඟන්න ලැබෙන්නෙ නැහැ. අන්න ඒ නිසා මම විශෙෂයෙන් කියා සිටින්නේ ලියා පදිංචි කිරීම පිළිබඳ ප්‍රශ්නය වේවා, රෙජිස්ට්‍රාර් වරයාගේ ක්‍රියා කලාපය පිළිබඳ ප්‍රශ්නය වේවා හරියාකාර පදනමකට ගන්න හැකියාව ලැබෙන්නේ ඒ තුළින් බවයි. අද දෙපාර්තමේන්තුවට ඒ කාර්ය භාරය ඉටු වීමේ හැකියාව නැහැ කියන එක අපි පිළිගන්න ඕනෑ.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)

කොහෙත්ම නැහැ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)

කොහෙත්ම නැහැ කියා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කියනවා. අලුතෙන් පැමිණි මන්ත්‍රීවරයෙක් හැටියට මමත් එකඟ වෙනවා ඒ කියන දේට.

විශේෂයෙන් ඇමතිතුමා මා දෙස බලා නිදර්ශනයක් ගෙනාවා, පැට්‍රල් ගබඩාවක ලක්ෂ ගණනක සල්ලි වංචා කළ සිද්ධියක් ගැන, මගේ ආසනයේ. එය මා පත්වන්නට කලින් වෙච්ච දෙයක්. මම මෙය සඳහන් කරන්නේ, කාටවත් වැරැද්දක් කියන්න නොවෙයි. ඇමතිතුමාම ගෙනෙන සංශෝධනය ඇමතිතුමාගේම දෙපාර්තමේන්තු නිලධාරීන් උල්ලංඝනය කිරීම ගැන පෙන්වන්නයි. ඇමතිතුමා දන්නවා එක් චෝදනාවක් සම්බන්ධව, අධ්‍යක්ෂ මණ්ඩලයේ හතර දෙනෙක් ඉවත් කිරීමට නියෝගයක් දුන් බව. ඒ ඉවත් කිරීමේ නියෝගය තුන් දෙනෙකුට පමණක් බල පා එක්කෙනෙකු සම්පූර්ණයෙන් නිදහස් කර ඔහුට නැවත සභාපති පුටුවේ ඉඳගන්නට අවස්ථාව දුන්නා. සමහරවිට ඒ පුද්ගලයා එයට සම්බන්ධ නැති වෙන්න පුළුවන්. ඇමතිතුමා කියනවා නම් මා එය පිළිගන්නවා. එහෙතම් හතර දෙනාම එයට සම්බන්ධ නැහැ කියන්න සිද්ධ වෙනවා. මහරගම සමුපකාර සංගමයේ 2,80,000 ක් වංචා කළ සිද්ධියට ඒ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධ නැහැ කියන එක ගැන සහතික ලත් පිටපත් සහිතව ගරු ඇමතිතුමාට අභියාචනා ඉදිරිපත් කළා. එය සිදු වුණේ මේ ආණ්ඩුවේ වැරදි ප්‍රතිපත්තියක් නිසයි.

**ගාමිනී ජයසූරිය මහතා**
*(திரு. காமினி ஜயசூரிய)*
(Mr. Gamani Jayasuriya)

ඇමතිවරයාට ඉදිරිපත් කළා කිව්වම සමහරු හිතයි, මට ඉදිරිපත් කළා කියා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)

බොහොම කණගාටුයි. වැඩබලන ඇමතිතුමා හැටියට සිටියේ. මම ඊයේ පෙරේදාත් ඇමතිතුමාට මෙය කිව්වා. ඇමතිතුමාගේ ගෞරවය ආරක්ෂා කිරීම පිණිසයි, ගිය සුමානෙත් මම ඒ ටික එතුමාට කිව්වේ. මේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාටත් එක ලෙස සලකන්නයි, මම කිව්වේ.

මෙය ප්‍රතිපත්තියක් හැටියට අපි පිළිගත යුතු නැහැ. කොමසාරිස්වරයාට අධ්‍යක්ෂ මණ්ඩලයක් විසුරුවා හැරීමේ බලය තිබෙනවා. ඔය කියන පරීක්ෂණය කර වැරදි සොයා ගත් විට කොමසාරිස්තුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හරිනවා. ඊට පසුව ඒ අධ්‍යක්ෂවරු ඇමතිවරයා ළඟට පැමිණ ඇමතිවරයාගේ විශේෂ බලතල පාවිච්චි කර කොමසාරිස්වරයාගේ නියෝගය අහෝසි කරවා ගෙන නැවත ගොස් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාඩි වෙනවා. එසේ වාඩි වෙන්නට කීප දෙනෙකුගෙන් එක් අයෙකුට පමණයි, අවස්ථාව ලැබෙන්නේ. මෙන්න මේ වගේ අසාධාරණකම් කරන්න එපා කියා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. දේශපාලන භේදයෙන් තොරව මේ ව්‍යාපාරය ගොඩනඟන්නට ඕනෑ. අනික් අධ්‍යක්ෂවරුත් දෙදෙනාගෙන් එක් කෙනෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්න පුළුවන්. අනික් එක්කෙනා ලංකා සමසමාජ පක්ෂයේ වෙන්න පුළුවන්. මම විශේෂයෙන් කියන්නේ මහරගම ගැනයි. ඒ අධ්‍යක්ෂවරු දෙදෙනා අවුරුදු ගණනාවක් අවංකවම සමුපකාර ව්‍යාපාරයේ සේවය කළ අයයි. ඒ අය මේ අවුරුද්දේ අධ්‍යක්ෂ මණ්ඩලයට ආවේ ගිය අවුරුද්දේ සාමාජිකයින් වෙලා නොවෙයි. අන්න ඒවායින් සමුපකාර ව්‍යාපාරය බේරා ගැනීමට දැන් කාලය ඇවිත් තිබෙනවා. රුපියලේ සාමාජිකයින් ඇති වී රුපියල් දාහක් වියදම් කර දාහක් බන්දවා ගෙන ඒ දාහේ ඡන්දයෙන් ප්‍රාදේශීක හතරක පහක බලය අල්ලා ගෙන මහා සභාවකට ඇවිත් මුළු සමුපකාර සංගමයම අල්ලා ගෙන කෝටි සංඛ්‍යාත ධනයක් පාලනය කිරීමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවීම වළක්වන්නට ඇමතිතුමාට මේ සංශෝධනවලින් අවස්ථාව පැදෙන්නේ නැහැ කියන ටිකයි, මම මේ කියන්නේ. අන්න ඒ ටික කිරීම සඳහා අලුත් පනතක් ගෙනෙන්ට සිද්ධ වෙයි කියා ගරු ඇමතිතුමා කිව්වා. අලුත් පනතක් හෝ ගෙනෙන්න. සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කර ගෙන නැවත ප්‍රාණවත් ආර්ථික බලවේගයක් හැටියට එය පරිවර්තනය කිරීමට මඟපෑදෙන්නේ අන්න එතනින්.

එමෙන්ම ගරු ඇමතිතුමාගෙන් මා තවත් ඉල්ලීමක් කරනවා. සමුපකාර ව්‍යාපාරයේ විශාල වැඩ කොටසක් ඉටු කිරීම සඳහා සමුපකාර සංවර්ධන බැංකුව නමින් බැංකුවක් පිහිටුවීමට පනතක් ඒ දවස්වල ඉදිරිපත් වුණා. ඒ බැංකුව පසුව මහජන බැංකුව වුණා. මහජන බැංකුවට අද සමුපකාරය සල්ලි එකතු කර දෙනවා, සමුපකාර ග්‍රාමීය බැංකු හැටියට. ඒ මඟින් මහජන බැංකුවට විශාල ධනයක් එකතු කර දෙනවා. එසේ සමුපකාර ව්‍යාපාරයට එකතු වන ධනය මහජන බැංකුව තුළින් කොයි තරම් දුරට සමුපකාර ව්‍යාපාරය තුළ නැවත ක්‍රියාත්මක වෙනවාද කියන එක ගැනත් සමුපකාර ඇමතිවරයා හැටියට තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නට ඕනෑ. දැන්වත් සමුපකාරය පිළිබඳව වෙනම බැංකුවක් ඇති කරන්න. මහජන බැංකුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද සමුපකාර බැංකුවක් නොවෙයි. එය සාමාන්‍ය බැංකුවක තත්ත්වයට පත් වෙලා. ග්‍රාමීය සමුපකාර මගින් ඕනෑ තරම් ධනය එකතු කරන්න පුළුවන්. ඒ නිසා සමුපකාර බැංකු හදා සමුපකාර ව්‍යාපාරයේ කටයුතු සඳහා පමණක් සමුපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා පමණක් එවැනි බැංකුවකින් වැඩ කරන්න පුළුවන් කියන ටික ඔබතුමාට කියන්න කැමතියි. ඔය බැංකුව ඇති කර සමුපකාර ව්‍යාපාරයට වැදී ඇති පහරින් එය ආරක්ෂා කර දුන්නොත් ඔබතුමා මේ රටේ සමුපකාර ව්‍යාපාරයේ සදානුස්මරණීය වෙයි.

එමෙන්ම සමුපකාර රක්ෂණ ක්‍රමය අරගෙන බලන්න. ගරු ඇමතිතුමාගේම ආසනය ගැන මම කියන්නම්. ඒ හෝමාගම විවිධ සේවා සමුපකාර සමිති සංගමය මගින් තමයි, මගේ ආසනයේ කඩ සමිති 8 ක් පාලනය වෙන්නේ. අන්න ඒ නිසා තමයි, මම මෙය කියන්නේ. රක්ෂණය පිළිබඳ ප්‍රශ්නය අරගෙන බලන්න. එය සමුපකාරයට තිබෙන ප්‍රශ්නයක්. සමුපකාරය මගින් රක්ෂණය සඳහා සල්ලි ගෙවනවා. සමහර අවස්ථාවලදී රක්ෂණ සංස්ථාව මගින් පරීක්ෂණ කර ඒ ඉල්ලන වන්දි ගෙවීම නතර කරනවා. හෝමාගම විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ මේ ප්‍රශ්නය මතු වූ විට ඒ සංගමය කළේ මොකක්ද? තමන්ම රක්ෂණ ක්‍රමයක් ආරම්භ කළා. අද හෝමාගම විවිධ සේවා සමුපකාර සමිති සංගමය තමන්ගේම රක්ෂණ ක්‍රමයක් මගින් තමන්ගේ ආරක්ෂාව ඉතා හොඳට ආරක්ෂා කර ගෙන යන ක්‍රමයක් ඇති කර තිබෙනවා. අනෙක් ප්‍රදේශවල සමුපකාරවලටත් ඒ රක්ෂණ ක්‍රමය දීමට දැන් සාකච්ඡා පවත්වාගෙන යනවා.

මේ රටේ සමුපකාර රක්ෂණ ක්‍රමයට ගරු වෙළඳ ඇමතිතුමා අවසර දී තිබෙනවා. ඒ රක්ෂණ තරගයට සමුපකාර ව්‍යාපාරයත් යොදවන්නය කියන ටිකයි, මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ. සමුපකාරයක සාමාජිකයෙක් තමන්ගේ රක්ෂණය සමුපකාරය මගින් කර ගන්නට දක්වන උනන්දුව රක්ෂණ සංස්ථාවේ නියෝජිතයින් හොය හොයා ගොස් දරන උත්සාහයට වඩා වැඩි වෙනවා ඇති. ඇන එපිට ගම්බද ප්‍රදේශවල ජනතාවට මෙය වඩාත් ප්‍රයෝජනවත් වෙනවා ඇති. ඔවුන්ට තමන්ගේ රක්ෂණය ගමේ කඩේට ගොස් කර ගන්නට පුළුවන් තත්ත්වයක් මෙයින් ඇති වෙනවා.

ඇනුවල් බජට් එකක් හෙවත් වාර්ෂික අය වැයක් ගැනත් කරුණු කියැවුණා. මම මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට විශේෂ කාරණයක් මතක් කරන්නට කැමතියි. වාර්ෂික අය වැයක් අවශ්‍යයයි මේ නිලධාරීන් බොහෝම ලස්සණ වචන වලින් අපට කියනවා. බජට් එකක් අවශ්‍යයි. කවුරුවත් එය නැහැයි කියන්නේ නැහැ. නමුත්, ඒ කුමක් සඳහාද? මම මුලින්ම කිව්වා වාගේ, අද සමුපකාර කියන්නේ විශාල මැතිවරණ කොට්ඨාශයක ජන්දයෙන් පත් වන අධ්‍යක්ෂක මණ්ඩලයකට. ඒ අය වාර්ෂික බජට් එකක් හදයි. නමුත්, ඇත්තටම එය හදන්නේ සමුපකාර සාමාජිකයන්ගේ අදහස් ලබාගෙනද? අද සමුපකාර ප්‍රාදේශික රැස් වෙනවාද? ප්‍රාදේශිකවල සාමාජිකයන්ට අද රැස් වන්නට අවස්ථාවක් තිබෙනවාද? නැහැ. අද සමුපකාර කඩ සමිති නිසා, ප්‍රාදේශික සාමාජිකයන් රැස් වී මහා සංගමයට යෝජනා යැවීමක් සිදු වන්නේ නැහැ. මේ නිසා කෘෂි කාර්මික අංශයේ විවිධ ක්ෂේත්‍රවලට අවශ්‍ය විවිධ කටයුතු අද ගම්බද තිබෙන ප්‍රාදේශික මගින් සිදු වන්නේ නැහැ. පාදේශිකවල අද රැස් වන්නේ කාරක සභා විතරයි. ඒ නිසා ප්‍රාදේශික මට්ටමේ සාමාජිකයන්ට සම්පූර්ණ සංවත්සර පැවැත්වීමේ අවස්ථාව සලසා, ඒ මගින් යෝජනා ඉදිරිපත් කොට, ඒ යෝජනා මහා සංගමයට ගෙනැවිත් එතැනින් වාර්ෂික අය වැය සකස් විය යුතුය කියන පදනමට අපි එන්නට ඕනෑ. එසේ නැතිව මහා සංගමයෙන් පමණක් හදන අය වැයකින් බජට් කොන්ට්‍රෝල් එකක් සිදු වන්නේ නැති බව අපට පිළිගන්නට වෙනවා. සමුපකාර ව්‍යාපාරයේ සැබෑ සාමාජිකයන්ගේ බලාපොරොත්තුව ඒ තුළින් ඉටු වන්නේ නැත කියන කාරණය අපි තේරුම් ගන්නට ඕනෑ. මේවාගේ සංශෝධනයක් ගෙනා වේලාවක මේ කරුණු අපි කියන්න ඕනෑ.

සමුපකාර මහා සංගමයේ සාමාජිකත්වය දරන්නේ ප්‍රාදේශිකයි. ඒ ප්‍රාදේශිකවල සාමාජිකයන්ට තමන්ගේ ශාඛාවල සංවත්සර පවත්වා, ඊළඟ අවුරුද්දේ මේ මේ දේවල් කළ යුතුය කියා යෝජනා ඉදිරි පත් කිරීමේ අවස්ථා වඩා තහවුරු කරගැනීම සඳහා මේවාගේ සංශෝධනවලදී ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please ! How long will you take ?

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)

Another fifteen minutes, Sir.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Sitting is suspended till 5.00 p.m.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 5.00ට නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී*

*அதன்படி, அமர்வு பி. ப. 5 மணிவரை இடை நிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 5.00 p.m. and then resumed,* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNA) *in the Chair.*

අ. භා. 5.00

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර ව්‍යාපාරයේ ඉදිරිගමන සඳහා මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධනය ගැනයි මම අදහස් ඉදිරිපත් කරමින් සිටියේ. මම විශේෂයෙන් සඳහන් කළේ සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කරවීමට සමුපකාර ව්‍යාපාරිකයන්ට සමුපකාර සංගම්වල, සමුපකාර සමිතිවල ක්‍රියාකාරී සාමාජිකයන් හැටියට පත්වීමට අවකාශ සලසා දියයුතු වගයි. එසේ නොකළහොත් අනාගතයේදී සමුපකාර ව්‍යාපාරය ඉතිරි වන්නේ නැහැ. එවිට එය වෙන අරමුණක අවශ්‍යතා ඉටුවන ව්‍යාපාරයක් බවට පත් වෙනවා. දේශපාලනඥයන් හැටියට අප කවුරුත් සතුටුයි, සමුපකාරවලට නියෝජිතයන් බඳවා, අපේ බලය තහවුරු කර ගන්නට. මෙම කාරණය සමුපකාර ව්‍යාපාරයට ස්වාධීන ව්‍යාපාරයක් හැටියට හිස එසවීමට බාධාවක් වී තිබෙනවා. එම නිසා, රුපියලේ සාමාජිකයන් අහෝසි කරන්නට නොවෙයි මම කියන්නේ. මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ නියම සමුපකාර ව්‍යාපාරිකයන් තබා ගන්නට නම් පෙර පැවැති රුපියල් පනහේ හෝ රුපියල් සියයේ සාමාජිකයන් ඇති කර දැනට සිටින රුපියලේ සාමාජිකයන්ට වාරිකව හෝ එම මුදල ගෙවා ඒ තත්ත්වයට එන්නට කාලයක් දෙන ලෙසයි. එවිට, වර්තමානයේ සමුපකාරයේ සාමාජිකයන් වී සිටින අයගෙන් විශාල පිරිසක් සමුපකාරය අතහැර යන බව අප කාටත් පෙනේවි.

අද බොහෝ සමුපකාර සංගම්වල ඉහළ මට්ටමේ සිටින්නේ සමුපකාරය සඳහා තමන්ගේ කාලය යෙදවීමට නොහැකි සමුපකාර ව්‍යාපාරය ගැන ඕනෑකමක් නැති අයයි. මෙම සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් සංශෝධනයක ඇති වැදගත්කම ඇමතිතුමා සඳහන් කළා. සමුපකාරය ආරක්ෂා කරන්නටත් රජයට විශේෂ අවශ්‍යතාවයක් මතු වුණු විට ප්‍රයෝජන ගැනීමටත් නිවැරදි අය අධ්‍යක්ෂ මණ්ඩලවල සිටින්නට ඕනෑ බව ඇමතිතුමා කිව්වා. සමුපකාර ව්‍යාපාර ක්‍රියාකාරීත්වයට අවුරුදු 10 හෝ 15 ක් හවුල් වුණු අයට අධ්‍යක්ෂ මණ්ඩලවලට එන්නට තිබෙන වරම ආරක්ෂා කර දෙන්නට ජාතික සමුපකාර මණ්ඩලය ඇමතිතුමාට ප්‍රයෝජනයට ගන්නට පුළුවන්. ඇත්තවශයෙන්ම සමුපකාරිකයන්ගේ නියෝජිතයන් හැටියටයි එම මණ්ඩලය ගොඩ නැගී තිබෙන්නේ. සමුපකාර ව්‍යාපාරයේ ජ්‍යෙෂ්ඨයන් සහ ක්‍රියාකාරිකයන් වශයෙන් ඔවුන්ට මෙම අධ්‍යක්ෂ මණ්ඩලවලට ස්වාධීනව හවුල් වන්නට මෙම මණ්ඩලවලට පත්වන්නට අවස්ථාව දෙන්නට පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

එසේම මම කියමින් සිටියේ, ජපානය වැනි රටවල්වල ආනයනය සහ අපනයනය පවා සමූපකාර සංගම් මගින් කරන බවයි. තවමත් අපේ සමූපකාර සංගම් ඒ තත්ත්වයටවත් පැමිණ නැහැ. සී. ඩබ්ලිව්. ඊ. යනුවෙන් හැඳින්වෙන සමූපකාර තොග වෙළඳ ආයතනය ගැන බලන විට අද එය සමූපකාර තොග වෙළඳ ආයතනයක් හැටියට ක්‍රියාත්මක නොවන බව පෙනෙනවා. මේ රටේ තොග වෙළඳාම සමූපකාර ව්‍යාපාරයේ කොටසක් වශයෙන් හෝ තබා ගන්නට ඇමතිතුමා ඕනෑකමක් දක්වනවා නම්, සමූපකාර ව්‍යාපාරයේ ආනයන—අපනයන කටයුතු පවත්වා ගෙන ගිය හැකි මහා සංගමයක් හෝ ඇති කරන්නට නැවතත් හිත යොමු කරන්නට ඕනෑය යන්නයි මම කියන්නේ.

පසුගියදා වෙළඳ ඇමතිතුමා හාල් හා වෙනත් නිෂ්පාදන බෙදා හැරීමේ කටයුතු සඳහා සාකච්ඡා කිරීමට දේශීය තොග වෙළෙන්දන්ගේ සාකච්ඡාවක් කැඳෙව්වා. එම සාකච්ඡාවට එකම සමූපකාර සංගමයකවත් නියෝජිතයෙක් ආවේ නැහැ. වෙළෙඳ ඇමතිතුමාගේ වරදක් නොවෙයි. මේ රටේ තිබෙන මහා සමූපකාර සංගම්වල කිසිම නියෝජිතයෙක් එතැනට ගොස් කිව්වේ නැහැ, හාල් හෝ වෙන දෙයක් සම්බන්ධ තොග වෙළඳාම් කටයුතු කරන්න අපට පුළුවන් කියා. අන්න ඒ තත්ත්වයට අද සමූපකාර ව්‍යාපාරය පසු බැස තිබෙනවා. ඒ නිසා මා ඉල්ලා සිටින්නේ සමූපකාර අමාත්‍යාංශයෙන් පමණක් නොව, සමූපකාර දෙපාර්තමේන්තුවෙනුත් සමූපකාර ව්‍යාපාරය ගැන හැඟීමක් ඇති අයට නායකත්වයක් දෙන්න කියායි. සමූපකාර ව්‍යාපාරයට ආදේශ කළ පරිපාලන නිලධාරීන් තුළින් සමූපකාර ව්‍යාපාරය ප්‍රාණවත් කිරීම හෝ ඉදිරියට ගමන් කරවීම කරන්නත් බැහැ. ඒ ව්‍යාපාරයට කැපවුණ අය මේ රටේ සිටියා. එවැනි නොයෙක් නොයෙක් අය අද ජාත්‍යන්තර සංවිධානවල ජාත්‍යන්තර මට්ටමින් සමූපකාර ව්‍යාපාරය ගොඩනැගීම සඳහා ගොස් සිටිනවා. මේ රටේ එවැනි අය නවත් නැහැයි කියා කියනවා නොවෙයි. අන්න ඒ කාරණා ගැන අවධානය යොමු කරන්නය කියා මා ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අද පොල්ගොල්ලේ තිබෙන සමූපකාර විද්‍යාලය විශ්ව විද්‍යාලයට සම්බන්ධිත ආයතනයක් බවට පත් කර, සමූපකාර ව්‍යාපාරයෙන් රටේ ආර්ථික ක්ෂේත්‍රයට වැඩ කොටසක් කරන්න පුළුවන් පිරිසක් බිහි කිරීම සඳහා එම විශ්ව විද්‍යාලයෙන් පිටවෙන අයට වටිනාකමක් ඇති අධ්‍යාපන සහතිකයක් ලබා දීමට කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා එම සමූපකාර විද්‍යාලය විශ්ව විද්‍යාලයට අනුබද්ධ ආයතනයක් කිරීමට තමුන්නාන්සේ උත්සාහ කරන්නය කියාත් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ස්විඩනයේ උදව් ඇතිව කළමනාකාරිත්ව සේවාව මගින් අලුත් උත්සාහයක යෙදෙන්නට අරමුණක් තිබෙනවා කියා අපට ආරංචියි. මේ රටේ සමූපකාර ව්‍යාපාරයේ වර්තමාන මහා සංගම් පිළිවෙත අනුගමනය කරනවා නම් ඇත්තවශයෙන්ම කළමනාකාරිත්වය සහ පරිපාලනමය අංශවලට අදට වඩා විශාල අභියෝගයකට මුහුණ දෙන්න සිදු වෙනවා. ගණකාධිකරණය, පරිපාලනය, අලෙවි කිරීම වැනි අංශ පිළිබඳ විශේෂඥ පුහුණුවක් ඇති අය ඒ සංවිධානවල නායකත්වයට එන්න ඕනෑ. වර්තමානයේ තිබෙන තරඟයට මුහුණ දෙන්න සමූපකාර ව්‍යාපාරය පරිවර්තනය කරන්න ඕනෑ නම් ඒ විධියේ නායකත්වයක් දෙන්න ඕනෑ. නමුත් සමූපකාර සංගම්වලට වහාම ඒ තත්ත්වයට එන්න පුළුවන් වෙයිද කියන කාරණය ප්‍රශ්නයක්. සමූපකාර ව්‍යාපාරය අද පවතින තත්ත්වයේ හැටියට වහාම ඒ තත්ත්වයට ගෙනෙන්න හැකියාව ලැබෙන්නෙ නැති බව අපි කවුරුත් දන්නවා. ඒ නිසා මේ මහා සංගම්වල පවතින තත්ත්වයට වඩා, මේ ආර්ථිකයට ඔරොත්තු දෙන සමූපකාර ව්‍යාපාරිකයන්ගේ හැඟීම් ආරක්ෂා කරන්න පුළුවන්, කුඩා ප්‍රාදේශිකයන්වල ස්වාධීනත්වය සහ උනන්දුව දියුණු කරන්නට කටයුතු කරන්නය කියා ඔබතුමාගෙන් මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපි දන්නවා, අද සමූපකාර සේවකයන් වැටී ඉන්න තත්ත්වය. සමූපකාර සේවකයන්ට අවශ්‍ය කරන කොමිෂන් සභාවක් ගැන මෙම සංශෝධනයෙන් එක වගන්තියක් තිබෙනවා. මේ කොමිෂන් සභා මගින් සේවක අයිතිවාසිකම් ගැන සහතිකයක් ලැබෙනවා කියා මම නම් හිතන්නෙ නැහැ. ඒ බව අපි බොහොම කනගාටුවෙන් වුවද කියන්න ඕනෑ. සමූපකාර සේවක කොමිෂන් සභාව අහෝසි කරනවා නම් වඩා හොඳයි. එවිට සමූපකාර සේවකයන්ට මීට වඩා උසස් ආයතනයක් මගින් තමන්ගේ සේවා අයිතිවාසිකම් ලබා ගැනීමට අවස්ථාවක් පැදෙනවා. සමූපකාර සේවක කොමිෂන් සභාවට ඉල්ලුම් පත්‍රයක් දැමූ විට, අභියාචනයක් ඉදිරිපත් කළ විට ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනවා කියා උත්තරයක් ලැබෙනවා. ඊට පසුව ලැබෙන උත්තරය මොකක්ද? බොහෝ විට පරීක්ෂණයක් නොමැතිව තීන්දු දෙන අවස්ථා තමයි දකින්න තිබෙන්නෙ. ඊළඟට එයට විරුද්ධව මේ සමූපකාර සේවකයා උසාවි යන්න ඕනෑ. සිවිල් උසාවියක නඩු දමන්න ඕනෑ. අවුරුදු ගණනකට පසු විශාල මුදලක් වියදම් කර සිවිල් උසාවියක නඩු දමන්න ඕනෑ. අද කම්කරු විනිශ්චය සභා තිබෙනවා. අන්න එම මට්ටමේ හරි ස්වාධීන විනිශ්චය සභා ආයතනයක් ඇති කර නිදිමත ගතියෙන් සිටින මේ සමූපකාර සේවක කොමිෂන් සභාව අහෝසි කරන්නට ඔබතුමා එඩිතරව ක්‍රියා කළොත් සමූපකාර සේවකයන්ගෙන් ඒ සඳහා ඔබතුමාට සම්පූර්ණ සහයෝගය ලැබෙනවාට කිසිම සැකයක් නැති බව කියන්න ඕනෑ.

මේ කොමිෂන් සභාව අද ඉෂ්ට කරන කාර්ය භාරය ඉතා කනගාටුදායකයි. ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල විසින් අස් කරනු ලැබූ සේවකයන් අභියාචනා ඉදිරිපත් කළාම, ඒ අධ්‍යක්ෂ මණ්ඩල ඇවිත් කොමිෂන් සභාවේ නායකත්වයට උපදෙස් දෙනවා, ' මෙන්න මේකයි, දිය යුතු තීන්දුව ' කියා. ඒ විධියට සිද්ධ වුණු අවස්ථාවන් ගණනාවක් තිබෙනවා. ඒ විධියට හදිසියේ ලියැවෙන තීන්දු මගින් ඒ අභියාචනා ප්‍රතික්ෂේප කෙරෙනවා. සේවකයන් කොමිෂන් සභාවට ඉල්ලීමක් නැත්නම් අභියාචනයක් ඉදිරිපත් කළාම ඒ විෂයයට, ලිපිගොනුවට අදාළ නැති උත්තර පවා ලැබෙනවා. ඇමතිතුමාට වුවමනා නම්, ඒ විධියට කොමිෂන් සභාව තීන්දු දුන් අවස්ථා ඕනෑම ප්‍රමාණයක් මම ඉදිරිපත් කරන්නම්. මේ කොමිෂන් සභාවෙන් සමූපකාර සේවකයන්ගේ ඉල්ලීම් ඉෂ්ට වන්නේ නැහැ ; අයිතිවාසිකම් රැකෙන්නේ නැහැ. එම නිසා ඒ කොමිෂන් සභාව අහෝසි කර දමා, සමූපකාර සේවකයන්ට තමන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කරන්න, අයිතිවාසිකම් කියා පාන්න පුළුවන් වන විධියට කම්කරු විනිශ්චය සභා වාගේ ආයතන කීපයක් ඇති කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම, බොහෝ විට සමූපකාර සේවකයන් දූෂිතයන්ය කියන ආකල්පය ඇති කරන්න තමයි, මේ අය උත්සාහ කරන්නේ. සමූපකාර සේවකයන් තරම් කැපවීමකින්, අමාරුවකින් තමන්ගේ සේවය කරන සේවක පිරිසක් වෙළෙඳ ක්ෂේත්‍රයේ නවත් ඉන්නවාද කියා මම අහන්න කැමතියි.

එක්කෝ පරණ තරාදියක්, තරාදි පඩියක් නිසා හෝ ලැබුණු මිරිස් වේළීම නිසාම හෝ අඩු වන තොග ප්‍රමාණය නැත්නම් බර ප්‍රමාණයවත් සැලකිල්ලට නොගෙන කෙරෙන යම් යම් පරීක්ෂණ නිසා බොහෝ විට අසරණ සමූපකාර සේවකයන් දඬුවම් ලබනවා. නමුත් ඉහළ මට්ටම්වල උදවිය දඬුවම් ලබන්නේ නැහැ. මේ නිසා දූන් සමූපකාර සේවකයන් තුළ අළුත් විශ්වාසයක් ඇති කළ යුතුව තිබෙනවා. සමූපකාර සේවකයන් මේ කාර්ය භාරය සඳහා උර දී තිබෙන්නේ විශාල කැපවීමකින් යුතුවයි. එම නිසා එම සේවකයන්ගේ පැත්ත ගැනත් අවධානය යොමු කරන හැටියට ඉතා ගෞරවයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම සමූපකාර සංගම්වලට වර්තමානයේ එල්ල වී ඇති නවත් බාධාවක් වී තිබෙනවා, පිරිවැටුම් බද්ද. පසුගිය දා ගරු මුදල් ඇමතිතුමා සංවර්ධන සභා වගේ ආයතන ඒ බද්දෙන් නිදහස් කළා. සමූපකාර ආයතනත් මේ පිරිවැටුම් බද්දෙන් සම්පූර්ණයෙන්ම අයින් කරන්න තමයි, ඇත්තෙන්ම ඕනෑ කර තිබෙන්නේ. එහෙම කරන්න බැරි නම් අඩු වශයෙන් සමූපකාර ආයතන සම්බන්ධයෙන් යම්කිසි ලිහිල් කිරීමක්වත් කිරීම ගැන අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධනය වගේ නීති මගින් සමූපකාර ආඥපනත එහෙත්-මෙහෙත් සංශෝධනය කර, සමූපකාර ව්‍යාපාරය නැඟිටුවන්න පුළුවන් ඒ තුළින්ය කියා සමහර විට ඇමතිතුමාට නිලධාරීන් කියන්න පුළුවනි. නමුත් සමූපකාර ව්‍යාපාරය නැඟිටුවන්න නම්, එම සමිතිවලට තිබෙන අමාරුකම්වලින් ගොඩ ඒම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ඇති කරන්නය කියන ටිකයි, මට නම් කියන්න තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කරුණු දෙකක් මතක් කරන්න ඕනෑ. මගේ ආසනයේ පදිංචි, සාමාන්‍යයෙන් හැම දේශපාලන පක්ෂයකටම වාගේ අයිති උදවිය සේවය කළ මහා පරිමාණයේ ප්‍රවාහණ සමුපකාර සමිතියක් තිබුණා, කොළඹ. එය බලවත් සමිතියක්. බොහොම හොඳට ලාභ ලබමින් එය පවත්වාගෙන ගියා. නමුත් කාලයකට ඉස්සර එහි අධ්‍යක්ෂ මණ්ඩලය අයින් කර අලුත් සභාපති කෙනෙකුත් පත් කළා. ඒ අලුත් සභාපති දවසක් හිටිහැටියේ ඒ සේවකයන් ගේට්ටුව ළඟ නවත්වා කීවා, 'හෙට ඉඳලා වැඩට එන්න එපා' කියා. ඒ මිස කිසිම හේතුවක් දුන්නේ නැහැ. චෝදනා පත්‍ර ඉදිරිපත් කළේත් නැහැ. ඒ උදවිය සේවයෙන් අස් කළේවත් නැහැ. ඒ විධියට සිය ගණනක් සේවකයන්ට රක්ෂාව අහිමි කළා.

එම නිසා සිදු වුණේ මොකක්ද? එම සමුපකාර සංගමයට අයත් ලොරි ගණනාවක් ඒ භූමියේ නවත්වා දිරා යන්න ඉඩ හැර තිබෙනවා. දැන් හෙමින්–හෙමින් ඒ ලොරි එක–එක විකුණනවා, එක්-එක් පුද්ගලයන්ට. එම භූමිය පමණක් රුපියල් ලක්ෂ 75 ක් වටිනවාය කියා සමුපකාර දෙපාර්තමේන්තුව තක්සේරු කර තිබෙනවා. එම භූමියේ සම්පූර්ණ හිමිකම් තිබෙන්නේ ඒ සමුපකාර සමිතියටයි. නමුත් ඒ ලොරිවල වටිනාකම දන්නේ නැහැ. ඒ පිළිබඳ වාර්තාවට මොකක්ද, වුණේ?

දැන් ඇමතිතුමා බලය ඉල්ලනවා, කොමසාරිස්තුමා ලවා පරීක්ෂණ කරන්න, ගණන් පොත් පරීක්ෂා කරන්න. තවත් යම්-යම් පොත්-පත් ගැන හොයන්නත් අලුතින් බලය ඉල්ලනවා. නමුත් ඒ ඔක්කෝම හොයා බලා ඉදිරිපත් කළ වාර්තාවට මොකක්ද වුණේ කියා අහන අතර ඒ ගැන හොයා බලා ක්‍රියා කරන්නය කියා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනනවා. රුපියල් ලක්ෂ ගණන් වටිනා දේපොළ දැන් විකුණාගෙන යනවා. සමහර විට ඒවා එක-එක පුද්ගලයා මිල දී ගනීවි. ඒවායේ වටිනාකම රුපියල් ලක්ෂ 65 කට වැඩියි. විව්‍යත වෙළඳපොළේ රුපියල් ලක්ෂ 120 ක් වටිනවාය කියා තක්සේරු කර තිබෙනවා. අන්න බලන්න, යම්කිසි අවස්ථාවක තිබුණු රුපියල් ලක්ෂ දෙක-තුනක හිඟයක් සම්බන්ධයෙන් යෙදූ ප්‍රතිකර්මය නිසා අද ඇති වී තිබෙන තත්ත්වය. අද එය විනාශය කරා ළඟා වී තිබෙනවා.

මේ විධියට සමුපකාර කඩ සමිති පමණක් නොව ප්‍රවාහණ, ගව පට්ටි හා වෙනත් විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ සමුපකාර සමිති අද තුරන් වේගන යනවා.

**ගාමිනී ජයසූරිය මහතා**
*(திரு. காமினி ஜயசூரிய)*
(Mr. Gamani Jayasuriya)
ඒ සමිතිය කොහේ තිබෙන එකක්ද?

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)
ඇමතිතුමනි, මේක බොරැල්ල ආසනයේ තිබෙන්නේ. 'ඇක්වයිනාස්' එක ඉදිරිපිටයි තිබෙන්නේ. ඒ භූමියේ ලොරි තිහක් හතළිහක් තිබුණා. සේවකයන් ගණනාවක් සිටියා. අද වන තුරු ඒ අය අස් කළාද, ඉන්නවාද, පඩි ගෙවනවාද, වන්දි ගෙවනවාද යන මේ කිසිම දෙයකට උත්තරයක් නැහැ. එහි ලක්ෂ ගණනක් වටිනා දේපොළවලට සිදු වුණු දේ ගැනයි, මම මේ කියන්නේ.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)
අධ්‍යක්ෂ මණ්ඩලයට මොකද වෙලා තිබෙන්නේ? අධ්‍යක්ෂ මණ්ඩලයක් ඇති නොවැ?

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)
අධ්‍යක්ෂ මණ්ඩලයද? අලුත් අධ්‍යක්ෂ කෙනෙක් පත් කරලා සිදු වුණු දේ තමයි මම මේ කිව්වේ. සාමාජිකයන් විසින් පත් කළ අධ්‍යක්ෂ මණ්ඩලය අයින් කිරීම නිසා සිදු වුණු දේ තමයි මම කිව්වේ. මේ පිළිබඳව තොරතුරු පරීක්ෂාකර සකස් කළ වාර්තාවක් තිබෙනවා. ගරු ඇමතිතුමාට වුවමනා නම් කොමසාරිස්තුමාගෙන් ඇහුවොත් එය ලබා ගන්නට පුළුවන් වෙයි. මේ දේපොළ පිළිබඳව සියලු විස්තර ඒ පරීක්ෂණ වාර්තාවේ තිබෙනවා. එහි සේවය කළ සේවකයන් විශාල පිරිසක් සිටිනවා. යන එන මං නැතිව සිටින ඒ පිරිස අයින් කළාය කිව්වොත් කොම්සම ඉදිරිපිටට හෝ අධිකරණය ඉදිරිපිටට ගොස් වන්දියක් ගැන ඉල්ලීමක්වත් කරන්නට පුළුවනි. ලක්ෂ ගණනක් වටිනා දේපොළ තිබුණු සමුපකාර ව්‍යාපාරයක් ඒ තත්ත්වයට ගෙනා සේවකයන්ට වන්දියක්වත් ලබා ගන්නට ඉඩ ප්‍රස්ථාව ලබා දීම සඳහා මැදිහත් වන ලෙසයි, ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටින්නේ.

ඒ වාගේම මා විශේෂයෙන් ගරු ඇමතිතුමාගෙන් තැවතත් ඉල්ලා සිටින්නේ සමුපකාර කටයුතු පිළිබඳව ක්‍රියා කරන්නට බැංකුවක් ඇති කරන්නටය කියන ටිකයි. බඩු බෙදා හැරීම පමණක් නොවෙයි. සමුපකාරයට සම්බන්ධ විවිධ අංශයන් අද මේ රටේ තිබෙනවා. ස්විඩන් රටින් පැමිණි සමුපකාර ව්‍යාපාරිකයන් මුණ ගැසී ඒ අය සමග සාකච්ඡා කරන්නට මටත් අවස්ථාවක් ලැබුණා. ඒ සාකච්ඡා කළ වෙලාවේදී ඒ අය මා සමග කියා සිටියේ මේ රටේ සමුපකාර ව්‍යාපාරයට ස්විඩනයේ සමුපකාර ව්‍යාපාරයත් සමග කෙළින්ම ගනුදෙනු කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති කළ හැකි බවයි. මේ රටේ රෙදි නිෂ්පාදනය කරන සමුපකාරවල සියලු ද්‍රව්‍යයන් ඒ රටට පටවන්නට පුළුවන් අන්දමට ඒ රටේ සමුපකාර ව්‍යාපාරය සම්බන්ධ කරගන්නට පුළුවන් බවයි. මේවා පිළිබඳ උනන්දුවක් ඇති කළොත්, ආකල්පයක් ඇති කළොත් සමුපකාර ව්‍යාපාරයට හිස ඔසවන්නට පුළුවන්කමක් තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් කියා සිටිනවා.

මෑත යුගයේ ලංකාව ආර්ථික අවුලකින් ආරක්ෂා කළේ සමුපකාර ව්‍යාපාරය බව ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. පසුගිය අවස්ථාවල කලබලකාරී තත්ත්වයන් මැද්දේ මහජනයා ඉස්සරවෙලාම දිව්වේ සමුපකාර කඩවලට බව මම මේ අවස්ථාවේදී විශේෂයෙන් කියන්නට ඕනෑ. එතැන බඩු තිබෙනවා නම් සාධාරණ මිලකට ලැබෙයි කියන විශ්වාසය ජනතාව තුළ තිබුණා. හැම තැනම පෝලිම් හැදෙන්නට පටන් ගත්තා. කීය හරි වෙන තුරු පෝලිමේ ඉඳලා සාධාරණ මිලකට බඩු ටික ගන්නට ලැබෙයි කියන විශ්වාසය ඇති වුණා. ඒ සමුපකාරය ඉතිරි වී තිබුණ නිසයි. යුද්ධ කාලයේත් සමුපකාරය මගින් මේ කටයුත්ත සිදු වුණා. විශේෂයෙන් ඩී. එස්. සේනානායක ඇමතිතුමාගේ කාලයේදීත් සමුපකාර ව්‍යාපාරයට විශාල සේවයක් වුණා.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)
ආරම්භ කළේ කව්ද?

**දිනේෂ් ගුණවර්ධන මහතා**
*(திரு. தினேஷ் குணவர்த்தன)*
(Mr. Dinesh Gunawardene)
ආරම්භය ගැන කතා කරනවා නම් "රොච්ඩේල්" යුගයේ ඉඳන් එන්නට ඕනෑ. මේ සමුපකාර ව්‍යාපාරය ආරම්භ වෙලා බොහොම කල්. මම කියාගෙන ආවේ විවිධ සේවා සමුපකාර ක්‍රමය මගින් ලංකාවේ ගම් නියම් ගම් මෙන්ම ආර්ථිකයද අලුත් ශක්තියකින් නැඟිටට බවයි. ඒ තත්ත්වය ආරක්ෂා කර දීම සඳහා මැදිහත් වන ලෙසයි මා විශෙෂයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ. අලුත් අභියෝගයකට මුහුණ දෙන්නට පුළුවන් අය අද මේ සමුපකාර සමිතිවල ඉන්නවා. මේ සමුපකාර සමිතිවල ගණකාධිකාරිවරුන් විසින් පවත්වන පරීක්ෂණවලට වඩා හොඳ පරීක්ෂණ පවත්වන ලද අය සාමාන්‍ය සේවකයන් අතර සිටිනවා. ගණකාධිකාරිවරුන්ට නැත්නම් විගණක විශෙෂඥයින්ට අල්ලා ගන්නට බැරිවුන දේවල් සාමාන්‍ය සේවකයන් විසින් අල්ලා දුන් අවස්ථා. ඒ පිළිබඳ වාර්තා ඕනෑ තරම් සමුපකාර දෙදපාර්තමේන්තුවේ තිබෙනවා. අන්න ඒවාගේ අය සමුපකාරවල ඉන්නවා. එවැනි අයට නැගිටින්නට, ඉහළට යන්නට අවස්ථාවක් දුන්නොත් තමයි, සමුපකාර ව්‍යාපාරය වැඩෙන්නේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

මම කලින් කියාගෙන ආවේ ස්විඩනයෙන් පැමිණි සමුපකාර විශේෂඥයින් ගැනයි. ඒ අයගෙන් එක්කෙනෙක් අවුරුදු තිහකට කලින් ලොරි රියැදුරෙක්. සමුපකාරය තුළින් නැගිටලා ඉහළට ඇවිත් අද සමුපකාරය පිළිබඳව විශේෂඥයෙක් වී සිටිනවා. මේ රටේත් දක්ෂ, බුද්ධිමත් අයට සමුපකාර ව්‍යාපාරය තුළින් අඩියෙන් අඩිය ඉහළට එන්නට අවස්ථාව සැලසුවොත් සමුපකාර ව්‍යාපාරය පමණක් නොවෙයි, රටේ ආර්ථිකයත් මීට වඩා එක ක්ෂේත්‍රයකින් ආරක්ෂා වෙනවාය කියන ටික අපි තේරුම් ගන්නට ඕනෑ. මේ ආණ්ඩුවත්, ඒ වාගේම හැම ආණ්ඩුවක්ම ලංකාවේ අවම මිශ්‍ර ආර්ථිකය පිළිගත්තා. ඒ නිසා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ සමුපකාර අංශය යන අංශ තුනම ආරක්ෂා කරන්නට පුළුවන් ආකාරයට, විවෘත තරගයකදී පවා සමුපකාර ව්‍යාපාරයට මුහුණ දෙන්නට පුළුවන් ආකාරයට සමුපකාර ව්‍යාපාරය නැවත ශක්තිමත් කිරීමේ කාර්යය මේ සංශෝධනයෙන් පමණක් ඉෂ්ට වෙන්නේ නැහැ කියන ටික මා ඉතා සැලකිලිමත්ව ඔබතුමාට මතක් කරමින්ද, නිලධාරීන් බලන දෘෂ්ටි කෝණයට වඩා බාහිරව මේ කාර්යභාරය සඳහා බැලීමෙන් පමණක් සමුපකාර ව්‍යාපාරයට, ව්‍යාපාරයක් වශයෙන් නැගිටින්නට අවස්ථාව ලැබෙනවාය කියන ටික මතක් කරමින්ද, මේ සංශෝධනය ඉදිරිපත් කිරීමේදී අදහස් කිහිපයක් ඔබතුමා අවංකව ඉදිරිපත් කිරීම ගැන ඔබතුමාට නැවත වරක් ප්‍රශංසා කරමින්ද මා නවතිනවා.

**කේ. ඩබ්ලිව්. දේවනායගම් මහතා (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා)**

*(திரு. கே. டபிள்யு. தேவநாயகம்—உள்நாட்டலுவல்கள் அமைச்சர்)*

(Mr. K. W. Devanayagam–Minister of Home Affairs)

Mr. Deputy Speaker, we are today debating some amendments to the Co-operative Societies Law No. 5 of 1972. When you look at that Law, one would think that the Co-operative Societies Law was enacted for the first time in 1972 because it embodies the principles under which a society should be registered and covers the entire gamut of rules governing the running of a society. But, Mr. Depty Speaker, the first law concerning co-operatives was enacted in 1936 and there were amendments thereafter in 1961 and 1964. On each occasion, the law was amended to suit the circumstances of the day and the varied ways of life so that the laws would be helpful in developing the societies.

The first laws were enacted in 1936 and laws were thereafter enacted in 1961 and 1964. In 1972 a new law was brought in which should have been an amendment of all these earlier laws. This new laws was enacted in 1972, during the 1970-77 regime. The laws were brought in during the time Mr. T. B. Illangaratne was Minister. The first section of the law enacted in 1972 was a copy of the original section of 1936 where it says :

"There may be appointed a Registrar of Co-operative Societies for Ceylon or any portion thereof and such number of Deputy or Assistant Registrars as may be necessary."

As you go on, you will see that a number of these sections had been copied into Law No. 5 of 1972. What I am trying to make out is that that law was supposed to have been enacted as though it was an original piece of legislation created for a special kind of society. In fact the co-operative movement is such a vast subject that it cannot be debated at length in such a short time.

As the Hon. Minister mentioned in the course of his speech, Sri Lanka was at one time looked upon as a model in respect of the running of co-operative societies. Great names like Soysa, Fernando, Weeraman, Perera have been associated with it, and a number of them have come and gone. They have been so experienced that some of them have been chosen to be Regional Directors for South East Asia. Rajaguru is there now.

At one time, co-operatives in this country were well developed on the correct principles of the co-operative movement. When I say 'correct' I mean correct in the sense of the real principles under which the Rochdale pioneers first established the co-operative movement. In 1970-71 the running of the co-operative societies in this country took a certain turn, one of the most important being in respect of the elective process in the movement. This was taken away and it became, not a people's movement as it had been, but a movement known as the Minister's movement. From that time the entire co-operative structure of the country took a completely different turn. The movement suffered a great deal by this retrograde step and many societies even broke down. They did not progress after that.

The Laidlaw Commission was appointed, and I must say with a certain amount of regret, that this commission was not suited to the needs of our people. They followed the British co-operative model. In Britain they have small societies. Every village there has a co-operative society and the greatest advantage in the movement was that you know all the members. The Rochdale pioneers were set up by 10 members or more who had a common purpose. They associated themselves for the economic betterment of that group. They established co-operative societies in villages where the entire village became a co-operative, where the members knew each other.

But laidlaw who headed the Commission came from Canada. The Canadian Co-operative movement is a large movement. They have big Societies where the members do not know each other, unfortunately for us that was accepted with modifications to some extent. I think one person who wrote a differing report was Mr. de Mel, that this pattern was not suited for our country. In fact, I also went before the Commission and objected to it. Because, according to today's system, there is no member participation in the large societies. The branch societies themselves have groups and each group selects delegates and they come to the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

main societies, and no member societies' members have any participation with the other members. This is the greatest drawback in the present set up, and I think the late Minister, Mr. S. B. Herath, tried to remedy these defects and organize a committee. That committee went into these matters very carefully and had sittings all over the Island, right from the North, the South and East and everybody's opinion was that we must go back to the system of the old societies, and the whole concept of it was that the real co-operative societies are the credit societies. Because of their close membership they knew each other and they had the ideal, the model of the Rochdale pioneer societies. So, this committee recommended that we should go back to the original concept and remodel them into societies that will have fuller member participation and thereafter bring in the real spirit of co-operation.

Sir, in those days we would say that there was better co-operative understanding, because as you would know the Co-operative Department was a closed department. There were officers who were educated right from the grass roots and they learnt their way right up to the top levels, and as such they were sort of dedicated officers who knew about the co-operative movement. As you say, the co-operative movement is a way of life and to fit into that concept, that idea, they had to bring into the departments people who were devoted and experienced in this co-operative way of life. So, I think now we have departed a little from that period. Because this kind of officer went about in the villages educating members, there was member education in those days. So that, it was actually a way of life that they wanted to introduce into the ordinary man's ordinary living. So from that period, from 1970 to 1977, there was a certain amount of corruption that has got into the co-operative movement, and from that time many efforts were made to stem that tide. I think already there have been many steps taken and today the amendment of this law is to prevent any further erosion of this co-operative movement, to make it run on correct principles.

Sir, the co-operative movement is a business concern. It is true that this is a kind of service, but the co-operative society is also a business concern. So, I do not think you would succeed unless you learn to conduct that organization in a business-like manner. Therefore, some of the measures here are calculated today with that idea. So that when you say in one chapter that you must have a budget that means that you should consider that organization like any other organization that deals with finance and prepare your expenditure. Similarly there are some steps taken to see that the co-operative society is regarded as a business concern and that you run it on business lines. That is why this provision is being introduced into the Law.

There is also the question of membership. The Hon. Minister has explained that you can deal with non-members. That means, you can open out the facilities of the co-operative movement even to those who are not members of a co-operative society.

Then, what I would consider as the most important matter is this : when a certain amount of corruption is discovered in a society, there is no method or mode to stop it. In the earlier Ordinance there has been a very laborious method of getting at the rogues. I think it is under section 46 and section 47 (1). If the Hon. Minister or Registrar, finds or suspects that there is something wrong in a society, he immediately gets his officers to inquire into it, and a preliminary report will be furnished to him within the quickest possible time. Then he will act. If the report discloses that there is something wrong, he will immdediately take steps to arrest it by dealing with the members of the society. This, in one way, will stop in time the amount of money that is misappropriated and also save the society itself from being completely ruined.

Therefore, some of these measures are taken in order to bring the co-operative movement and the co-operative societies to an honest way of dealing and also to see that no dishonest person takes liberties with a society or the finances of a society.

Sir, I do not intend to take a long time. The other measures are also calculated to discover corruption as early as possible, to summon books of account and various officers so that they may be available to the Department as early and as easily as possible in order to go into the entire working of a society.

Mr. Deputy Speaker, I conclude my speech by commending the amendments to the co-operative Societies Law which are calculated to make the existing societies free from the corruption that is now taking place. Thank you.

ප. භා. 5.35

**එම්. එස්. අමරසිරි මහතා (නියෝජ්‍ය වෙළඳ හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමා)**

*(திரு. எம். எஸ். அமரசிறி—வர்த்தக, கப்பற்றுறைப் பிரதி அமைச்சர்)*

(Mr. M. S. Amarasiri–Deputy Minister of Trade & Shipping)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත ගැන වචන ස්වල්පයක් කතා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. පසුගිය සති දෙක තුන ඇතුළත මේ රටේ භයානක තත්ත්වයක් ඇති වූ අවස්ථාවේ, සමුපකාර ව්‍යාපාරයේ නියුතු සමුපකාර සේවකයින්, සමුපකාරිකයින්, සමුපකාර කොමසාරිස්තුමා ඇතුළු සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, අමාත්‍යාංශයේ ලේකම්තුමා නියෝජ්‍ය ඇමතිතුමා හා සමුපකාර ඇමතිතුමා ආදීන්ගෙන් වූ සේවය අපි සාමාන්‍ය පාරිභෝගිකයින් හැටියට අගය කළ යුතුව තිබෙනවා; එතුමන්ලාට ප්‍රශංසා කළ යුතුව තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. එස්. අමරසිරි මහතා]

සමුපකාර සමිති ක්‍රියාත්මක වීමේදී ඒවායේ අරමුදල් ආරක්ෂා කර ගැනීමට සහාය වන සංශෝධන කිහිපයක් මෙම සංශෝධන පනතෙහි තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය ගැන දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කළා, ගරු ඇමතිතුමා. මෙය තුන්වන ලෝකයේ රටවලට අත්‍යවශ්‍ය ව්‍යාපාරයක්. සාමාජිකයින් අතර ආර්ථික දියුණුවක් ඇති කිරීමටත්, පාරිභෝගික සමුපකාර සමිති මගින් පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමටත්, ණය දෙන සමුපකාර සමිති මගින් සාමාජිකයින්ට ණය පහසුකම් සලසා දී ඔවුන්ට ආර්ථික සහනයක් ලබා දීමටත් විශේෂයෙන්ම ප්‍රයෝජනවත් වෙන ව්‍යාපාරයක්, මේ සමුපකාර ව්‍යාපාරය.

මේ ව්‍යාපාරය කිසිදක අපේ රටෙන් නැති කරන්නට බැහැ. එන්න එන්නම එය වැඩි වැඩියෙන් දියුණු තත්ත්වයකට පත් වෙනවා. අළුත් අළුත් ක්‍රම ඇති වෙනවා. අළුත් අළුත් අභියෝගයන්ට මුහුණ දීමට සිදු වෙනවා. සමුපකාර ව්‍යාපාරය අපේ රටේ පටන්ගත්තා කාලයේ, එනම් දැනට අවුරුදු 70 කට පමණ පෙර, අපේ රටේ ආර්ථිකයයේ, සමාජයේ තිබුණේ අද තිබෙන තත්ත්වය නොවෙයි. ඒ කාලයේ පටන් ගත්තේ සමුපකාර ණය දෙන සමිතියි. ඊට පසුව කෘෂිකාර්මික සමුපකාර සමිතිත්, ඉන් අනතුරුව සමුපකාර කර්මාන්ත සමිතිත්, ඇති වුණා. දෙවන ලෝක මහා යුද්ධය ආ වෙලාවෙ පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමට වෙනත් විධිමත් ක්‍රමයක් නොතිබුණු නිසා සමුපකාර කඩ සමිති—පාරිභෝගකික සමිති—පටන් ගත්තා.

ඒ අවස්ථාවේ ලංකාවේ සමුපකාර ව්‍යාපාරිකයන් රටේ පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමට ඉතාමත්ම උනන්දුවෙන් ක්‍රියා කිරීම නිසා සමුපකාර ව්‍යාපාරයේ අළුත් පරිච්ඡේදයක් ආරම්භ වුණා. ඒ අන්දමට පාරිභෝගික භාණ්ඩ ජනතාවට බෙදා හැරීමට සමුපකාර කඩ සමිති ඇති වුණා. මෙය ක්‍රම ක්‍රමයෙන් සංවිධානය වුණා. එසේ සංවිධානය වෙලා හැම ගමකම සමුපකාර සමිතියක්, එහෙම නැත්නම් සමුපකාර වෙළඳ හලක් ආරම්භ වුණා. එම සමිති සම්බන්ධ වුණා දිස්ත්‍රික් මට්ටමේ සංගම්වලට. ඊළඟට ජාතික මට්ටමේ මහා සංගම්වලට සම්බන්ධ වුණා. එහෙම සම්බන්ධ වෙලා ලංකාවේ පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීම එක් අංශයකිනුත්, කෘෂිකාර්මික සංවර්ධනය තවත් අංශයකිනුත්, ධීවර කාර්මික සංවර්ධනය තවත් අංශයකිනුත්, යනුවෙන් සමුපකාර කටයුතු ඇරඹුවා. ඒ අතරම ග්‍රාමීය බැංකු පටන් ගැනීමට පෙර තිබුණු ණය දෙන සමුපකාර සමිති ක්‍රමයක් සාර්ථකව පවත්වාගෙන යාමට අවස්ථාව ලැබුණා.

මෙසේ ක්‍රම ක්‍රමයෙන් දියුණු වේගන ආ සමුපකාර ව්‍යාපාරය 1958 දී අළුත් පියවරක් ඉදිරියට තැබුවා. අභාවප්‍රාප්ත පිලිප් ගුණවර්ධන ඇමතිතුමා විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමය පටන්ගත්තා. ඉන්දියාව, පාකිස්ථානය, ඩෙන්මාර්කය ආදී රටවල පැවති සමුපකාර සමිතිවල හොඳ අංශ අරගෙනයි එතුමා එද මේ රටේ විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමය ඇති කළේ. එතැන් සිට විවිධ සේවා සමුපකාර සමිති නොයෙක් විධියේ වැඩවලට අනගහා ක්‍රමයෙන් සිය ව්‍යාපාරික කටයුතු පුළුල් කළා. වැඩි කල් යන්නට පෙර මහජන සමුපකාර බැංකුව ඇති වුණා. ප්‍රාදේශීය සමුපකාර බැංකු ඇති වුණා. කලින් කථා කළ අපේ ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා මඩකලපු දිසාවේ දිස්ත්‍රික් බැංකුවේ සභාපතිවරයාව සිටියා. ඒ බැංකු මගින් සමුපකාර සමිතිවලට මුදල් ණයට දුන්නා. නමුත් ඒ සමුපකාර බැංකු 1961 න් පසුව මහජන බැංකුව බවට පත් කර එය රාජ්‍ය අංශය යටතට ගත්තා. එයින් සමුපකාර ව්‍යාපාරිකයින්ට එතෙක් තිබුණු ඒ අවස්ථාව නැතිව ගියා. එසේ වුවත් සමුපකාර ව්‍යාපාරිකයින් එයින් නොනැවතී තමන්ගේ ව්‍යාපාරික කටයුතු ක්‍රමයෙන් දියුණු කරගෙන ගියා. ඒ ව්‍යාපාරික කටයුතු තව තවත් පුළුල් වුණා.

එසේ පුළුල් වීගෙන එන අවස්ථාවේ තමයි 1972 අංක 5 දරණ සමුපකාර පනත සම්මත වුණේ. ඒ පනතින් සමුපකාර සමිතිවල තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපය නැති වී ගියා. එවකට සිටි සමුපකාර ඇමතිතුමා ඒ පනත සමග රෙගුලාසි මාලාවක් ඇති කළා. තිබුණු අතුරු ව්‍යවස්ථාවත් සංශෝධනය කළා. හැම සමුපකාර සමිතියකටම ආදර්ශ අතුරු ව්‍යවස්ථාවක් බැගින් දුන්නා.

සමුපකාර සමිති ප්‍රතිසංවිධානයත් සමගම පළාතේ දේශපාලන බලවතාගේ නියමය මත අධ්‍යක්ෂවරුන් පත් කළා. එතැන් සිට සමුපකාර ව්‍යාපාරය ඉතාමත් පහත් තත්ත්වයකට වැටුණා, ඒ කාලයේ පාලනය කළ අය 1972 පනතින් සමුපකාර ව්‍යාපාරය විනාශ වන තැනට පත් කළා. තමුන්නාන්සේ දන්නවා ඇති ඒ කාලයේදී සමුපකාර සමිතිවල වැඩ කෙරුණු ආකාරය. ඒ සමුපකාර සමිතිවලින් වතු පාලනය වුණා; ජනාවාස පාලනය වුණා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් වතු පාලනය කළා. විශාල වතු යායවල් පාලනය කළා; කර්මාන්ත පාලනය කළා. ඒ සියල්ලටම අත දෙන්නට ගහිල්ල මුළු ව්‍යාපාරයටම නැති වෙලා, සමුපකාර ව්‍යාපාරයේ වත්කම් රුපියල් සියක් කෝටියකට වැඩියෙන් නැති වෙලා ගියා. එහි කළමනාකරණය නැති වුණා. මුදල් කළමනාකරණය නැති වුණා. පළපුරුදු නිලධාරීන් ඒවායින් ඉවත් කළා. පළපුරුදු නැති අය ඒ තනතුරුවලට පත් කළා. ඒවායේ විනාශයක් ඒ මගින් ඇති වුණා. ඒ අවස්ථාවේදී සමුපකාර ව්‍යාපාරයෙන් සමුපකාර ව්‍යාපාරිකයන් ඉවත් වෙලා සිටියා.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) සමුපකාර සමිතිවල සාමාජිකත්වය සම්බන්ධයෙන් එතුමාගේ අදහස් ප්‍රකාශ කළා. ඒ කාලයේදී තමයි රුපියලේ සාමාජිකත්වය ඇති කළේ. ඊට කලින් ර. 50 හේ රු. 10 යේ කොටස් තිබුණේ. ඒ කොටස් වටිනාකම් නැති කරල රුපියලේ කොටස් මගින් ඕනෑම කෙනෙකුට සමුපකාරයේ සාමාජිකයෙක් වෙන්නට අවකාශ ලබා දුන්නා. එය බොහොම හොඳයි. නමුත් ඒ මගින් නුසුදුසු අය සමුපකාරයට ඇතුළු වෙලා, බලය අල්ලාගෙන ඒ මගින් සමුපකාර සමිති විනාශ කළා.

අද සමුපකාර ඇමතිතුමා විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා, ඒ කාලවල නැති වී ගිය මුදල් ආපසු අය කර ගැනීමට. මේ සම්බන්ධව කටයුතු කිරීමට එදා තිබුණු 1972 අංක 5 දරණ පනතේ තිබෙන බලතල මදි. ඒ නිසයි සමුපකාර ඇමතිතුමා මේ පනත සංශෝධනය කරන්නට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙන්නේ.

මෙය ඉතාමත් වැදගත් සංශෝධනයක්. මේ සංශෝධනය මගින් සමුපකාර සමිතිවල අද තිබෙන වාණිජ පදනම ආරක්ෂා වෙන විධියට, මහජන මුදල් ආරක්ෂා වෙන විධියට වැඩ පිළිවෙලක් සකස් වී තිබෙනවා. සංශෝධනයේ මුලින්ම තිබෙන්නේ සමුපකාර සමිතිවල බලය ලත් වෙළඳුන්ට සමුපකාර කොමසාරිස්තුමාගේ අනුමතිය ඇතිව ණය දෙන්නට පුළුවන් බවයි. ගරු කථානායකතුමනි, ඉස්සර සමුපකාර කඩ සමිතිවලට ණය දෙන්න බැහැ. රොච්ඩේල් පුරෝගාමීන් සමුපකාර සමිති ආරම්භ කළ අවස්ථාවේදී ණය දෙන සමුපකාර සමිති ක්‍රමයක් ඇති කළේ නැහැ. ජාත්‍යන්තර සමුපකාර ප්‍රතිපත්තිවලට ණය දෙන ක්‍රමය ඇතුළත් කර තිබුණේ නැහැ. නමුත් ලෝකයේ වාණිජ කටයුතු ව්‍යාප්ත වෙන්න වෙන්න සමුපකාර සමිතිත් වාණිජ කටයුතුවලට බැසීම නිසා, වෙළහෙළදාම නිසා සමුපකාර කටයුතුවලට ණය දීම ඉතාමත් අවශ්‍ය වුණා. දැන් මේ පනතින් බලය ලත් වෙළඳුන්නට සමුපකාර සමිතිවල ණය දීමෙන් ඒ අයට ඒ ව්‍යාපාර කටයුතු වැඩි කර ගන්න පුළුවන්.

පසුගිය කාලයේදී සමුපනකාර සමිති බොහොමයක්ම දුර්වල වුණා. විවෘත ආර්ථිකය නිසා සමුපකාර සමිතිවලට තරඟකාරී වෙළඳාමකට බහින්න සිදු වුණා. ඒ අතරම සමුපකාර සමිතිවලට ඉතාමත් අසීරු තත්ත්වයකින් වැඩ කරන්න සිදු වුණා. මෙයට රජය සම්බන්ධයි. මෙය සංවිධානාත්මක ව්‍යාපාරයක්. රටේ හදිසි තත්ත්වයක් ඇති වූ විට මහජනයාට අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ බෙදන්නට තිබෙන්නේ මේ ව්‍යාපාරය තුළින්. හැම ගමකම වෙළඳ සලක් තිබෙනවා. හැම නගරයකම විශාල වෙළඳ සල් පටන්ගෙන තිබෙනවා. මේ තුළින් පාරිභෝගික භාණ්ඩ සංවිධානාත්මකව බෙදා හැරීමට පුළුවන් දීර්ඝ කාලයක පළපුරුදු අය පමණයි ඒ සංවිධානයේ ඉන්නේ. ඒ නිසා සමුපකාර ව්‍යාපාරය අත් හැරීමට, සමුපකාර ව්‍යාපාරය අනවශ්‍යයයි කියන්නට කොයිම රජයකටවත් බැහැ. මෑතකදී සිදු වූ සිද්ධීන් උඩ හැමෝටම එය තේරුම් ගියා. පසුගිය දවස්වල කලබල තිබුණු අවස්ථාවේ, සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ සේවකයන් හා නිලධාරීන් උනන්දුවී වැඩ කළේ නැති නම්, ජනතාවට බඩගින්නේ ඉන්න සිදු වෙනවා. එවැනි අමාරු තත්ත්වවලදීද සමුපකාර ව්‍යාපාරය නිතරම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රජයට අත දුන්නා. හැමදාමත් ඒ තත්ත්වයි, පැවතුනේ. නමුත් එවැනි අවස්ථාවලදී නුසුදුසු පුද්ගලයන් මේවාට ඇතුළු වී සිටියාම රජයේ මුදල් නැතිනම් බැංකුවලින් දෙන මුදල් නාස්ති වෙනවා. ඒ වාගේම ඒවායේ පාලන කටයුතු ක්‍රමවත්ව නොකෙරෙන නිසා නාස්තිය ඇති වෙනවා.

මේ සංශෝධන පනතේ හොද වගන්තියක් තිබෙනවා. එනම්, අයවැය ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කිරීම සම්බන්ධවයි. දනට රාජ්‍ය සංස්ථා සම්බන්ධයෙන් මෙය ක්‍රියාත්මක වෙනවා. රාජ්‍ය සංස්ථාවක ව්‍යාපාරික කටයුතු පටන් ගන්නා ජනවාරි මාසයට මාස තුනකට පෙර, අයවැය ඇස්තමේන්තු පිළියෙළ කර භාණ්ඩාගාරයට, අදාළ අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්න ඕනෑ. මේ වගන්තිය අනුව ව්‍යාපාරික වර්ෂය පටන් ගන්නට මාසයකට පෙර අයවැය ඇස්තමේන්තු මහා සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්න ඕනෑ.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) වැරදියට වටහාගත් කාරණයක් තිබෙනවා. මෙම මහා සභාව, සියළුම සමුපකාර ප්‍රාදේශිකවලින් සිය දෙනෙකුගෙන් සමන්විත වෙනවා. ඒ සිය දෙනා තෝරන්නේ ප්‍රාදේශීය මට්ටමෙන්, ඒ අයගේ සාමාජිකයන්ගේ අනුපාතය අනුවයි. එම නිසා සියළුම ප්‍රාදේශික නියෝජනය වෙනවා, මහා සභාවට. මේ මහා සභාවල කටයුතු, 1972 පනතින්, ඒ කාලයෙ ඇති කළ අතුරු ව්‍යවස්ථාවල ක්‍රියාකාරී නියෝගවලින් තවමත් පවතිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එනකොට මෙම අයවැය ඇස්තමේන්තු, මහසභාවට ඉදිරිපත් කර එතැනින් අනුමත වෙන්න ඕනෑ. මොකද, ඒ ප්‍රදේශයේ සමුපකාර සමිතියේ අයිතිකාරයෝ මේ මහා සභාවයි. එම නිසා මහා සභාවට, අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කර එතැනින් අනුමැතිය ලබාගෙන ඒ ඇස්තමේන්තුවලට අදාලව වැඩ කරන්න ඕනෑ. මේක ඉතාමත්ම වැදගත් සංශෝධනයක්. මේ තුළින් සමුපකාර සමිතිවලට ඇතිවන පාඩු බොහෝ දුරට අඩුකර ගන්න පුළුවනි. මේ සංශෝධනයත් සමගම කොමසාරිස්තුමාගෙන් අප ඉල්ලා සිටිනවා මේ අයවැය ඇස්තමේන්තුවලට අදාලව ඒවායේ වැඩ කටයුතු කෙරෙනවාදැයි සොයා බලන ලෙස. ඒ සමිති භාරව සිටින පරීක්ෂකවරු, නැතිනම් උප කොමසාරිස්වරු අර අයවැය ඇස්තමේන්තුවලට අදාලව වැඩ කරනවාද කියා මාස තුනෙන් තුනට සමාලෝචනයක් කලොත් සියළුම සමුපකාර සමිති එහෙම නැතිනම් සමිතිවලින් සියයට හැත්තෑපහක් ලාභ ඇතුව පවත්වා ගෙන යන්නට පුළුවන් වෙනවාය කියා මා විශ්වාස කරනවා. [බාධාකිරීමක්] ඒක තමයි, මම කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඇමතිතුමාගේ කතාවේදී කිව්වා, අමුපකාර සමිතිවලින් සියයට 65 ක් පමණ පාඩු ඇතුව එහෙම නැතිනම් ලාභ නැතුව පවත්වා ගෙන යන දුර්වල තත්ත්වයේ ඒවා බව. නමුත් මේ සංශෝධනය අනුව අයවැය ඇස්තමේන්තු සකස් කර ඒවායේ වැඩ කටයුතු කර ගෙන ගියොත් ලාභ ඇතුව පවත්වා ගෙන යන්න පුළුවනි. අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී නිලධාරීන් කල්පනා කරන්න ඕනෑ, ඒ ආදායම ඇස්තමේන්තු කරන්න, වෙළදාම ඇස්තමේන්තු කරන්න. ඊළඟට සමුපකාර සමිතිවල වියදම්, පඩි නඩි, අතිකාල වියදම්, රථවාහන නඩත්තු, මුද්‍රණ වැඩ, ටෙලිෆෝන් ගාස්තු ඔය ආදී සැම වියදමක්ම එකතු කර අන්තිමේදී සුළු ලාභ පරතරයක් සාමාජිකයන්ටත් දෙන්න පුළුවන් වන විධියට අයවැය ඇස්තමේන්තු සකස් කර ගන්න. එසේ සකස් කර ගත්තොත් මේ සමුපකාර සමිති ලාභ ඇතුව ඉදිරියට පවත්වා ගෙන යන්න පුළුවනි. එය ඉතාම වැදගත් කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,සමුපකාර සමිති දුර්වල තත්ත්වයට පත්වන අවස්ථා තිබෙනවා. තොග වෙළදාම තිබෙන කොට, අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ බෙදා හරින කොට, ඇතැම් අවස්ථාවලදී මිල නියම කර තිබෙනවා. ඒ නියම මිලට විකුණන්න ඕනෑ. සමුපකාර සමිතිවලටත් නියම විධියට ඒ කටයුතු කරන්න වෙනවා. එතැනදී ඒ අයගෙ ලාභ පරතරය අඩු වෙනවා. පෞද්ගලික අංශයට තිබෙන වාසි සමුපකාරයට නොලැබී යනවා. පෞද්ගලික අංශයේ බොහෝ වෙළදසැල්වල බිල් කඩනවා නම් කඩන්නෙ ටිකයි. සමුපකාර සමිතිවල බිල් කඩන්න ඕනෑ. ගණන් පොත්වල හරියට ගණන් ලියන්න ඕනෑ. ඊළඟට මුදල් අයකිරීම් සම්බන්ධයෙන් රිසිට් කඩන්න ඕනෑ. ආදායම හා වියදම හරියට සටහන් කරන්න ඕනෑ. නමුත් පෞද්ගලික අංශයේ බොහෝ තැන්වල, සියයට හතලිහක් පමණ ස්ථානවල, ගණුදෙණු නියම විධියට ලියැවෙන්නේ නැහැ. අන්න ඒ අවාසිය නිසා සමුපකාර සමිතිවලට පාඩු වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අදහසක් තිබුණා, පිරිවැටුම් බද්දෙන්, සමුපකාර සමිතිවලට සහනයක් දෙන්න. මෙය ඉතාම වැදගත් අදහසක්. සමුපකාර සමිතිවලට පිරිවැටුම් බද්දෙන් සහනයක් දීමට ඇමතිතුමා උනන්දුවී කටයුතු කරයි කියා මම හිතනවා. එය ඉතාම ප්‍රයෝජනවත් වෙනවා, සමුපකාර සමිති ලාභ ඇතිව නැතහොත් පාඩු නැතිව පවත්වාගෙන යන්නට.

ඊළඟට තවත් කාරණයක් මා පෙන්නුම් කරන්නට කැමතියි. අයවැය ඇස්තමේන්තු සකස් කළාට මදි, මේවාට දැඩි පාලනයක් තිබෙන්නට ඕනෑ. අද වුණත් තිබෙන නීති රීති අනුව සමුපකාරවල මාසික වාර්තාවක් සකස් කරන්නට ඕනෑ. ඒ මාසික වාර්තා පරීක්ෂා කරන්නේ බොහොම ටිකයි. ඒවා හරියට පරීක්ෂා කරනවා නම් ඉහළ මට්ටමෙන් දිස්ත්‍රික් මට්ටමෙන් උප කොමසාරිස් මහත්වරු ඒවා පරීක්ෂා කරනවා නම් මේ පාඩු නුහක්දුරට අඩු කර ගන්නට පුළුවන් වෙනවා.

ඒ වාගේම වෙළද ව්‍යාපාර වුණාම බොහෝ විට අවුරුද්දක් ගත වන විට ඒවායේ අඩුපාඩුකම් ඇති වෙනවා. එවැනි අවස්ථාවලදී මෙම සංශෝධනය අනුව යළිත් සංශෝධිත ඇස්තමේන්තු ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබෙනවා. ඒ ගැන සමුපකාර සමිතිවලට මඟ පෙන්වීමක් කරන්නට කොමසාරිස්තුමාට ඉඩ ලැබෙනවා. එසේ කටයුතු කිරීමෙන් සමුපකාර සමිතිවල කළමනාකරණයට විශේෂ ප්‍රයෝජනයක් අත් වෙනවා.

ඒවාගේම වාර්ෂික අයවැය ලේඛනයක් මහා සභාවෙන් අනුමත කළාට පසු ඒ ආදායම සහ වියදම ඇතුළත සමිතිය ගෙන යන්නට ඕනෑ. එසේ නොකිරීමෙන් විනාශ වූ සමිති ගැන මට නිදර්ශන පෙන්නුම් කරන්නට පුළුවනි. අපේ කොළඹ දිසා ඇමතිතුමා මෙතැන ඉන්නවා. එතුමාගේ කොට්ඨාශයේ තිබුණු එක්තරා සමුපකාර සමිතියක් 1970-77 කාලයේ පාලනය කළා, එවකට හිටපු බොහොම ප්‍රබල පිරිසක්. ඇස්තමේන්තු හරිගැස්සුවා. ඇස්තමේන්තුව රුපියල් පත් ලක්ෂයක් නම් අට ලක්ෂයක් වියදම් කළා. තමන්ට ඕනෑ හැටියට වියදම් කළා. කිසිම පාලනයක් තිබුණේ නැහැ. එමනිසා ඇස්තමේන්තු හැදුවාට මදි. ඒවායේ පාලනයක් කෙරෙන්නට ඕනෑ. මා සදහන් කළ ඒ කොලොන්නාවේ සමුපකාර සමිතියේ ඇස්තමේන්තු හරිගස්සා තිබුණා, රුපියල් පත් ලක්ෂයකට. අට ලක්ෂයක් වියදම් කර තිබුණා. සාමාන්‍යාධිකාරී සහ සභාපති අතේ චෙක් පොත තිබුණා. බැංකු ණය සීමාව තිබුණා, රුපියල් දසලක්ෂය දක්වා. ඉතින් දසලක්ෂයක් දක්වාම චෙක්පත් ලියන්නට පුළුවනි. අන්තිමේදී සමිතිය බංකොලොත් වුණා. අයවැය ඇස්තමේන්තු පාලනයක් නොතිබුණු නිසා ඒ සමිතිය විනාශ වුණා. ඇස්තමේන්තුවලට වැඩියෙන් රුපියල් ලක්ෂ හතර හමාරක් වියදම් කොට තිබුණා. ඒක සම්පූර්ණයෙන්ම විනාශ වුණේ ඒක පාලනය කළ අයගේ වරද නිසයි. දැන් මේ සංශෝධන නිසා මින් ඉදිරියට සමුපකාර සමිතිවලට එවැනි අවස්ථාවලට මුහුණ දෙන්නට සිද්ධ වෙන්නේ නැහැ. ලංකාවේ සියලුම සමුපකාර සමිති සම්බන්ධයෙන් ඒ තත්ත්වය ඇති වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම කියනවා නම් පසුගිය ආණ්ඩුව කාලයේ—1970-77 කාලයේ—කොතැනකවත් සමුපකාර සමිතියක අයවැය ඇස්තමේන්තු හරියට සකස් කර තිබුණේ නැහැ. ඒවා සකස් කරන්නට අමාරු තත්ත්වයකුත් තිබුණා. වතු පවරා ගත්තා. නමුත් ඒවා ගැන පළපුරුද්දක් ඇති අය හිටියේ නැහැ. ඒ තත්ත්වය නිසා මේ රටේ සමුපකාර ව්‍යාපාරය තුළින් ඒ කාලයේ රුපියල් සියක් කෝටියකට වඩා පාඩු වුණා. මහජන දේපොළ විනාශ වුණා. ඒ සැම දෙයක්ම වුණේ වැරදි පාලනය නිසයි. මින් ඉදිරියට ඒවා ඇති වෙන්නේ නැහැ. මා කලින් කිවාක් මෙන් අයවැය ඇස්තමේන්තු සකස් කළාට මදි. ඒවා අධීක්ෂණය කරන්නට ඕනෑ. සමාලෝචනය කෙරන්නට ඕනෑ. නිසි ලෙස මුදල් පාලනය කෙරෙන්නට ඕනෑ. බැංකුවල මුදල් හරියාකාරව තැන්පත් කෙරෙන්නට ඕනෑ. ඒවා හරියට සොයා බලනවා නම් නියම විධියේ පාලනයක් ඇති කරන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. එස්. අමරසිරි මහතා]

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) සඳහන් කළා, ස්විඩන් රටේ සමුපකාර ව්‍යාපාරය ගැන. මා කියනවා අපේ රටේ සමුපකාර සේවකයන් සහ සමුපකාර නිලධාරීන් ස්විඩන් රටේ සමුපකාර නිලධාරීන්ට වඩා හොඳය කියා. අපේ රටේ උදවියට ඒ අයට වැඩිය දැනුම තේරුම තිබෙනවා. ඒ අයට වැඩිය මුදල් කළමනාකරණය පිළිබඳව දැනුම තිබෙනවා. අපි වෙන රටවලින් ආදර්ශ ගන්නට අවශ්‍යතාවයක් නැහැ. අපි මේ රටට ගැළපෙන විධියේ සමුපකාර ක්‍රමයක් හදා ගන්නට ඕනෑ. අපට වුවමනා කරන්නේ ඒකයි. මහරගම ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ස්ථානවල පුහුණුව ලැබූ කෙනෙකු හැටියට මා කියන්නේ මෙයයි. ඒ රටවල තිබෙන ක්‍රමයෙන් අපට ගන්නට තිබෙන්නේ බොහොම සුළු දෙයක් පමණයි. කොතැනක වුණත් සමුපකාර ක්‍රමයේ තිබිය යුතු වැදගත්ම දෙය තමයි, අවංකකම. අවංකකම නැත්නම් කොයි රටේ වුණත් සමුපකාරයෙන් වැඩක් නැහැ. අවංක මිනිසුන් අතින් මේවා පාලනය වෙන්නට ඕනෑ. අවංක මිනිසුන් මේ ව්‍යාපාරයට ඇතුළු වෙන්නට ඕනෑ. නිලධාරීන්ට අවංකව වැඩ කරන්නට ඉඩ දෙන්නට ඕනෑ. ඒ අයගේ පාලනය නිසි විධියට තියෙන්න ඕනෑ. බොහෝ විට දේශපාලන ඇඟිලිගැසීම්වලින් ඈත් වෙන්නත් ඕනෑ. 1970-77 කාලයේ සමුපකාර ව්‍යාපාරය තුළින් රුපියල් සියක් කෝටියක් විනාශ වුණේ දේශපාලන ඇඟිලිගැසීම් නිසයි.

මහරගම ගරු මන්ත්‍රීතුමාගේ කථාවේ තවත් අඩුපාඩුවක් තිබුණා. එතුමා කථා කළේ හරියට මේ ආණ්ඩුව කාලයේදී සමුපකාර ව්‍යාපාරය ගැන මොකවත්ම කළේ නැහැ කියන විධියටයි. එහෙම කථා කිරීම හොඳ නැහැ. එතුමාට මතක් වෙන්න ඕනෑ, 1970–77 කාලයේ සමුපකාර ව්‍යාපාරයේ වූ විනාශය ගැන. එදා සමුපකාර ආයතන රජය විසින්ම රාජ්‍ය ආයතන හැටියටයි පාලනය කළේ. ලංකාවේ එවකට හැම දිස්ත්‍රික්කයකම සමුපකාර සංගම් තිබුණා. සමුපකාර සංගම් 120කුත් සමුපකාර සමිති 8,000කුත් තිබුණා. ඒ සියල්ලම එකතු කර ප්‍රාදේශික කර 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනත යටතේ ප්‍රාදේශික මට්ටමේ ප්‍රාථමික සමිති 305 ක් ඇති කළා. එතෙන්දි තමයි, හමුපකාර කටයුතුවලින් සමුපකාරිකයෝ ඈත් කෙළේ. සමුපකාර ගැන ග්‍රාමීය මට්ටමෙන් දන්න අයගේ අදහස් ඇතුළත් කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ග්‍රාමීය මට්ටමේ හොඳ යෝජනා තිබෙනවාය කියා එතුමා කිව්වා. ඒක හරි. ඒ ග්‍රාමීය මට්ටමේ සමුපකාරිකයන්ගේ අදහස් මහ සභාවට එන්න ඕනෑ. ඒවා ආවාද 1970-77 කාලයේදී ? මොකවත් ආවෙ නැහැ. රජයේ නිලධාරීන්, එහෙම නැත්නම් මන්ත්‍රීවරුන්ගේ නියෝජිතයන් තමයි, අදහස් ඇතුළත් කෙළේ. ඒවා ඇතුළත් කළ විධිය තමුන්නාන්සේලා දන්නවා. එහි සභාපති මන්ත්‍රීවරයායි. මන්ත්‍රීවරයා සභාපති වෙලා ඒ කාලයේදී සමුපකාරවලට වෙච්ච විනාශය පිළිබඳ තත්ත්වය කොහොමද කිව්වොත් 1972 අංක 5 දරණ සමුපකාර පනතේ අංක 46 (1) දරණ වගන්තිය අනුව පරීක්ෂණ වාර්තා තවමත් සකස් කරගන්න බැරි වී තිබෙනවා.

මේ පනතේ තවත් හොඳ සංශෝධනයක් තිබෙනවා. එනම් සමුපකාර සමිතිවල පොත් පත් ගැනයි. ඒ කාලයේ සමුපකාර සමිතිවල පොත් පත් සොයාගන්න බැරි වුණා. එදා ඒ කාලයේ නොයෙක් සමුපකාර සමිති තිබුණා. වතු සමුපකාර සමිති තිබුණා ; ජනාවාස සමුපකාර තිබුණා ; එල්.ආර්.සී. සමුපකාර තිබුණා ; ධීවර සමුපකාර සමිති තිබුණා ; කර්මාන්ත සමුපකාර සමිති තිබුණා. ඒවායේ පොත් පත් ලිව්වෙත් නැහැ. සමහර ඒවායේ පොත් පත් තිබුණා, භාර දුන්නෙ නැහැ. නමුත් අද මේ සංශෝධන පනතින් සමුපකාර කොමසාරිස්තුමාට බලය ලැබෙනවා, වහාම ගිහින් ඒ පොත් පත් තමන්ගේ අත් අඩංගුවට අරගෙන ආරක්ෂිතව තබාගෙන ඒ පොත්පත්වල වැඩ කරන්න. ඒ කාලයේ ඒක තිබුණේ නැහැ. පොත්පත් ලිව්වෙත් නැහැ. දකුණු පළාතේ රුහුණු ප්‍රදේශයේ, සමුපකාර .සමිතියකට පොත් පත් පරීක්ෂා කරන්නට සමුපකාර පරීක්ෂක මහත්මයෙක් ගිය වෙලාවේ ඒ මනුෂ්‍යට ගහල එළෙව්වා. ඊට පස්සේ ඒ සමුපකාර සමිතියට කිසිම නිලධාරියෙක් ගියේ නැහැ. ඒ සමුපකාර සමිතිය බංකොලොත් වී රුපියල් හැට ලක්ෂයක් දක්වා ණය වුණා. [බාධාකිරීම්] සභාපති මන්ත්‍රීවරයෙක්. ඒ කාලයේ තිබුණේ එහෙමයි.

මම කනගාටු වෙනවා, මහරගම ගරු මන්ත්‍රීතුමා ඒවා එකක් ගැනවත් සඳහන් නොකිරීම ගැන. එතුමාගේ පියා මෙම සමුපකාර ඉතිහාසයේ රන් අකුරින් ලියාවෙන නමක් ඇති කරගත් කෙනෙක්. කෙසේවුවද සමුපකාර ව්‍යාපාරයට වුණ හානිය බොහෝ දුරට ගොඩගත්තේ අපේ අභාවප්‍රාප්ත එස්. බී. හේරත් ඇමතිතුමායි. එතුමා මේ සමුපකාර ව්‍යාපාරය දෙස බැලුවේ කොහොමද? එතුමාගේ හිතවතුන් හැටියට අප කීප දෙනෙක් එතුමාගේ උපදේශක කාරක සභාවේ හිටියා. එම උපදේශක සභාවලදී එතුමා කිව්වේ මොකක්ද? "මට ඕනෑ කරන්නේ හෙට ඉඳලා වැඩ කටයුතු හොඳට ගෙනයන්නයි ; පසුගිය ඒවා ගැන දෙවනුවට සොයමු !" කියායි. ඒ වචනය කිව්වේ ඉතාම වැදගත් විධියට. එතුමා සමුපකාර ව්‍යාපාරයේ ඒ නැති වී ගිය දේපළ සොයාගැනීම එක අංශයක් වශයෙනුත් ඉදිරි වැඩ කටයුතු කිරීම එක අංශයක් වශයෙනුත් කොටස් කරගෙනයි, වැඩ කරන්න පටන් ගත්තෙ. ඒ වැඩපිළිවෙළ අපේ අලුත් ඇමතිතුමාටත් කරගෙන යාමට එතුමාට අපේ සම්පූර්ණ සහයෝගය දක්වනවා.

මෙම පනතේ තවත් වැදගත් සංශෝධනයක් තිබෙනවා. එනම්, සමුපකාර සමිතියක් වැරදි කරන විටම ඒගැන පරීක්ෂණ පැවැත්වීමට අවස්ථාව සැලසීමයි. අද තිබෙන රෙගුලාසි යටතේ 1972 අංක 5 දරණ සමුපකාර පනතේ 46 (1) වගන්තිය අනුව පරීක්ෂණයක් කිරීමට අඩු ගණනේ මාස දෙක තුනක් ගත වෙනවා. සමුපකාර සමිතිවල ගනුදෙනු බහුල නිසා බොහෝ විට පොත්පත් ලියැවී නැහැ ; අය වැය ඇස්තමේන්තු නිසි පරිදි සකස් වී නැහැ. ඒ නිසා සමුපකාර ගිණුම් නිලධාරීන්ට පරීක්ෂණ පැවැත්වීමට බොහෝ කාලයක් ගත වෙනවා. එම නිසා ඒ ගැන පරීක්ෂණ පැවැත්වීමේදී කලින්ට වඩා විශාල පාඩුවක් සිදු වෙනවා. යම් පරීක්ෂණයක් පැවැත්වෙන විට ඒ අධ්‍යක්ෂ මණ්ඩලය දන්නවා, මෙන්න අපි දෙවිට දන්න තමයි පරීක්ෂණය යන්නෙ. දන් ඉතින් අපි මන්ත්‍රීවරයාත් නැති කර ආණ්ඩුවටත් අවනම්බු කර මේක විනාශ කර දමා යන්න ඕනෑය කියා විනාශකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න පටන් ගන්නවා.

ඒ නිසා අධ්‍යක්ෂ මණ්ඩලයට එසේ ගැළවෙන්න ඉඩ නොතබා මේ ගෙනෙන සංශෝධනයෙන් එවැනි අවස්ථාවකදී පැය 24 ක් ඇතුළත වහාම පරීක්ෂණයක් කර බැලූ බැල්මට වැරදි පාලනයක් කෙරෙනවා නම් වංචාවක් තිබෙනවා නම් දූෂණයක් තිබෙනවා නම් ඒ අධ්‍යක්ෂ මණ්ඩලය හය මාසයකට තහනම් කර තාවකාලික අධ්‍යක්ෂවරුන් කීප දෙනෙක් පත් කරන්නට කොමසාරිස්තුමාට බලය තිබෙනවා. එතකොට එසේ පත් වන නිලධාරීන්ට පුළුවන් වෙනවා, අර සමිතියේ කටයුතු යථා තත්ත්වයට පත් කර පවත්වාගෙන යන්න. එහෙම නැත්නම් මොකද වෙන්නෙ? චෙක්පොත තිබෙන නිසා සාමාන්‍යාධිකාරීත් සභාපතිත් එකතු වී බැංකු අයිරාව රුපියල් විසිපත් ලක්ෂයකට තිබෙනවා නම් ඒ මුළු මුදලටම චෙක්පත් ලියාගෙන ලියාගෙන යනවා. ඒවා ගැන 46 (1) යටතේ පරීක්ෂණ පවත්වා ඊළඟට චෝදනා පත්‍ර යවා ඒ චෝදනා පත්‍රවලට උත්තර දෙන්නට සුමාන දෙකක කාලයක් අවස්ථාව දීලා එතකින් පිළිතුරු ලැබුණාට පසුව මහා සභාවක් පවත්වා කොමසාරිස්වරයා විසින් ඒ මහා සභාවට කියන්න ඕනෑ. "මෙන්න මේ වැරදි කර තිබෙනවා ඒ නිසා අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කරනවා" කියා. ඒ ටික සිදු වෙන්නට මාස 4 ක් හෝ 6 ක් ගත වෙනවා. අන්න ඒ කාලපරිච්ඡේදය, සමිතිය විනාශය කරා යන ඒ කාලපරිච්ඡේදය, නැති කර එවැනි දේවල් වළක්වා එක සතියකින් කටයුතු කරන්නට මේ සංශෝධන පනතින් සමුපකාර කොමසාරිස්තුමාට බලය පැවරෙනවා.

මෙය ඉතාම වැදගත් අවස්ථාවක් වෙනවා. හේතුව මෙයයි. අද සමුපකාර සමිතිවල තිබෙන්නේ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ණයට ගත් මුදල්. එසේ නැත්නම් සමුපකාර අරමුදලින් දුන් මුදල්. අන්න ඒ නිසා ඒ මුදල් ආරක්ෂාවීම මේ සංශෝධන පනතින් සිදු වෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධන පනත ඉතාම වැදගත් වෙනවා. මේ සංශෝධන පනත නිසා ණය දීමෙන් වැඩිපුර වෙළඳාමක් ඇති කර ගන්නට සමුපකාර සමිතිවලට පුළුවන් වෙනවා. අද තිබෙන්නේ වාණිජ ලෝකයක්. ව්‍යාපාරිකයින් කවුරුත් වගේ ණය ගනුදෙනු කරනවා. එය කරන්නට ඕනෑ. සමුපකාර සමිතිවලටත් ණය ගනුදෙනු කරන්නට සිදු වෙනවා. එසේ ණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගනුදෙනු කලොත් පිරිවැටුම වැඩි වෙනවා. වෙළඳාම වැඩි වෙනවා. වෙළඳාම වැඩි වෙන්න වැඩි වෙන්න ලාභ පරතරය කුඩා වුවත් සීමිත වුවත් ඒ සමිතියට වැඩිපුර ලාභයක් ඇති වෙනවා. ඒ නිසා ඒ සමිතිවල තඩත්තුව ගෙන යාමට එයත් ප්‍රයෝජනවත් වෙනවා.

ඊළඟට විශේෂයෙන්ම සමුපකාර සමිතිවල කළමනාකරණ කටයුතු ගැන කියන්න ඕනෑ. සමුපකාර සමිතිවල කළමනාකරණ කටයුතු ගැන කියන්න ඕනෑ. සමුපකර සමිතිවල කළමනාකරණ කටයුතු අද ඉතාම දුර්වල තත්ත්වයකයි තිබෙන්නේ. ඒ ගැන සමුපකාර දෙපාර්තමේන්තුවට හෝ ඒ සමිතිවලට දෙස් කියන්න අපට බැහැ. මොකද, ඒ සේවකයින්ට ගෙවන්නේ ඉතාම අඩු පඩියක්. සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ තිබෙන වැටුප් ක්‍රමයවත් නොගෙවන සමිති තිබෙනවා, ඒවායේ ආදායම් තත්ත්වය දුර්වල නිසා. ගෙවීමට මුදල් ඒ සමුපකාර සමිතිවලට නැති නිසා වැටුප් ගෙවීමේ දුෂ්කරතාවයක් තිබෙනවා. එමෙන්ම 1970-77 කාලයේ වැඩිපුර බඳවා ගත් සේවකයින් තවමත් සිටිනවා. ඒ නිසා ඇති වූ සේවක අතිරික්තයක් තිබෙන නිසාත් සමුපකාර සමිතිවල දුෂ්කරතාවයක් තිබෙනවා. සමුපකාර සේවකයින්ගේ අනාගත දියුණුවක් ඒ අයට පෙනෙන්නට තිබෙන්න ඕනෑ. ඔවුන්ට යම්කිසි විධියක වැටුප් වැඩිවීමක් නැත්නම් ආදායම වැඩි වීමක්, බෝනස් ක්‍රමයකින් හෝ යම් දීමනාවක්, ලැබෙනවා නම් ඒ අය මීට වඩා කාර්යක්ෂම සේවයක් කිරීමට ඉදිරිපත් වෙනවා.

පසුගිය දවස්වල සමුපකාර සේවය අත්‍යවශ්‍ය සේවයක් කළා. ඒ අය ඒ දවස්වල දිවා රෑ වැඩ කළා. එහෙත් ඒ අයට ගෙවන්නේ කලින් ගෙවූ දීමනාව පමණයි. අන්න ඒ නිසා ඒ අහිංසක සමුපකාර සේවකයින් ගැන විශේෂ සැලකිල්ලක් ඉදිරි කාලයේදී ඇති කළ යුතුයි කියා මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please. The time is 6.05 p.m. The Hon. Minister is anxious to finish this debate today. There are about eight more speakers. I would like each speaker to take about five minutes.

**එම්. එස්. අමරසිරි මහතා**
*(திரு. எம். எஸ். அமரசிறி)*
(Mr. M. S. Amarasiri)

මේ අවස්ථාවේදී මම කණගාටු වෙනවා. තමුන්නාන්සේගේ කාලය වැඩිපුර ගන්නා නම්. මා ඇමතිතුමාට ඉදිරිපත් කළේ සමුපකාර ව්‍යාපාරයට ප්‍රයෝජනවත් අදහස්. මේ අදහස් උපදේශක කාරක සංශෝධන පනතින් ඉදිරි කාලයේදී සමුපකාර සමිතිවල ආරක්ෂාව මීට වඩා වැඩිපුර ඇති වන බව මතක් කරමින් හා මෙම සංශෝධන මීට වඩා වැඩිපුර ඇති වන බව මතක් කරමින් හා මෙම සංශෝධන පනත කවුරුත් ඒකමතිකව පිළිගන්නා හැටියට ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)**
*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*
(Mr. Sarath Muttetuwegama–Kalawana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ දැන් මොහොතකට කලින් කිව්වා මේ පනත අදම සම්මත කර අවසාන කරන්නට ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා කියා. ඒ නිසා මම බොහොම කෙටියෙන් අදහස් කීපයක් පමණක් මේ සභාවට ඉදිරිපත් කරන්නයි බලාපොරොත්තු වන්නේ.

සමුපකාර ව්‍යාපාරය දෙස නොයෙක් විධියට නොයෙක් ආකල්ප ඇතිව බලන්න පුළුවන්. එය සාර්ථක ජයග්‍රහණ ලැබූ ව්‍යාපාරයක් හැටියට කෙනෙකුට පෙනෙන්නට පුළුවන්. තවත් කෙනෙකුට එය පරාජයෙන් පරාජය ලැබූ ව්‍යාපාරයක් හැටියට පෙනෙන්නට පුළුවන්. කෙනෙකුට එය වාණිජ ආයතනයක් හැටියට පෙනෙන්නට පුළුවන්. තවත් කෙනෙකුට එය සේවාවක් කරන ව්‍යාපාරයක් හැටියට පමණක්ම පෙනෙන්නට පුළුවනි. තවත් කෙනෙකුට සමහර විට එය හොරුන්ගෙන් පිරිච්ච ව්‍යාපාරයක් හැටයට පෙනෙන්නට පුළුවනි. තවත් කෙනකුගේ අත්දැකීමේ හැටියට එය අවංක සේවයක් කරන උදවිය ගණනාවක් සිටින ව්‍යාපාරයක් හැටියට පෙනෙන්නට පුළුවනි. මේ අනුව, සමුපකාර ව්‍යාපාරය ඉතාම සංකීර්ණ ව්‍යාපාරයක් බව අපට පේනවා. පැති කීපයකින් යුක්ත ව්‍යාපාරයක්. මෙවැනි ව්‍යාපාරයක් පිළිබඳව කෙටියෙන් කතා කරන්නටවත් මෙහි තිබෙන්නාවූ අපහසුතාවත් හදිසියෙන් මැඩපවත්වන්නවත් පුළුවන් නොවන බව ගරු ඇමතිතුමා මෙන්ම මේ ගරු සභාවේ කවුරුත් පිළිගන්නා දෙයක්.

ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා කී කාරණයක් පිළිබඳව මම හිතන හැටියට මේ රටේ සමුපකාර ව්‍යාපාරය පවතින නෙක් විවාදයක් තියෙන්න පුළුවන්. ලේඩ්ලෝ කොමිෂන් සභාවේ නිර්දේශ අනුව, ප්‍රංචි සමුපකාර සමිති වෙනුවට විශාල විවිධ සේවා සමුපකාර සමිතිත්, ඒවායේ ප්‍රාදේශික හැටියට ගම්වල තිබුණු ආයතනත් පත්කිරීම වැරදිද, නිවැරදිද යන කාරණය මම හිතන හැටියට තවම තක්සේරු කළ නොහැකි කරණක් වී තිබනවා. මගේ පෞද්ගලික මතයක් ඇමතිතුමාගේ අදහසට සමානයි. විවිධ සේවා සමුපකාර සමිති මට්ටමෙන් ප්‍රාදේශික ඇති කිරීම නිසා සමුපකාර ව්‍යාපාරය තුළ තිබුණු මහජන සහභාගිත්වය අඩු වී තිබෙන බවයි මගේ විශ්වාසය. ඒ නිසා මේ පිළිබඳව තව ටිකක් සොයා බලා කටයුතු කළ යුතුයි.

මෙවැනි ව්‍යාපාරයක නොයෙක් අත්දැකීම් තිබෙනවා. ඒවායින් අපට පාඩම් ඉගෙන ගන්නට පුළුවනි. ඒ අත්දැකීම් පාවිච්චි කර, යම් තැනක වැරදි සිදුවී තිබෙනවා නම් ඒ පිළිබඳව කරුණු සොයා බලා ඒවා නිවැරදිකර ගැනීමට අපට පුළුවන් වෙනවා.

සමුපකාර සංගම්වලට ඡන්දයෙන් තෝරන ලද අධ්‍යක්ෂ මණ්ඩල වෙනුවට මන්ත්‍රීවරයාගේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම සඳහා 1971-72 කාලයේදී ගෙනා සංශෝධනය ගැන රජයේ මන්ත්‍රීවරුන් ගණනාවක්ම කරුණු කිව්වා. ඒ සමහර කරුණු පිළිබඳව මමත් එකඟ වෙනවා. මම එදා රජයේ මන්ත්‍රීවරයෙකු හැටයට සිටි කාලයේදී මගේ ඡන්ද කොට්ඨාශයේ සමුපකාර සංගමයේ සභාපති හැටියට හැම අවුරුද්දේම පත් වුණේ මහා සභාවේ ඡන්දයෙන් පළමුවැනියාට ආ එක්කෙනායි. මහා සභාවේ විශ්වාසය තිබුණු එක්කෙනායි. අධ්‍යක්ෂ මණ්ඩල ඡන්දයෙන් පත් නොකර, පිටස්තරයන් සමුපකාරය උඩට ගෙනැවිත් දැමීම ගැන මම එකඟ නැහැ. නමුත් මේ ගැන කතා කළ මන්ත්‍රීවරුන්ගෙන් මම එක ප්‍රශ්නයක් අහන්නට කැමතියි. තමුන්නාන්සේලා සියලු දෙනාම ඡන්දයෙන් තෝරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල හොඳයයි කියන අතර, සමහර ප්‍රදේශවල, සමහර සමිති ඡන්දයෙන් පත් වුණාට පස්සේ සිදු වුණු යම් යම් දේවල් පිළිබඳව තමුන්නාන්සේලා සියලුදෙනාටම හරි වාර්තා ලැබී තිබෙනවාද? නිදර්ශනයක් වශයෙන් රත්නපුරයේ විවිධ සේවා සමුපකාර සමිතිය පෙන්නා දෙන්න මම කැමතියි.

ඒ සමිතියේ, පවත්නා වර්ෂයට නිලධාරීන් තෝරාන්න ගිය අවස්ථාවේදී එය දෙසැරයක් කරන්නට සිදු වුණා. එක සැරයක් නියෝජිතයන් ඇවිත් අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා ප්‍රතිඵල කියන්නට යන විට, එහි කඩා වැදුණු යම් පිරිසකට පළුවන් වුණා, ඒ ඡන්ද පත්‍රිකා උදුරාගෙන එම ඡන්දය නිෂ්ප්‍රභ කරන්නට. එය දැන් කවුරුත් දන්නවා. දැන් නැවත වරක් ඒ ඡන්දය තියන්නට ඕනෑ ඒවාගේ සිදුවීම් තවත් සිදු වී තිබෙනවා. ඡන්දයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තේරීම හොඳ බව පිළිගන්නා තමුන්නාන්සේලා—හැම මන්ත්‍රීවරයාම—ඡන්දයෙන් තෝරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගන්නත් ඉගෙන ගන්නා නම් වඩාත් සතුටුදායකයි.

මම වැඩිපුර කතා නොකරන බව කලින්ම කිව්වා. මම පෙන්වන්න බලාපොරොත්තු වන්නේ එක පැත්තක් පමණයි. එනම්, සේවකයන්ගේ තත්ත්වයයි. අද සමුපකාරයේ පැතිරී ගිය සියලුම ප්‍රාදේශික දෙස බලන විට, ඒවායේ වැඩ කරන සේවකයන් දහස් ගණනක් සිටින බව පෙනෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවේගම මහතා]

මොකක්ද අද තිබෙන තත්ත්වය ? පසුගිය කාලය තුළ වැඩිවුණු පඩි වැඩිවීම් අද මෙම සමුපකාර සමිති කීයකින් කීයක සේවකයින්ටද ලැබී තිබෙන්නේ කියා මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි. අයවැය ලේඛණයෙන් ගරු මුදල් ඇමතිතුමා අවුරුද්දෙන් අවුරුද්ද වැඩි කරන පඩි බොහෝ සමුපකාර සමිතිවල සේවකයින්ට ලැබෙන්නේ නැහැ. සමුපකාර සේවයේ සිටිනවා නම් අද බොහෝ දෙනෙක් ඔහුට කියන්නේ " මිනිහා හොරා " කියලයි. බලන්න ඔහුගේ තත්ත්වය. සමහර සමුපකාර ප්‍රාදේශිකවල විශාල පිරිවැටුමක් අතපත ගාන මිනිහා ඩී එම් මැනේජර්. විශේෂයෙන් දහස් ගණන් මිළ මුදලක් ඔහු අතින් එහා මෙහා වෙනවා. ඔහුට පඩිය වශයෙන් ලැබෙන්නේ කීයද? අවංකත්වය දේශනා පවත්වාම ලබා ගන්නට බැහැ. දේශන දීමෙන් අවංකත්වය ලැබෙන්නේ නැහැ. මිනිහෙකුට ජීවත්වන්නට පුළුවන් පඩියක් තිබෙන්නට ඕනැ. විශේෂයෙන් විශාල මිළ මුදලක් අතපත ගාන උදවියට ජීවත් වන්නට පඩියක් නැත්නම්, රජයෙන් අනුමත කරන පඩි වැඩිවීම් ලැබෙන්නේ නැත්නම් අප මෙහි ඉඳගෙන ඔහු අවංක විය යුතුයයි කිව්වාට ඒ කටයුත්ත ඒ විදියට කෙරෙන්නේ නැහැ. මම ඒ අය හොරුය කියනවා නොවෙයි. සමහර තැන්වල එසේ වෙනවා නම් ඒ වරදේ සුල මුල සොයනවා නම්, ඒ පැත්තක් විකක් කල්පනා කරන්නයි මා කියනවා.

ගරු මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) සඳහන් කළ එක් කාරණයක් නම්, සමුපකාර සේවකයින්ගේ අනාගතය කුමක්ද යන්නයි. සේවය පටන් ගත් දා සිට සේවය අවසාන වන ද දක්වා මැනේජර් නම් මැනේජර්. වෙළඳ සේවක නම් වෙළඳ සේවක. කොපමණ අවංක වුවත් කොපමණ දක්ෂ වුවත් ඔවුන්ට ලැබෙන වැඩිම වරප්‍රසාදය පංතියකට යන්නට ලැබීම පමණයි. දිස්ත්‍රික් මට්ටමෙන් තිබෙන අර 6 මාසයක පංතියට යාමට ලැබීම පමණයි. ඒ හැර මොකක්ද තිබෙන තත්ත්වය ? අන්න එම නිසා සමුපකාර සේවකයන්ගේ පැත්තෙන් බලන විට ඔවුන්ට ලැබෙන වරප්‍රසාද පඩි නඩි සේවා කොන්දේසි තිවාඩු මේ සියල්ලම ජනතා ව්‍යාපාරයකට සුදුසු ආකාරයකට, අඩු වශයෙන් පෞද්ගලික අංශයේ යම් යම් ව්‍යාපාරවල සේවකයන්ට ලැබෙන වරප්‍රසාදවලට සමාන තත්ත්වයකට පත් කරන තෙක් මේ ව්‍යාපාරයට නියම විදියට සේවක පිරිසක් ඇති කර ගන්න අමාරු බව අප මතක තබා ගත යුතුයි.

තව එක කාරණයයි මම කියන්න බලාපොරොත්තු වන්නේ. හිටපු සමුපකාර ඇමතිතුමාගේ කාලයේ—මේ ගරු ඇමතිතුමා මේ කටයුත්ත භාර ගන්නට පෙර—සමුපකාර සේවකයන් එක් එක්කෙනාගේ ප්‍රශ්න ගණනාවක් මෙම ගරු සභාවේ න්‍යාය පත්‍රයේ මගේ නමන් ඇතුළත් කර තිබෙනවා. ඒ සියළුම ප්‍රශ්න එක කාරණයකටයි සම්බන්ධ වුණේ. එනම්, සමුපකාර සේවක කොමිෂන් සභාවටයි. මේ තරම් අවසනාවන්ත. මේ තරම් අදක්ෂ මේ තරම් සේවයක් නොකරන ආයතනයක් සොයා ගන්න අමාරු යයි මම හිතනවා. පුදුම දෙයක් මෙය. මට කතන්දර ඕනැ තරම් කියන්න පුළුවන්. මම ඒවා කියන්නේ නැහැ. මන්ද? මම ඒවා ඇහෙන් දුටු දේවල් නොවෙයි. මට අහන්න ලැබුණු කථායි. එමනිසා, මෙම ගරු සභාවේ වරප්‍රසාද පාවිච්චි කර මම ඒවා කියන්නෙ නැහැ. නමුත් මේ ගරු සභාවේ මන්ත්‍රීවරු අවංකව කියනවා නම්, ඒ කොමිෂන් සභාවේ නිසරු බව ගැන කාටත් අත්දැකීම් ඇති. එම නිසා අළුතෙන් මෙම කටයුත්ත භාර ගෙන මේ සමුපකාර කොමිෂන් සභාව ගැන සොයා බලන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එයින් වැඩක් වනවාදැයි සොයා බලන්න. එම කොමිෂන් සභාව කුමන විදියකින් හෝ නවීකරණය කරන්න. කුමක් හෝ දෙයක් කරන්න. මම කියන්නේ පුද්ගලයන් ගැන නොවෙයි. පුද්ගලයන් ගැනත් ප්‍රශ්න තිබෙන්නට පුළුවන්. පුද්ගලයන්ගේ ප්‍රශ්න පමණක් නොවෙයි. මුළු ව්‍යුහයම වෙනස් කරන්නට සිද්ධ වෙනවා. එසේ නැත්නම් තමුන්නාන්සේට කිසි දිනක සේවයට කැමති, අවංක සේවක පිරිසකගේ සහභාගිත්වය ඇති කරගන්නට ලැබෙන්නේ නැහැ. මීට වඩා තමුන්නාන්සේගේ කාලය ගත කරන්නට මම බලාපොරොත්තු වන්නේ නැහැ.

**ජී. වී. එස්. ද සිල්වා මහතා (හබරාදූව)**
***(திரு. ஜீ. வீ. எஸ். த சில்வா—ஹபராதுவ)***
**(Mr. G. V. S. de Silva-Habaraduwa)**

මෙම වැදගත් සංවිධානය ගැන වචන ස්වල්පයක් මට කථා කිරීමට අවස්ථාවක් ලබාදීම ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ජන ජීවිතයට ඉතාම කිට්ටු පමණක් නොව ඉතාම ප්‍රයෝජනවත් ව්‍යාපාරයක් තමයි සමුපකාර ව්‍යාපාරය. ඒ නිසා අපේ පැරණි නායකවරුන් පිරිසිදු චේතනාවකින් යුක්තව, බොහොම බලාපොරොත්තු ඇතිව, මහජනයාට සේවය කරන්න ඕනැය කියන පරම චේතනාව ඇතිවයි මෙම සමුපකාර ව්‍යාපාරය පටන් ගත්තෙ. නමුත් අපේ නියෝජ්‍ය වෙළඳ ඇමතිතුමා මතක් කළ පරිදි 1972 දී මෙම ව්‍යාපාරයට දේශපාලනය ඇතුළු වුණා. ඒ කාලයේදී මෙම ව්‍යාපාරයට දේශපාලනය ඇතුළුවීම නිසා ක්‍රම ක්‍රමයෙන් මෙම ව්‍යාපාරය ඉතාමත් පහත් තත්ත්වයකට වැටෙන්න පටන් ගත් ආකාරය මට මතකයි.

1977 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත් වූ පසු ජනාවාස කොමිෂන් සභාවට අයිති වතු කීපයක්ම පාලය කරන්නට මට අවස්ථාවක් ලැබුණා. මම ඒ වත්තට ගිය අවස්ථාවේදී සමුපකාර සමිතියක ගොවි පළක් මම දක්කා. එම ගොවිපළේ සභාපති වශයෙන් කටයුතු කළේ එවකට සිටි මන්ත්‍රීවරයායි. එම සභාපතිතුමාගේ නියෝග පරිදි ඔහුගේ හිතවතුන් කීප දෙනෙක් ඒ වත්තේ කටයුතු කිරීම සඳහා පත් කර තිබුණා. පුදුම විධියේ පහත වැටීමක් ඇති වී තිබුණා. එද තිබුණ ඒ දූෂණ නොතිබුණා නම් අවුරුදු සියයකටවත් ඒ තරම් පහත වැටීමක් ඇතිවේවිය කියා මට කියන්න බැහැ. ඒ නිසා ඒ කාල සීමාවේදී ඒ විධියට කටයුතු සිදුවුණත් ඉදිරි අනාගතයේදී එවැනි තත්ත්වයක් ඇති නොවන සේ කටයුතු කළ යුතුව තිබෙනවා.

මෙවැනි සංශෝධනයක් ඉදිරිපත් කිරීම ගැන අපි ගරු ඇමතිතුමාට ප්‍රශංසා කරන්න ඕනැ. ඉතාමත් කාලෝචිත සංශෝධන කීපයක් ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙනවා. මන්ද? පසුගිය කාල සීමාවේදී අපට පෙනුණු කාරණයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා මතක් කළ පරිදි අපේ සමුපකාර ව්‍යාපාරය නිසා පසුගිය කාල සීමාවේදී මහජනතාවට කෑම බෙද දෙන්නට බොහොම පහසුකමක් සැලසුණා. නමුත් 1972 දී පටන් ගත්ත දේශපාලන බලපෑම් තවමත් සමුපකාර ව්‍යාපාරය තුළ තිබෙන බව අපට පෙනී ගියා. කොයි තරම් මහන්සි ගත්තත් ඒ බලපෑම්, ඒ උවදුර නැති කරන්න අමාරුයි. ඉතාම සියුම් විධියට තවමත් ඒවා බලපවත්වනවා. මගේ ආසනය තුළ තිබෙන සමුපකාර ව්‍යාපාරවලට මම ගිහින් බැලුවා. මෙවැනි හදිසි අවස්ථාවක මහජනයාට කෑම බෙද දෙන්න ඕනැය කියන බලාපොරොත්තුවකින්, සූදානමකින් ඔවුන් සිටින බවක් මට පෙණුනේ නැහැ. හේතුව මොකක්ද? කෑම බෙදීම හරියට නොකළොත් නරක නාමය ලැබෙන්නෙ රජයට බව ඔවුන් දැන ගත්තා. එහි පාඩුව එන්නේත් රජයට බව ඔවුන් දැනගත්තා. රජයට තමයි මහජනයා දෝෂාරෝපණය කරන්නෙ. අන්න ඒ නිසා මා මතක් කරන්න ඕනැ, අපේ ගරු ඇමතිතුමාගේ මේ සංශෝධන ඉතාමත් කාලෝචිත බව. හැම සමුපාකාරයකටම වගේ අපි ගිහින් කිව්වා, "මෙය මහජනයාගේ ව්‍යාපාරයක්, අපි කවුරුත් එකතුවී වැඩ කරන්න ඕනැ" කියා. සමහර අය කිව්වා "වාහන නැහැ" කියා. වාහන තිබෙන අයත් වාහන නැතැයි කියන්න පටන් ගත්තා. හේතුව අර තිබෙන දේශපාලන බලපෑමයි. දේශපාලන බලපෑම් ඉතාම සියුම් අන්දමින් රජයට විරුද්ධව කටයුතු කරනවා.

මම කියන්න කැමතියි, මට භාර වුණ එක් වත්තක් ගැන. එම වත්තේ තත්ත්වය කොයි තරම් පහත් තත්ත්වයකට වැටී තිබුණත් එහි සුපිරින්ටෙන්ඩන්ට් හැටියට පත් කර සිටියේ එම වත්තේ සිටි මුරකරුවායි. ඔන්න ඔය විධියේ ඉතාමත්ම අවාසනාවන්ත සිද්ධීන් තවමත් තිබෙනවා. ඒ නිසා එවැනි දේවල් ගැන වහාම පරීක්ෂා කර බලන්න කියා මම ගරු ඇමතිතුමාට මතක් කරන්න ඕනැ.

අපේ ආහාර දෙපාර්තමේන්තුවේ ආහාර කොමසාරිස්වරුන්ට විශෙෂයෙන්ම මා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වන්න ඕනැ. මේ හදිසි අවස්ථාවේදී අවශ්‍ය කටයුතු කරන්න ඒ මහත්ම මහත්මීන් බොහොම මහන්සි වුණා. ගාල්ලේ ආහාර කොමසාරිස්තුමිය ගැන විශෙෂයෙන්ම ප්‍රශංසා මුඛයෙන් කතා කරන්න ඕනැ. ඒ ගුණවර්ධන මහත්මිය කාන්තාවක් වුණත් උදේ, හවස හැම නිස්සෙම එහාට මෙහාට යමින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආහාර බෙද දීමට කටයුතු කළ ආකාරය ගැන ප්‍රශංසා මුඛයෙන් කතා කරන්න ඕනෑ. එතුමිය ඒ අවස්ථාවේදී කටයුතු කළ ආකාරය ගැන මේ ගරු සභාවේදී මතක් කරන්න ඕනෑ. එය විශේෂයෙන්ම මතක් කළ යුතු කාරණයක්ය කියා මා සිතනවා. ඒ මහත්මිය ඒ විධියට මහන්සි ගත්තේ නැත්නම් අපට නොයෙක් විධියේ අඩුපාඩුකම් සිදු වෙන්න ඉඩ තිබුණා. ඒ මහත්මිය ඒ විධියට කටයුතු කළ නිසා අතික් සමුපකාර සමිතිවල මහත්ම මහත්මීනුත් උනන්දුවක් අරගෙන කටයුතු කරන්න පටන් ගත්තා.

ඒ වගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා මතක් කළ විධියට හැම මාස තුනක් ඇතුළතදීම සමුපකාර කොමසාරිස්වරුන් විසින් අයවැය ඇස්තමේන්තු පරීක්ෂා කිරීම ඉතාම වැදගත් යයි මා සිතනවා. ඒ විධියට පරීක්ෂා නොකළොත් සමහර විට නොයෙක් විධියේ වැරදි ක්‍රියා කෙරෙන්න පුළුවන්. අපේ ආසනවල නොයෙක් නොයෙක් අවස්ථාවලදී එවැනි තත්ත්වයන් ඇති වී තිබෙන බව අපට පෙනී ගොස් තිබෙනවා. සමුපකාර සේවකයන් පත් කරන්නෙත් සභාපතිතුමාට වුවමනා කරන විධියටයි. ඒ නිසා ඒ ආකාරයට සේවකයන් පත් කරන්න ඉඩ දෙන්න එපා. එසේ ඉඩ දුන්නොත් සභාපතිතුමාට වුවමනා විධියටයි, ඒ පත් කිරීම් කරන්නෙ. මම දන්නවා මගේ ආසනය ඇතුළත වුණ සිද්ධියක්. භූමිතෙල් (බාධාකිරීම්) රුපියල් 38,000කට තට්ටු කර ඒ මහත්මයා පැනලා ගියා. කරන්න දෙයක් නැහැ. ඒ මොකද කීවොත් සභාපති මහත්මයයි, එයාව පත් කරල තිබ්බෙ. අපට කිසි දෙයක් කරන්න විධියක් නැහැ. ඒ මිනිහා අල්ලා ගන්න විධියකුත් නැහැ. කොහේ ගියාද දන්නේ නැහැ. සභාපති මහත්මයත් දැන් පැනල ගිහින්. අන්න ඒ විධියේ තත්ත්වයකුයි, දැන් උද වී තිබෙන්නේ.

අවසාන වශයෙන්, ඉතාමත් පිරිසිදු චේතනාවකින් පටන් ගත් මේ සමුපකාර ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා, එහි ප්‍රගතිය සඳහා ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට හැම දෙනාගේම ප්‍රශංසාව හිමි වේවායි ප්‍රාර්ථනා කරමින් මම නවතිනවා.

අ. භා. 6.21

**අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)**
***(திரு. அமரசிறி தொடங்கொட—பத்தேகம)***
**(Mr. Amarasiri Dodangoda–Baddegama)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර පනතට ඉදිරිපත් කර තිබෙන මෙම සංශෝධන පිළිබඳව කරුණු කීපයක් ඉතා කෙටියෙන් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තුවෙනවා. රටේ සිවිල් නීතියටවත්, අපරාධ නීතියටවත් නොවැටුණු සමුපකාර වංචනිකයන් නැත්නම් සමුපකාරවල මුදල් අයථා ලෙස පරිහරණය කරන්නන් ඒ ක්ෂේත්‍ර තුළට ගැනීම සඳහා ගරු ඇමතිතුමා මේ සංශෝධන ඉදිරිපත් කිරීම අපි අගය කරනවා.

ඒ වගේම, මේ සංශෝධන සම්බන්ධයෙන් වැදගත් විය හැකි අදහස් කීපයක් මම තමුන්නාන්සේට ඉදිරිපත් කරනවා. ගිණුම් සහ සංවර්ධන යනුවෙන් කොටස් දෙකකින් යුතුවයි, සමුපකාර දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන්නේ. නමුත් අද ඒ සංවර්ධන අංශයේත් මුළු කාලයම පරීක්ෂණ කටයුතු සඳහා යොදවන්නයි, සිදු වී තිබෙන්නේ. එම නිසා සමුපකාර සංවර්ධන කටයුතු සෑහෙන ප්‍රමාණයක් අතපසු වී තිබෙනවා. මෙම සංශෝධන තුළින් සමුපකාර සංවර්ධන කටයුතු ඒ සංවර්ධන අංශයට පවරා විනය සහ ඒ පිළිබඳ පරීක්ෂණ කටයුතු සඳහා වෙනම අංශයක් පිහිටුවනවා නම් හොඳයි කියන එකයි, මගේ අදහස.

එසේම සමුපකාර සමිති අරමුදලක් මඟින් සමුපකාරයන් විදේශවලින් බඩු ආයාත කිරීමේ කටයුත්තට යොදවා, පෞද්ගලික අංශයට වඩා අඩු මුදලකට පාරිභෝගිකයන්ට බඩු සැපයීමේ අවස්ථාවක් උදා කරනවා නම් එයත් ඉතා වැදගත් දෙයක් හැටියට මම සලකනවා.

ඒ සමඟම කිව යුතු තවත් කාරණාවක් තිබෙනවා. සමුපකාර සමිති රැසක් පසුගිය කාල සීමාව තුළ ඈවර කරනු ලැබුවා. නමුත් ඒ ඈවර කිරීම්වලට මුහුණ දුන් සමිතිවල සේවක පිරිස්වල ප්‍රශ්න සහ සාමාජිකයන්ගේ ප්‍රශ්නත් පිළිබඳව සැලකිලිමත් වන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. එම නිසා ඒ ඈවර කිරීම් වලින් පස්සේ, එම සේවකයන්ගේ සහ සාමාජිකයන්ගේත් ප්‍රශ්න අතපසු වීමක්, නොසලකා හැරීමක් සිදු වුණා. ඒ පිළිබඳ වගකීම, ඈවර කරනු ලැබූ සමිතිවල අධ්‍යක්ෂවරුන්ට පැවරීම පිළිබඳව මම අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි.

අනෙක් කාරණය, මෙයයි: සමුපකාර සමිතිවල කටයුතු පිළිබඳව පරීක්ෂා කිරීමට තීරක තීන්දු ඉදිරිපත් කර තිබෙනවා. මේ සංශෝධන තුළින්, ඒ තීරක තීන්දු ක්‍රියාත්මක වීමේ අපහසුකම්වලටත් යම් පිළියමක් අපට පෙනෙනවා. නමුත් ඒවා ඉක්මනින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කමත් මම විශේෂයෙන් මතක් කරනවා. මේ සම්බන්ධයෙන් එක නිදර්ශනයක් ඉදිරිපත් කරන්නම්. බද්දේගම කුඩා තේ වතු හිමියන්ගේ සමුපකාර සමිතියේ පසුගිය අධ්‍යක්ෂ මණ්ඩලය රුපියල් ලක්ෂ හයකට ආසන්න මුදලකට වගකිව යුතුව තිබෙනවා. මේ වන විට වසර දෙකක්ම ඉක්ම ගොස් ඇතත් ඉන් රුපියල් ලක්ෂ තුනක පමණ මුදලක් පිළිබඳව පමණයි, තීන්දුවක් ඉදිරිපත් කර තිබෙන්නේ.

මේ අවස්ථාවේදී මම බලාපොරොත්තු වෙනවා, ඉහළ ලේල්වල සමුපකාර සමිතියේ වාර්තාවක්, 46(1) පරීක්ෂණයේ අදාළ කොටසක් සමඟ සභාගත* කරන්න. ඒ විධියට 46(1) පරීක්ෂණයෙන් වැරදිකරුවන් හැටියට තීරණය වුණු අධ්‍යක්ෂ මණ්ඩලයක් දැන් නැවතත් යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂවරුන් වශයෙන් තේරී පත් වී කටයුතු කරනවා. සමුපකාර වැනි පොදු ආයතනවල ක්‍රියාමාර්ගවලට බලපාන මෙන්න මේවාගේ සිද්ධි කීපයක් තුළින් මේ සංශෝධනවලට තවත් අදහසක් දක්වන අතර තවත් විශේෂ අදහසක් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නට කැමතියි. සමුපකාර සමිති මූලික වශයෙන් පාරිභෝගික පිරිස් අතර බෙදා හරින ප්‍රධාන ද්‍රව්‍යය හැටියට හාල් හඳුන්වන්නට පුළුවනි. සමුපකාර සමිති කීපයක් හාල් බෙදා හැරීමේ කර්තව්‍යය සම්බන්ධයෙන් අද සාර්ථකත්වයක් පෙන්නා තිබෙනවා. වැඩි මුදලක් වැය කර හාල් පිළියෙළ කිරීම සඳහා වී මෝලක් හැම සමුපකාර සමිතියකටම පවත්වාගෙන යන්නට පුළුවන්කම තිබෙනවා නම් විශාල වශයෙන් ලාභ ඉපයීමක් කරන්නට හැකි වෙනවා. අද සමුපකාර සමිති කීපයක් මේ අතින් සාර්ථකත්වය ලබා තිබෙනවා. ඒ අදහසත් තමුන්නාන්සේ ඉදිරියේ මම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරනවා.

ඒවාගේම සමුපකාර සේවක කොමිසම දෙනු ලැබූ තීන්දු සමුපකාර සමිති විසින් ක්‍රියාත්මක කිරීම අතපසු කිරීමේ හේතුවෙන් අද එම කොමිසම මුළු සේවක සංහතියේම අප්‍රසාදයට ලක් වී තිබෙනවා.ඒ වෙනුවට සමුපකාර සේවක කොමිසම හමුවට යන සේවකයන්ට කාර්මික අධිකරණය ඉදිරියට යාමේ ඉඩ ප්‍රස්තාව සලසා දෙනවා නම් සේවක පරිස්වලට මීට වඩා සහනයක් ලැබෙන බව අදහසක් හැටියට ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

* සභා මේසය මත තබන ලද ලියවිල්ල:
*சபாபீடத்து வைக்கப்பட்ட பத்திரம் :*
*Document tabled :*

**සීමාසහිත ඉහළ ලේල්වල විවිධ සේවා සමුපකාර සමිතිය**

ලි. ප. අංකය : ජී 1838
ලි. ප. දිනය : 1971.4.3.

ප්‍රධාන කාර්‍යාලය සහ ගබඩා,
ඉහළ ලේල්වල, වදුරඹ.
1983.07.29 ද.

ගරු ආහාර හා සමුපකාර ඇමතිතුමා,
ආහාර හා සමුපකාර අමාත්‍යාංශය,
කොළඹ

ගරු ඇමතිතුමනි,

**රු. 643917.29 ක විනාශයක් සිදු කරවීම—අතීත තොරතුරු හා 46/1 පරීක්ෂණය**

සජීවී විවිධ සේවා සමුපකාර සමිතිවලින් කිහිපයක් හැර ඉතා වැඩිම ප්‍රමාණයක් වාර්ෂිකව ලක්ෂ ගණනින් පාඩු ලබන ආයතන බව දනටමත් ඔබතුමා අවබෝධ කරගෙන ඇතැයි මම සිතමි. එහෙත් ඒවා පාඩු ලබා ඇත්තේත්, ඉදිරියට එසේ පාඩු ලබන්නේ අකාර්යක්ෂමතාවය හා විෂය පිළිබඳ අඩු අවබෝධය නිසා බව මම තරයේම කියා සිටිමි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දෙඩන්ගොඩ මහතා]

සී/ස. ඉහළ ලේල්වල විවිධ සේවා සමුපකාර සමිතිය ගාල්ල ස. සං. උප කොමසාරිස් වරයාගේ බල ප්‍රදේශයට අයත් කුඩා සමිතියකි. එම සමිතියේ ගණන් පරීක්ෂණයට භාජනය වූ පසුගිය (ග්‍රාමීය බැංකුව හැර දෙවර්ෂය තුළ අතිකුත් අංශවල ශුද්ධ පාඩුව මෙසේය :

| | |
|---|---|
| 1981.06.30 දිනට | රු. 1,87,766.88 |
| 1982.06.30 දිනට | රු. 1,96,837.38 |

ගණන් පරීක්ෂණයට භාජනය වූ පසුගිය හය වසර තුළදී කළමනාකරුවන් විසින් ඇතිකරන ලද වෙළඳ බඩු අඩුවීම්වල මුළු වටිනාකම මෙසේය :

| | |
|---|---|
| 1977.06.30 දිනට | රු. 69,769.48 |
| 1978.06.30 දිනට | රු. 1,03,702.28 |
| 1979.06.30 දිනට | රු. 1,24,754.56 |
| 1980.06.30 දිනට | රු. 2,08,901.00 |
| 1981.06.30 දිනට | රු. 3,53,902.98 |
| 1982.06.30 දිනට | රු. 2,93,960.67 |
| 1983.03.31, දිනට | රු. 2,69,313.03 |

(83 සංඛ්‍යා කාර්යාලීය සටහන්වලට අනුවය.)

ගරු ඇමතිතුමනි, පසුගිය දෙවසර තුල පාඩුව සහ 83.03.31 දිනට වෙළඳ බඩු අඩුවීම්වල වටිනාකම එකතු කළ විට ගත වූ පාලන සමය තුළදී කෙලින්ම රු. 643917.29 ක් සමිතියට අහිමි වී ඇති බව පෙන්වාදිය හැක. විධිමත් මුදල් භාවිතය විධිමත් නොවීම නිසා සිදු වී ඇති මෙම පාඩුවට වගකිව යුත්තෝ කවරහුද ඇත්ත වශයෙන්ම අද සී/ස. ඉහළ ලේල්වල විවිධ සේවා සමුපකාර සමිතියේ මුළු ක්‍රියාකාරීත්වයම පවතින්නේ බද්දේගම මහජන බැංකු ශාඛාවෙන් ලබා දී ඇති රුපියල් ලක්ෂ 4 ක අයිරාවක් මතය.

එමෙන්ම පසුගිය මාසය සඳහා පමණක් සියලු ආකාරයේ වැටුප් සඳහා රු. 52080.65 ක මුදලක් වැය වූ බව මෙහිදී අප අමතක කළ යුතු නොවේ. මෙවැනි තත්ත්වයක් යටතේ සමිතිය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සාමාජික ඡන්දයෙන් පත් වී ඇති අප නව අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇති වගකීම කෙබඳුද යන්න ඔබතුමාට වැටහෙනු ඇතැයි කල්පනා කරමි.

හිටපු ගරු ආහාර හා සමුපකාර ඇමතිතුමා මෑතක සිට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ගැන දැරූ ආකල්පය මම පෞද්ගලිකව දනිමි. එනම්, එය සංවර්ධන දෙපාර්තමේන්තුවකට වඩා පරීක්ෂණ දෙපාර්තමේන්තුවක් බවට පත් වී තිබේ යනුවෙනි. ඇත්ත වශයෙන්ම පරීක්ෂණ කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එහෙත් හිටපු ඇමතිතුමා දැරූ මතය හා අප එකඟ වන්නේ එතුමා ඊටත් වඩා පළල් අරුතක් ඇතිව එසේ කල්පනා කළ හෙයිනි.

ඇත්ත වශයෙන්ම අප නව අධ්‍යක්ෂ මණ්ඩලය 1983.04.20 වැනි දින නව පදවිවල වැඩ බාර ගත්තේ සමිතිය වැටී ඇති ප්‍රපාතයෙන් ගොඩ ගැනීමටය. ඒ සඳහා පාරිභෝගික අංශයට දක්වන උනන්දුව මෙන්ම වෙනත් සංවර්ධන අංශ කෙරෙහිද අවධානය යොමු කිරීමට වැඩ පිළිවෙලක් යෙදුවෙමු. සමිතියේ කාරක නියෝග වැනි කියාත්මක නීතිවලට අපගේ සංවර්ධන ප්‍රතිපත්ති ඇතුළු කළෙමු. (අප දන්නා තරමින් අප අවට සමිති තවම එවැනි පියවරක් ගෙන නැත). 13 (1) ඉ. කෘෂිකර්මය සහ සත්ව පාලනය ; ඊ. කුඩා කර්මාන්ත, ග්‍රාමීය කර්මාන්ත හා අත්කම් අංශය ; උ. මහා පරිමානයේ නිෂ්පාදන සහ සංවර්ධන අංශය.

පවත්නා ව්‍යාපාරික අංශවලට අමතර ප්‍රතිපත්තියක් වශයෙන් ඉහත දැක්වෙන අංශ ඇතුළු කලේ ප්‍රදේශයේ පාරිභෝගිකයින්ගේ නිෂ්පාදන මිළදී ගැනීම, ඔවුන් දිරිමත් කිරීම පමණක් නොව සමිතිය විසින් කෙලින්ම ඒවා ඇරඹීමද සඳහාය. දැනටමත් මහා පරිමානයේ වී මෝලක් ආරම්භ කිරීමට මහ සභාවේ අනුමැතිය ලබාගෙන ඇත්තෙමු මින් ප්‍රදේශයේ රැකියා වියුක්තියද බෙහෙවින් අඩු කරලීම අපගේ අරමුණය.

ගරු ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම අප බලයට පත්වී මාස 2 ක් ඇතුලත ඔබතුමාගේ අමාත්‍යාංශයේ උවමනාවට අපට එදිරිව 1972 අංක 5 දරණ සමුපකාර පනත යටතේවූ 46/1 පරීක්ෂණයක් පැවැත්වීමට පියවර ගෙන ඇත. අප හොඳින්ම දන්නා තරමින් අපට එල්ල වන අභියෝගයක් නැත. අභියෝගය එල්ල වන්නේ අපට නොව බලයෙන් පහ වී ඇති අධ්‍යක්ෂ මණ්ඩලයටය. එහෙත් ප්‍රශ්නය වන්නේ එම පරීක්ෂණය පැවැත්වීමට සැලසුම් කලේ කෙලින්ම අපට විරුද්ධ වීමය. හිටපු ගරු ඇමතිතුමා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පරීක්ෂණ දෙපාර්තමේන්තුවක් බවට පත් වී ඇති බව කල් ඇතිවම ප්‍රකාශ කලේ මෙන්න මෙවැනි අවස්ථා ගැන සලකා බලාගෙන බව මම ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

සීමාසහිත ඉහළ ලේල්වල විවිධ සේවා සමුපකාර සමිතියේ ගත වූ පස් වසර තුළ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය කෙලින්ම එ. ජා පක්ෂය නියෝජනය කළවුන්ය. අප කණ්ඩායම ප්‍රපාතයට වැටී ඇති සමිතිය ගොඩ ගැනීම සඳහා බලය ලබා ගත් මධ්‍යස්ථ කණ්ඩායමකි. අපට අවශ්‍යව ඇත්තේ සමුපකාරිකයන් හැටියට ක්‍රියා කරමින් ආයතනය ගොඩ ගැනීමට විනා, වෙනත් අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට නොවේ.

ගරු ඇමතිතුමනි, අප දැනට ක්‍රියාත්මක වී ඇති ආකාරය අනුව ඉදිරි හය මාසය තුළදී හැකිතාක් වෙළඳ බඩු අඩුවීම් අය කර ගන්නා විට අප අධ්‍යක්ෂ මණ්ඩලය බෙහෙවින්ම වංචනිකයින්ට හා සමුපකාර හොරුන්ටත්, හොරුන් ආරක්ෂා කරන්නවුන්ටත් අප්‍රිය විය හැක.

පොදු ආයතනය ගැන කැක්කුමක් නැති නමින් පමණක් පෙනී සිටින ඇතැම් විට ඔබතුමාගේම පක්ෂයට සම්බන්ධ අවස්ථාවාදී නායකයන් අපට එරෙහිව ඉමහත් සටනක් දියත් කිරීමට ඉඩ තිබේ. දැනටමත් ආරම්භ කර ඇති එවැනි සටනක ප්‍රතිඵලයක් ලෙස අපට එරෙහිව ක්‍රියාත්මක කර ඇති 46/1 පරීක්ෂණය පෙන්වා දිය හැක. මේවා කොහොම උනත් අප අරමුණු කර ගත් මගෙහිම ඉදිරි වර්ෂය තුළදී ගමන් කිරීමට ඉටාගෙන සිටින බවත් දැනුම් දීමට කැමති අතර, අප පිළිගන්නා වැදගත් නායකයෙක් හැටියට අනාගතයේදී ඔබතුමාට අප ඉදිරිපත් කරන කරුණු කෙරෙහිත් කාරුණිකව අවධානය යොමු කරවන මෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි.

මෙයට-විශ්වාස,

(අත්සන) බන්දුපාල ගුරුගේ

සභාපති.

පිටපත් :

1. ගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති උතුමාණෝ-ඔබතුමාගේ කාරුණික අවධානය පිණිස.
2. ගරු බද්දේගම මහජන මන්ත්‍රී අමරසිරි දෙඩන්ගොඩ මහතා, මෙම කරුණු සම්බන්ධයෙන් සොයා බලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.
3. ලේකම්, සමුපකාර හා ආහාර අමාත්‍යංශය, ඔබතුමාගේ දැ. පි.
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් තුමා, ඔබතුමාගේ අවධානය සඳහාය.
5. ස. සං. උප කොමසාරිස් තුමා, දැ. පි.

අ. භා. 6.27

**ජේ. එල්.සිරිසේන මහතා (සමාජ සේවා නියෝජ්‍ය ඇමතිතුමා)**

*(திரு. ஜே. எல். சிறிசேன—சமூக சேவைகள் பிரதி அமைச்சர்)*

**(Mr. J. L. Sirisena–Deputy Minister of Social Services)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර සමිති සංශෝධන පනත පිළිබඳව වචන ස්වල්පයක් කතා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. කිව යුතු කරුණු රාශියක්ම වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් කියවුණු නිසාත් කාල වේලාව ඉක්ම ගොස් ඇති නිසාත් මගේ කතාව පුළුවන් තරම් කෙටි කරන්නට බලාපොරොත්තු වෙනවා. මම හිතන විධියට සමුපකාරය මේ රටේ ජනතාවට ජන්මයෙන්ම අයිති වුණු දෙයක්. නීතියක් නොතිබුණත් මේ රටේ ජනතාව අවුරුදු දෙදහස් පන් සියයක් පමණ කල් ජීවත් වී තිබෙන්නේ සමුපකාර මට්ටමිනුයි. සමුපකාර සමිතියක් හැටියට නීතියක් යටතේ මුලින්ම ක්‍රියාත්මක වුණේ 1911 දීයි. ඒ ණය දෙන සමුපකාර පනත යටතේයි. ඊට පසුව 1942 දී, දෙවැනි ලෝක සංග්‍රාම කාලයේදී සමුපකාර කඩ සමිති ඇති වුණා. අද ඒවා සමුපකාර ප්‍රාදේශික හැටියට හැඳින්වෙනවා. එදා ඒ අවස්ථාවේදී මේ කඩ විශාල සේවාවක් මහජනතාවට ඉටු කළා. මේ අවස්ථාවේදීත් පසුගිය සති දෙක තුන තුළදී සමුපකාරය ඉලිප්පිලා පෙනුණා. එවැනි අවස්ථාවකයි, අපි මේ සමුපකාර සංශෝධන පනත ගැන සාකච්ඡා කරන්නේ.

ගරු ඇමතිතුමා මේ සංශෝධන පනතින් ඉතාම වැදගත් සංශෝධන කීපයක් ඉදිරිපත් කර තිබෙනවා. සමුපකාරයක් අයවැය ලැයිස්තුවක් ඇතිව වැඩ කරන්නට ඕනෑ බව එයින් විශේෂයි. එවැනි ඉතාම වැදගත් කරුණු කීපයක්ම මේ සංශෝධන පනතින් ඉදිරිපත් වී තිබෙනවා. එහෙම ඉදිරිපත් වී තිබුණත් අඩුපාඩුත් එකක් දෙකක් පෙනෙන්නට තිබෙනවා. මේ සමුපකාර ව්‍යාපාරය සියයට සියයක්ම මහජනයා අතින්ම කෙරෙන ව්‍යාපාරයක් නොවෙයි. මෙයට රජයත් සම්බන්ධයි. එම නිසයි අද මේ සංශෝධන පනතක් ඉදිරිපත් වී තිබෙන්නේ. එහෙම නම්, සමුපකාර ව්‍යාපාරය සාර්ථක වන්නට නම් රජය පැත්තෙනුත්, මහජනයා පැත්තෙනුත් යන දෙපැත්තෙන්ම මේ කටයුත්ත හරියට කෙරෙන්නට ඕනෑ. එහෙම නැත්නම් සමුපකාරය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වෙයි කියා අපට හිතන්නට බැහැ. මේ රටේ සාමාන්‍ය දුප්පත් ජනතාවගේ ආර්ථිකය සමුපකාරය තුළින් දියුණු කරන්නට අපට පුළුවන් වන්නට ඕනෑ. ඒකට හොඳටම අවස්ථාව තිබෙනවා. විවිධ සේවා සමුපකාර ක්‍රමය මේ රටේ පටන් ගත්තේ අභාවප්‍රාප්ත පිලිප් ගුණවර්ධන ඇමතිතුමායි. එතුමායි මේ රටට විප්ලවය ගෙනාවේ. එතුමා මේ රටට විප්ලවය ගෙනාවේ සමුපකාර ව්‍යාපාරය තුළින් ආරථිකයේ විප්ලවයක් ඇති කරන අදහසින් වන්නට ඕනෑ. නමුත් ඒ කාර්යය හරියාකාර ඉෂ්ට කරන්නට බැරි වුණා. එතුමාගෙනුත් එද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුංචි වරදක් සිදු වුණා. එනම්, එදා කෙලින්ම කොටස රු. 50 කළා. එදා රු. 50 ක් කියන එක ටිකක් ලොකු මුදලක්. ඒ නිසා සාමාන්‍ය මහජනයා ටිකින් ටික සමුපකාරයෙන් ඈත්වන්නට වුණා. නමුත් කොහොම හරි විවිධ සේවා සමුපකාර සමිති මගින් අපේ රටේ ආර්ථිකය දියුණු කරන්නට පුළුවන්.

අපි මේ විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමය හාල් ටිකක්, පිටි ටිකක්, සීනි ටිකක් බෙදන්නට පමණක් සීමා කර තිබෙන්නේ ඇයි ? මෙය වෙනත් අංශවලටත් ව්‍යාප්ත කරන්නට අපට බැරි ඇයි ? එය කරන්නට අපට හොඳට පුළුවන්කම තියෙන්නට ඕනෑ. අද ග්‍රාමීය බැංකුවල විශාල වශයෙන් සල්ලි එකතු වෙනවා. ඒ සල්ලි පාලනය කරන්නේ මහජන බැංකුව මගින්. නමුත් සමුපකාර සංගමයකට මුදලක් ලබා ගන්නට ඕනෑ වූ විටක මහජන බැංකුවෙන් ඒ සඳහා ලැබෙන ආධාරය, සහයෝගය ඉතාමත් අඩුයි. මහජන බැංකුව පටන් ගත්තේ සමුපකාර බැංකුවල තිබුණු සල්ලි ටික එකතු කරගෙනයි. අද මහජන බැංකුවට ඒ බව මතක නැහැ. මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට මෑතක සිට සමුපකාර මහ සංගමයෙනුත් නියෝජිතයකු- යවන්නට ඉදිරිපත් වී තිබීම ගැන අපි සංතෝෂ වෙන්නට ඕනෑ.

රජය පැත්තෙනුත් අඩුපාඩුකම් තිබෙනවා කියා මා කීවේ ඇයි ? විශේෂයෙන්ම 1972 දී පළාතේ මන්ත්‍රීතුමා සමුපකාර සමිතියේ සභාපති වුණා ; එහෙම නැත්නම් ඒ මන්ත්‍රීතුමාගේ හිතවතෙක් එහි සභාපති වුණා. 1972 වර්ෂයේ අවසාන භාගය වන විට මේ රටේ තිබුණු වතු විශාල ප්‍රමාණයක් සමුපකාරයේ පාලනයට යටත් වුණා. එසේ යටත් කරගෙන ඒවායේ පාලනය කරගෙන ගිය අන්දම ගැන අද අපි කල්පනා කළොත් එය කණගාටුදායකයි. ගරු නියෝජ්‍ය වෙළඳ හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමාත් සමුපකාර කාරක සභාවක සභාපති කෙනෙක් වශයෙන් ක්‍රියා කළ කෙනෙක්. එතුමා ප්‍රකාශ කළා, සියක් කෝටියක පමණ මුදලකට වගකිවයුතු කෙනෙක් නැහැ කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මෙතනයි රජයේ දුර්වලකම තියෙන්නේ. හැම සමුපකාර සංගමයක්ම පාලනය කරන්නට, ඒ සඳහා මග පෙන්වන්නට පළමුවන ශ්‍රේණියේ සමුපකාර පරීක්ෂකවරයකු— Grade I Inspector කෙනෙක්—ඉන්නවා ; සමුපකාර සහකාර කොමසාරිස්තුමකුත් ඉන්නවා. එහෙම නම් මේ වතු පාලනය කරන අවස්ථාවේදී, ඒ පොත් පත්, ඒ ගිණුම් මිණුම් හරියට තියෙන්නට ඕනෑ කියා උපදෙස් දී තිබෙනවාද ? එසේ උපදෙස් දුන්නා නම්, ඒ උපදෙස් හරියට ක්‍රියාත්මක කළාද ? නොකළා නම් ඒ අවස්ථාවේදී ඒ නිලධාරීන්ට විරුද්ධව ක්‍රියා කරන්නට තිබුණා නේද ?

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (නියෝජ්‍ය ආහාර හා සමුපකාර ඇමතිතුමා)**

*(திரு. சரத்சந்திர ராஜகருணா—உணவு, கூட்டுறவுப் பிரதி அமைச்சர்)*

(Mr. Sarathchandra Rajakaruna–Deputy Minister of Food & Co-operatives)

අපේ නියෝජ්‍ය වෙළඳ හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමා කිව්වා පෙළක් නිලධාරී මහත්වරුන්ට සමිතියට යන්න ඉඩ දුන්නේ නැහැ ගැහුවා කියා. ඉතින්, එහෙම ගහනවා නම්, කොහොමද පරීක්ෂා කරන්නේ? උපදෙස් දෙන්නේ කොහොමද?

**ජේ. එල්. සිරිසේන මහතා**

*(திரு. ஜே. எல். சிறிசேன)*

(Mr. J. L. Sirisena)

ගහන තැනුත් තියෙන්නට ඇති. නමුත් නොගහන තැන් හුඟක් තිබෙනවා. නොගහන තැන්වලට මොකද වුණේ කියන එකයි මගේ ප්‍රශ්නය. බිංගිරිය සමුපකාර සංගමයේ රුපියල් දහ හත් ලක්ෂ අසූ පන් දාහක් වන තෙක් "ලීක්ජ්" එකක්—අපතයක්—තිබුණා. වතුවල ගණුදෙනු තවම නැහැ. අපි දන්නේ නැහැ ඒවාට මොකද වුණේ කියා. එක් අයෙකුගේ රුපියල් දෙලක්ෂ විසි පන් දාහක් වන තුරු ලීක්ජ් එකක් තිබුණා. අපි බලයට ඇවිත් ඒ අයගේ වැඩ තහනම් කරන තුරු වැඩ තහනම් කර තිබුණේත් නැහැ. ඒ සම්බන්ධව මේ නිලධරින් ක්‍රියා කර තිබුණේ නැහැ. එහෙම ක්‍රියා කළානම් ඒ විධියට ලීක්ජ් එකක් තියෙන්නේ කොහොමද? සාමාන්‍ය මහජනයාගෙන්, දුප්පත් සේවකයාගෙන් සිදු වන වැරදිවලට පමණයි දඬුවම් දෙන්න පුළුවන්. මේ රටේ සමුපකාරයට රජය අත ගසා එය රජයේ පාලනය යටතේ කරනවා නම් රජයේ නිලධාරීන්ගෙන් සිදු වන අඩුපාඩුවලට දඬුවම් කරන්නටත් මේ පනතින් අවස්ථාව තියෙන්නට ඕනෑ කියා මම කියනවා.

බිංගිරිය සමුපකාර සංගමයේ—මා දන්නේ නැහැ ලංකාවේ අනික් සංගම් ගැන—මේ වගේ පාඩු ඇති වුණේ එදා සිටි සමුපකාර සහකාර කොමසාරිස් වරියගෙත් සංගමය භාරව සිටි ඉන්ස්පෙක්ටර් මහතාගේත් දුර්වලකම නිසයි. කවුරුවත් මේ අයට ගහන්න ගියේ නැහැ. එක පැත්තක් පමණක් බලා සමුපකාරය සාර්ථක කරන්න බැහැ. ඇත්ත වශයෙන්ම 1970-77 කාලයේදී තිබුණු රජය මන්ත්‍රීතුමාට සමුපකාරයේ බලතල දීමෙන් කළේ වරදක්. මීට වඩා සමුපකර ව්‍යාපාරය සම්බන්ධව අවධානය යොමු කර, සමුපකාරය තුළින් අපේ ගම්බද ජනතාවගේ ආර්ථිකය දියුණු කරන්නට වැඩපිළිවෙලක් සකස් කරන්නට, උපදෙස් ලබා ගන්න පුළුවන් අයගෙන් උපදෙස් ලබාගෙන, මෙම ව්‍යාපාරය මේ රටේ ව්‍යාප්ත කරන්නට කටයුතු කරන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මෙම සංශෝධන පනතේ අඩංගු වන කාරණා දෙකක් ගැන කතා කරන්නට කැමතියි. මෙහි 4 වන වගන්තියේ අංක (3) උපවගන්තියේ මෙසේ තිබෙනවා:

"(3) මේ වගන්තියේ විධිවිධානවලින් කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කළ සමිතියක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සාමාජිකයන් වරදකටද වරදකරුවන් වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරුවන් කරනු ලැබූ විට රුපියල් දෙදහසකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රටේ සමුපකාර කටයුතු පවත්වාගෙන යන අන්දමට මේ සාමාජිකයන්ට දඬුවම් කරන්නට පිළිවෙළක් තිබෙන්නේ කොහොමද? ඒක සැහෙන බනරපතළ කාරණයක්. මොකද, අධ්‍යක්ෂ මණ්ඩලයයි කටයුතු කරන්නේ. මහ සභාවක් කැඳවන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. එවිට, අධ්‍යක්ෂ මණ්ඩලය කරන වැරදිවලට අධ්‍යක්ෂ මණ්ඩලයට දඬුවම් කරන එක හරි. නමුත් සාමාජිකයන්ට දඬුවම් කරන්නට පුළුවන් තත්ත්වයක් උදාවෙන්නෙ නැහැ, අද සමුපකාර ව්‍යාපාරය පැවැත්වෙන අන්දමට. ඒ නිසා ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු විය යුතුය කියා මම සිතනවා.

ගරු නියෝජ්‍ය කථානායතුමනි, මෙම සංශෝධන පනතේ 4 වන වගන්තිය යටතේ සංශෝධනය වන ප්‍රධාන ප්‍රඥප්තියේ 43 ආ යටතේ එන (5) වන උප වගන්තියේ මෙසේ සඳහන් වෙනවා :

"(5) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාව සහ එහි ආදායම සහ වියදම සැලකිල්ලට ගෙන මේ වගන්තියේ අවශ්‍යතාවලින් යම් සමිතියක් නිදහස් කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක, විශේෂ හෝ සාමාන්‍ය නියමයක් මගින් යම් සමිතියක් අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ අවශ්‍යතාවලින් නිදහස් කරනු ලැබිය හැකිය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට නම් තේරුම් ගන්න බැහැ, මොකක්ද මේ අංශයට යටත් වන සමිතිය කියා. සමිතියක් තිබෙනවා නම් සමුපකාර නීතිය යටතෙ පැවැත්වෙන, මම හිතනවා මේ විධියේ නිදහස් කිරීමක් කරන්නට නම් අවස්ථාවක් එළඹෙන්නේ නැත කියා. මමත් සමුපකාර කටයුතු කර තිබෙනවා, අවුරුදු විසි හතක්. එහෙම අවස්ථාවක් එළඹේද කියන එක ගැන මගේ සැකයක් තිබෙනවා.

අ. භා. 6.40

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Order, please ! The Hon. Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the ‸air, and* MR. SPEAKER *took the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජේ. එල්. සිරිසේන මහතා**
*(திரு. ஜே. எல். சிறிசேன)*
**(Mr. J. L. Sirisena)**

ගරු කථානායකතුමනි, 16 වන වගන්තියෙන් කරන සංශෝධනය ඉතාමත්ම හොඳයි. එයින් වංචාවලට පෙලඹෙන අයව සැහෙන අන්දමකට ඒවායින් නවත්වා ගන්නට පුළුවන් වෙනවා.

17 වන වගන්තියෙන් කරන සංශෝධනයෙන් ගරු ඇමතිතුමා අදහස් කරන කාර්යය හරියට කරන්නට නම් ඒ නිලධාරීන්ට විශේෂ පුහුණුවක් දෙන්නට සිදු වෙනවා. ඒ වගන්තිය තිබෙන්නේ මෙහෙමයි :

"67අ. ලියාපදිංචි කළ සමිතියකට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් විමර්සනය පැවැත්වීම, විභාග කිරීම සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ xvii වන පරිච්ඡේදය යටතට වැටෙන නඩු මෙහෙයවීම් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධරයකු විසින් කිරීම නීත්‍යානුකූල වන්නේ ය."

මේ නිලධරයකු විසින් උසාවියට ගිහිල්ලා මේ කටයුත්ත හරියට කරන්නට නම් ඒ උදවියට විශේෂ පුහුණුවක් දිය යුතුව තිබෙනවා. අද සමුපකාර දෙපාර්තමේන්තුවේ වැඩ කරන පරීක්ෂක මහත්වරුන් වැනි අයත් ඒ හා සමාන ශ්‍රේණිවල වැඩ කරන වෙනත් අයත් මේ වාගේ කටයුත්තක යෙදවීමෙන් සාර්ථක ප්‍රතිඵලයක් ලබන්නට පුළුවන් වෙන්නෙ නැහැ. අනික් පැත්තට දක්ෂ නීතිඥ මහත්මයෙක් පෙනී සිටින අවස්ථාවක.

**ගාමිනී ජයසූරිය මහතා**
*(திரு. காமினி ஜயசூரிய)*
**(Mr. Gamani Jayasuriya)**

ඒ පුහුණුව දැනට දීගෙන යනවා.

**ජේ. එල්. සිරිසේන මහතා**
*(திரு. ஜே. எல். சிறிசேன)*
**(Mr. J. L. Sirisena)**

19 වන වගන්තියෙන් කරන සංශෝධනයත් ඉතාමත්ම කාලෝචිත එකක්. කෙසේවෙතත්, මේ සමුපකාර දෙපාර්තමේන්තුවේ පරීක්ෂක මහත්වරුන්ට මීට වඩා හොඳ පුහුණුවක් දිය යුතුව තිබෙනවා. සමහර සමුපකාර පරීක්ෂක මහත්වරුන්ට ගණන් තැබීම පිළිබඳව නියම, විධිමත් දැනීමක් නැහැ. අන්න ඒ නිසයි ඇතැම් සමුපකාරවල හුඟක් දුරට වංචාවල් සිදු වෙන්නෙ. පොත් තැබීම හා ගණන් තැබීම පිළිබඳව අඩු තරමින් අවුරුද්දකවත් පුහුණුවක් මේ ගණන් පරීක්ෂක මහත්වරුන්ට ලබා දුන්නොත් මේ කටයුතු මීට වඩා හොඳින්, සාර්ථකව කරගෙන යාමට පුළුවන් වේවි.

සමුපකාර කොමිසම ගැනත් වචනයක් කියා මගේ කථාව අවසන් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. සමුපකාර සේවක කොමිසම දක්ෂ අන්දමින් ක්‍රියා කරන්නෙ නැහැ. ඒ කොමිසම පත් කළ සමහර උපදේශක මහත්වරු, යම්කිසි කාරණයක් නිසා සමුපකාර සංගමයකින් අස් කළ කෙනෙක් තමන් ළඟට ගෙනැවිත් නඩු දමන්නට කියනවා. එතකොට නඩුවක් දමනවාය කියා සමහර විට සංගමයෙන් පිළිතුරු අහන්නේ නැතුව, වගඋත්තර අහන්නේ නැතුව, ඒ ගොල්ලන්ම තීරණය දෙනවා. මේ වාගේ අක්‍රමිකතා රාශියක්ම මේ සංගමයෙන් සිද්ධ වෙනවා. මේ නිසා විශේෂයෙන්ම සමුපකාර සංගම්වල වැඩ කරන සේවකයන්ටත් අපරාධයක් වෙනවා, සංගම්වලටත් අපරාධයක් වෙනවා. එම නිසා මෙම උපදේශක මණ්ඩලයට පත් කරන උදවිය, ඉතාම අපක්ෂපාතී, අවංක, දේශපාලන අදහස් නැති, දේශපාලන භූමියට ප්‍රවේශ වෙන්නට අදහස් නොකරන අය අතරින් තෝරා ගත් උදවිය වෙන්නට ඕනැ. එසේ නැතිනම් විශ්‍රාම ගිය, පරණ සහකාර කොමසාරිස් මහත්වරුන් වැනි උදවිය තෝරා පත් කර ගන්නට පුළුවන් නම් වඩාත් හොඳයි. මොකද ? විශේෂයෙන්ම දේශපාලනයට ඇස ගසාගෙන ඉන්න උදවිය මෙම උපදේශක මණ්ඩලවලට පත් කර ගත්තාම විශාල වශයෙන් අසාධාරණකම් සිද්ධ වෙනවා. ඒකයි අපේ අත්දැකීම.

ගරු කථානායකතුමනි, සමුපකාර සංගම්වලට අද විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදුවී තිබෙන්නේ මෙම පිරිවැටුම් බද්ද නිසයි. පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් ඇමති මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර එය ඉවත් කර දෙන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමතියි. මේ වාගේ අමාරු අවස්ථාවක හාල්, පිටි, සීනි වික පවා බෙද දෙන්නට තිබෙන සමුපකාරයෙනුත් පෞද්ගලික වෙළඳුන්ගෙන් වාගේ පිරිවැටුම් බදු අය කරනවා. මෙසේ පිරිවැටුම් බදු අය කරගෙනත් රජය කරන්නේත් ඒ මුදල් මහජන සේවය සඳහා යෙදීමයි. සමුපකාරය කරන්නෙත් මහජන සේවයක්. එම නිසා සමුපකාරය වැනි එක පුද්ගලයකු පමණක් ලාභ ලබා නොගන්නා මහජන ආයතනයකින් මෙවැනි පිරිවැටුම් බද්දක් අය කරන එක මම හිතන්නේ සාධාරණ නැහැ. එම නිසා මේ කාරණය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර සමුපකාරය පිරිවැටුම් බද්දෙන් නිදහස් කළොත්, ගමේ ජීවත් වන දිළිඳු–දුප්පත්–ජනතාවට දැනට වඩා උසස සේවාවක් සමුපකාරයෙන් ලබා දෙන්නට පුළුවන් වෙනවා ඇත කියා මම කල්පනා කරනවා. කිසියම් ලාභයක් තිබෙනවා නම්, අවුරුද්ද අන්තිමේදී ආදායම් බද්දක් වශයෙන් අයකර ගන්නාට කමක් නැහැ. නමුත් පිරිවැටුම් බද්දක් ගැනීම නම් ඉතාම අසාධාරණයි. එම නිසා මේ කාරණා ටික ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරමින් මගේ කතාව අවසන් කරනවා.

ප. හා. 6.43

**ආර්. එම්. කරුණාරත්න මහතා (ඌව-පරණගම)**
*(திரு. ஆர். எம். கருணரத்ன—ஊவ-பரணகம)*
**(Mr. R. M. Karunaratne–Uva-Paranagama)**

ගරු කථානායකතුමනි, මෙම සංශෝධන පනත පිළිබඳව අපේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාත්, ඒ වාගේම නියෝජ්‍ය වෙළඳ ඇමතිතුමාත් කළ කතා වලින් පැහැදිලි වුණා, 1971 දී මෙම සමිති ප්‍රතිසංවිධානය කරන අවස්ථාව වන විට ලංකාවේ සමුපකාර සමිති වර්ග දෙකක් තිබුණු බව. එක් වර්ගයක් තිබුණා, ගමේ මට්ටමින්, ගමේ ජනතාව පාලනය කළ, පුංචි සමුපකාර සමිති. තවත් සමිති තිබුණා, තොග වෙළදාම පමණක් කළ, විශාල සමුපකාර සමිති. මෙයින් කුඩා වර්ගයේ සමිති, නැතිනම් කුඩා සමුපකාර කඩ සමිති 7700 ක් පමණ එද තිබුණා. ඒවා ඔක්කොම එකතු කර මහා සමිති 286 ක් ඇති කර තිබුණු බව ඇමතිතුමාගේ කතාවෙන් පෙනී ගියා. අද තිබෙන ප්‍රධාන ප්‍රශ්නය සමුපකාර ව්‍යාපාරය පාලනය කිරීම පිළිබඳව පැන නැගී ඇති නොයෙකුත් ගැටළුයි. එම නිසා තමයි නොයෙක් විධියෙ නීතිරීති පනවන්නට සිදු වී තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙහිදී නොයෙක් විධියෙ අදහස් ඉදිරිපත් වුණා. සමුපකාර සමිති ව්‍යාපාරය 1971 වන විට තිබුණු තත්ත්වයට නැවතත් ප්‍රතිසංවිධානය කරන්නැයි කියන ඉල්ලීමක් තිබුණා. ඒ විධියට කටයුතු කළොත්, ගමේ තිබෙන සමුපකාර සමිති ගමේ ජනතාවගේ මුදල් යොදවා, ආණ්ඩුවේ නීතිරීති නැතිනම් සමුපකාර දෙපාර්තමේන්තුවේ නීතිරීති අනුව ඒ උදවියට පරිපාලනය කරන්න පුළුවන් වෙනවා. එතකොට රජයට දැන් තරම් මුදල් යොදවන්නට සිදු වෙන්නේ නැහැ. අද තිබෙන රුපියල් දහයේ වේවා කොටස්වලින් අද පවතින බඩු මිල අනුව මෙම සමුපකාර සමිති නඩත්තු කරන්නට අමාරුයි. ගමේ ජනතාවගෙන් සැහෙන මුදලක් එකතු කර, ගමේ ජනතාවගේ අවශ්‍යතාවන් සපුරා ගන්නට, මෙම සමිති ප්‍රතිසංවිධානය කර ගන්නට පුළුවනි. ඊළඟට, මහජන බැංකුව එතැනින් ඉවත් වුණාම සමුපකාර දෙපාර්තමේන්තුවට විශාල බරක් අඩු වෙනවා. එසේම දැනට තිබෙන 286 ක් පමණ වන සමුපකාර ලොකු සමිති තොග වෙළඳ ආයතන වශයෙන් පවත්වාගෙන යන්නට පුළුවනි. එම තොග වෙළඳ ආයතනවල පරිපාලනය කෙළින්ම සමුපකාර දෙපාර්තමේන්තුවෙන්–රජයේ මට්ටමෙන්–තබා ගන්නට පුළුවනි. ඒ විධියෙ ක්‍රමයක් ඉස්සර–1971 දක්වා–තිබුණා. ඒ තත්ත්වයට මෙක පරිවර්තනය වුණොත් අමාත්‍යාංශයටත් දෙපාර්තමේන්තුවටත් මේවා පරිපාලනය ලෙහෙසි වෙනවා.

ගරු කථානායකතුමනි, අපි මොන විධියේ සංශෝධන ගෙනාවත් බොහෝ විට මේවා ක්‍රියාත්මක කරන්නට යාමේදී නොයෙකුත් අපහසුකම් වලට මුහුණ දෙන්නට සිද්ධ වෙනවා. ඒකට එක හේතුවක් සමුපකාර දෙපාර්තමේන්තුවේ දක්ෂ ගණන් පරීක්ෂක මහත්වරු නැතිකම. අනික් හේතුව, විවිධ හේතූන් නිසා ඒ පුද්ගලයන් නියම අවස්ථාවේදී ගණන් පරීක්ෂණ නොපාවැත්වීම. එසසේ ගණන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරීක්ෂණ නොකරන නිසා තමයි. කෝටි ගණන් පාඩු වෙන්නේ. 1970-77 කාලයේ පරිපාලනයේ දුර්වලකම නිසා සමුපකාර ව්‍යාපාරය තුළින් රුපියල් කෝටි සියක් පමණ විනාශ වූ බව නියෝජ්‍ය වෙළඳ ඇමතිතුමාගේ කථාවෙන් හෙළි වුණා. එහෙම තත්වයක් ඉදිරියටත් ඇති වෙන්නට පුළුවනි. එහෙම තත්ත්වයක් ආතිවීම වළක්වන්නට නම් මේවා නැවතත් 1971 තත්ත්වයට පත් වෙන්නට ඕනෑ. අපේ රජය බලයට පත් වී දැනට අවුරුදු හයක් ගත වුණා. එහෙම නම් අපි තව දුරටත් බලාගෙන සිටීම යුක්ති සහගත නැහැ. එහෙම නම් අපි යළිත් මේවා 1971 තිබුණු තත්ත්වයට ගෙනැවිත් ගමේ සමුපකාර සමිති ගමේ ජනතාවටම දී ආණ්ඩුව එයින් නිදහස් වෙන්නට ඕනෑ. එසේ කරන අතර තොග බඩු බෙදා හැරීම රජයේ පාලනය යටතේ තබා ගැනීම හොඳ බව මා මතක් කරනවා. ඒ ගැන අමාත්‍යාංශයේ අවධානය යොමු වේය කියා මා කල්පනා කරනවා.

ගරු කථානායකතුමනි, අද සමුපකාර ව්‍යාපාරවලින් ලැබෙන මිශ්‍ර ලාභයෙන් සියයට 25 කට වැඩි මුදලක් වියදම් වෙන්නේ කඩදාසි වලටයි. සමුපකාර සමිති විශාල කඩදාසි තොගයක් පාවිච්චි කරනවා. අද පවතින වෙළඳ පරිසරය අනුව ඒවා සකස් වී නැහැ. තමුන්නාන්සේලා ඕනෑම සමුපකාරයකට ගිහින් බලන්න. යම් නගරයක පුස් කාපු කඩයක් තිබෙනවා නම් එය සමුපකාර කඩයයි. නමුත් අල්ලපු කඩේ හොඳට බඩු තිබෙනවා. මෙහා පැත්තේ කඩේත් හොඳට බඩු තිබෙනවා. සමුපකාර කඩය තුළ පමණක් තිබෙන මේ පුස් කාපු ගතිය නැති කරන්නට ඕනෑ. මේ පුස් කාපු ගතිය නිසා තමයි, සමුපකාර සමිතිවලට පිරිවැටුම් බද්ද ගෙවන්නවත් සේවක අයිතිවාසිකම් දෙන්නවත් බැරි.

තවත් කාරණයක් තිබෙනවා. අද කල්පනා කර බලන්න, මේ බොහොමයක් සමුපකාර සමිති සම්පූර්ණයෙන්ම නඩත්තු වෙන්නේ මහජන බැංකුවේ මුදල්වලින්. රුපියල් දෙලක්ෂයක් තුන් ලක්ෂයක් සාමාජිකයන්ගේ මුදල් තිබෙන සමුපකාර සමිතියක් සොයා ගැනීම අමාරුයි. මා ඒ කාරණය පිළිබඳව පාර්ලිමේන්තුවට ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා. ඊකට උත්තර ලැබුණොත් ගරු මන්ත්‍රීතුමාන්ලාට දැන ගන්නට පුළුවන් වෙයි, මහජන මුදල් ඇත්තේ කුමන සමුපකාර සමිතවලද කියල. එවැනි සමුපකාර සමිති තිබෙන්නේ බොහොම සුළු ප්‍රමාණයයි. ඇත්ත වශයෙන්ම අද සමුපකාර සමිති මහජන බැංකුවේ ග්‍රහණයට අසු වී තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය ඒ තත්ත්වයෙන් මුදා ගන්නට කටයුතු කළොත් අර පුස් කාපු ගතියෙන් ඈත් කරන්නට කටයුතු කළොත් සමුපකාර ව්‍යාපාරයත් තරඟකාරී ස්වරූපයට සරිලන පරිදි සකස් කරන්නට පුළුවන් වුණොත් පමණක් ජනතාවගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය පරිදි සමුපකාර ව්‍යාපාරයෙන් ප්‍රයෝජනයක් ලබා ගන්නට පුළුවන් වෙනවාය කියායි මා කල්පනා කරන්නේ.

සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීමේදී නොයෙකුත් විධියේ අක්‍රමිකතා සිද්ධ වන බවත් මා මතක් කරන්නට ඕනෑ. සමුපකාර ව්‍යාපාරය සම්බන්ධව මට පෙර කථා කළ ආණ්ඩු පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු කළ ප්‍රකාශ මමත් අනුමත කරනවා. ඒ කරුණු ගැන අවධානය යොමු කොට කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා. මා සිතන හැටියට කාලයක් තිස්සේ සමුපකාර දෙපාර්තමේන්තුවට හොඳ දක්ෂ කොමසාරිස් වරයෙක් හිටියේ නැහැ. මගේ කල්පනාවේ හැටියට දැන් සමුපකාර දෙපාර්තමේන්තුවට හොඳ දක්ෂ සමුපකාර කොමසාරිස් වරයෙකු පත්ව ඉන්නවා. එතුමා කාලයක් තිස්සේ සමුපකාර දෙපාර්තමේන්තුවේ සේවය කළ කෙනෙක්. එතුමාට මේ ව්‍යාපාරය දියුණුවෙන් දියුණුවට පත් කරන්නට අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
*(திரு. றிச்சட் பத்திரன—அக்மீமன)*
(Mr. Richard Pathirana–Akmeemana)

ගරු කථානායකතුමනි, සමුපකාර සමිති (සංශෝධන) පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කර මේ අවස්ථාවේදී මමත් වචන කීපයක් ප්‍රකාශ කරන්නට අදහස් කරනවා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරු කීප දෙනෙකුම ප්‍රකාශ කළ පරිදි, ලංකාවේ සමුපකාර සමිති ව්‍යාපාරය ගැන කථා කරන විට 1956 මහජන එක්සත් පෙරමුණු රජයේ සමුපකාර අමාත්‍ය ධුරය දැරූ දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමා ගැන අපට විශේෂයෙන්ම සඳහන් කරන්නට වෙනවා. එතුමාගේ පුත්‍රයකු වූ මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) මේ සංශෝධන පනත් කෙටුම්පත ගැන කරුණු රාශියක් ප්‍රකාශ කළා.

ගරු පිලිප් ගුණවර්ධන ඇමතිතුමා 1957 දී විවිධ සේවා සමුපකාර සමිති පනත ඉදිරිපත් කළේ මේ රටේ ජන ජීවිතයට ඉතාම වැදගත් සම්බන්ධයක් තිබෙන සමුපකාර සමිති ව්‍යාපාරයට නව ජීවනයක් ලබා දීමේ විශේෂ බලාපොරොත්තු වෙනුයි. ඒවාගේ ම මේ රටේ ජන ජීවිතයට සම්බන්ධ සියලුම අංශ සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ කරන්නට එතුමා බලාපොරොත්තු වුණා.

රජයේ මන්ත්‍රීවරුන් රාශියක් ප්‍රකාශ කළා, පසුගිය කලබල සමයේදී ලංකාවේ සමුපකාර සමිති මගින් ජනතාවට අවශ්‍ය භාණ්ඩ සැපයීම පිළිබඳව විශාල සේවාවක් ඉටු කළාය කියා. මම අහන ප්‍රශ්නය නම්, විවෘත ආර්ථිකය නිසා අද ලංකාවේ සමුපකාර සමිතිවලට මුහුණ දෙන්නට සිදු වී තිබෙන තත්ත්වය යටතේ තව කොපමණ කාලයක් අද ලංකාවේ සමුපකාර සමිතිවලට මේ ආකාරයේ සේවාවක් ඉටු කරන්නට ලැබේවිද කියන එකයි.

විශේෂයෙන්ම අද ප්‍රාථමික සමුපකාර සමිතිවලට විශාල තර්ජනයකට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. ඒ මන්ද, විවෘත ආර්ථික ක්‍රමය යටතේ පෞද්ගලික අංශය සමග තරඟයක යෙදෙන්න පුළුවන් ශක්තියක් එම සමුපකාර සමිතිවලට නැති නිසා. නිෂ්පාදනය, අලෙවි කිරීම, ප්‍රවාහනය, බෙදහැරීම පමණක් නොව සේවකයන්ට ණය දීම, සෞඛ්‍ය පහසුකම් සැලසීම, අවමංගල අවස්ථාවලදී ඒ අය සඳහා යම් යම් සහන සැලසීම වැනි දේවලුත් ඉෂ්ට කෙරෙන සමුපකාර සමිති රාශියක් ලංකාවේ පිහිටුවා තිබෙනවා.

ඒ අනුව බැලුවාම උපතේ සිට මරණය දක්වා ජන ජීවිතයට ලංකාවේ සමුපකාර සමිති සම්බන්ධ වී තිබෙනවා. නමුත් මෙහිදී කනගාටුවට කරුණක් නම්, අද තිබෙන ඇතැම් සමුපකාර සමිති නමට පමණක් සීමා වී තිබෙනවා. අද තිබෙන සමුපකාර සමිති අතරින් නියම ක්‍රියා මාර්ගයන් අනුගමනය කරමින් රැස්වීම් නිසියාකාර පවත්වමින් කටයුතු කරන්නේ අංශ කීපයක සමිති පමණයි. විශේෂයෙන්ම ලංකාවේ ණය දෙන සමුපකාර සමිති පමණයි, මම හිතන විධියට ඒ කාර්යය නිසියාකාරව ඉෂ්ට කරන්නෙ. ඒවා නියම ආකාරයෙන් කාරක සභා රැස් නියම අන්දමට මහ සභා රැස්වී ඒ ඒ කාර්යයන් ඉටු කරන අතර අනික් සමිති බොහෝ විට නමට පමණක් සීමා වූ සමිති බවට පත් වී තිබෙනවා.

විශේෂයෙන් කලවාන ගරු මන්ත්‍රීතුමාත් (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) තවත් ගරු මන්ත්‍රීවරුන් රාශියකුත් මතු කළ ප්‍රශ්නයක් මමත් මතක් කරන්න කැමතියි. එනම් සමුපකාර සේවකයන් මාරු කිරීම, පත් කිරීම, වැඩ තහනම් කිරීම, සහ අස් කිරීම සම්බන්ධවයි. මේ සම්බන්ධව සාධාරණ ක්‍රමයක් අද ක්‍රියාත්මක වන්නෙ නැහැ. සමුපකාර සමිති රාශියකම නියම සුදුසුකම් නැති සේවකයන් රාශියක් නොයෙක් තනතුරුවලට පත් කර තිබෙනවා. ඒවාගේම වැඩ තහනම් කිරීමේදී ඉතාම අසාධාරණ අන්දමට සමුපකාර සමිති සේවකයන් රාශියකගේ වැඩ තහනම් කර තිබෙනවා. මා නියෝජනය කරන අක්මීමන ආසනයේ අක්මීමන විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ඉතාම අසාධාරණ අන්දමට සමුපකාර සමිති සේවකයන් රාශියකගේ වැඩ තහනම් කර තිබෙනවා. සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් සමහර සේවකයන් නැවත සේවයට බඳවා ගැනීමට නියම කර තිබුණත් අධ්‍යක්ෂ මණ්ඩලය ඒ කාර්යය ඉෂ්ට කරන්නේ නැහැ.

අද උදේ මම සමුපකාර සේවක කොමිෂන් සභා කාර්යාලයට ගිය වෙලාවෙ ඒ මහත්වරුන් කිව්වේ ඒ සේවකයන් නැවත සේවයට බඳවා ගැනීමට අවශ්‍ය යම් නියමයන් කරන්නට ඒ අයට බල තල මදි බවයි. අද මේ සභාවේදී ගරු මන්ත්‍රීවරුන් රාශියක් සමුපකාර සේවක කොමිෂන් සභා ගැන විවිධාකාරයේ විවේචන පළ කළා. මමත් ඒ අදහස් අනුමත කරන අතර මම අහන ප්‍රශ්නය නම්, සමුපකාර කොමිෂන් සභාවට අද තිබෙන බලතල යටතේ සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩලවලට බලපෑමක් කරන්න පුළුවන්ද, නැවත ඒ සේවකයන් බඳවා ගන්නය කියා යන්නයි.

බොහෝ විට කොමිෂන් සභාවෙන් සේවකයන්ට දන්වන්නේ ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට විරුද්ධව නඩු පවරන්න කියායි. නමුත් අසරණ දුප්පත් සේවකයන් රැකියාවෙන් ඉවත් කළාට පස්සෙ ඒ අයට පුළුවන්කමක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රිචර්ඩ් පතිරණ මහතා]

නීති මගට බැහැල තමන්ගේ රැකියාව නැවත ලබා ගන්න ඉදිරිපත් වෙන්න. ඒ නිසා සමුපකාර කොමිෂන් සභාවට යම්කිසි බලයක් තිබෙන්න ඕනෑ, එහෙම නැත්නම් කොමසාරිස්තුමාට යම්කිසි බලයක් තිබෙන්න ඕනෑ, අසාධාරණ විධියට සේවයෙන් අස් කළ අය නැවත සේවයට බඳවා ගැනීම සඳහා නියමයක් කරන්න.

මේ සංශෝධිත පනත යටතේ තවත් වැදගත් කාරණයක් මතු වෙනවා. දැන් තිබෙන ක්‍රමයේ හැටියට යම් සමුපකාර සේවකයකු අස් කළොත් අභියාචනයක් ඉදිරිපත් කරන්නට තිබෙන්නේ සමුපකාර සේවක කොමිෂන් සභාවටයි. මගේ අදහසේ හැටියට දැන් මේ පනතින් සමුපකාර කොමසාරිස්තුමාටත් යම්කිසි බලයක් ලැබෙනවා, යම් යම් අවස්ථාවලදී සේවකයන් අස් කරන්න. එතෙන්දී අභියාචනය ඉදිරිපත් කළ යුත්තේ කොමසාරිස්තුමාට විරුද්ධවද කියා යම්කිසි ප්‍රශ්නයක් පැන නගිනවා.

දිවංගත පිලිප් ගුණවර්ධන ඇමතිතුමා විසින් "සමුපකාර බැංකුව" නමින් ලංකාවේ ආරම්භ කරන්නට නියමිතව තිබුණු බැංකුව පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මගින් මහජන බැංකුව නමින් ආරම්භ කළා. ඒ මහජන බැංකුව පිහිටුවන අවස්ථාවේදී බලාපොරොත්තු වූ පරමාර්ථය ඉටු කරන්නට අද මහජන බැංකුව සමත් වී නැහැ. මහජන බැංකුව කටයුතු කළ යුතුව තිබුණේ සමුපකාර බැංකුවක් හැටියටයි. නමුත් අද එය වාණිජ බැංකුවක් හැටියට කටයුතු කරනවා. ඒ නිසා විශේෂයෙන්ම සමුපකාර අංශය සම්බන්ධව ණය දීමේ යම්කිසි ආයතනයක් අවශ්‍ය වී තිබෙනවා.

ණය දීම සම්බන්ධව සමුපකාර සමිති ඉතාමත්ම ආදර්ශමත්ව කටයුතු කර තිබෙන බව මම ඉතා සංතෝෂයෙන් මතක් කරන්න කැමතියි. මා නියෝජනය කරන ආසනයේ මීපාවල ණය දෙන සමුපකාර සමිතිය ලංකාවේම ඉතාම ආදර්ශමත් සමිතියක් වශයෙන් හඳුන්වන්නට පුළුවන්. මා හිතන හැටියට තමන්ගේ සාමාජිකයකුට රු. 10,000 දක්වා ණය දීමට පුළුවන් තත්ත්වයකට එය පත්කර තිබෙනවා, ඒ සාමාජික මහත්වරු විසින්. ඒ ආකාරයෙන් මේ සමුපකාර ණය දෙන සමිතිවල සහයෝගය ඇතිව සමුපකාර ණය දෙන බැංකුවක් පිහිටුවීමේ වැදගත්කම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කරන්න මම කැමතියි.

අනික් කාරණය නම් අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම සම්බන්ධයෙන් කෙරෙන අකටයුතුයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා, පනතේ සාමාජික මුදල වැඩියි ඒ නිසා එය රුපියල කිරීම සුදුසුයි කියා. එහෙත් මගේ මතකය නිවැරදි නම් රුපියල් පනහේ සාමාජික මුදල ගෙවිය යුතුව තිබුණේ එක වාරයකදී නොවෙයි. වාර කීපයකදී එය ගෙවන්නට හැකිකම තිබුණා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

ගරු මන්ත්‍රීතුමා තව කොපමණ වේලාවක් ගන්නට බලාපොරොත්තු වෙනවාද ?

**රිචඩ් පතිරණ මහතා**
*(திரு. றிச்சட் பத்திரன)*
**(Mr. Richard Pathirana)**

තව විනාඩි 10 ක්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

7 ට අවසාන කරන්න. නැත්නම් හෙට පටන් ගන්න වෙයි.

**රිචඩ් පතිරණ මහතා**
*(திரு. றிச்சட் பத்திரன)*
**(Mr. Richard Pathirana)**

රු. 50 හේ සාමාජික මුදල වැඩි නම් අධ්‍යක්ෂ මණ්ඩලවලට පත් විමට යම් නියමිත කාල සීමාවක් සාමාජිකත්වය දැරිය යුතුයි කියා නියමයක් පැනවිය යුතුව තිබෙනවා. අවුරුදු 10ක් හෝ ක්‍රියාකාරී සාමාජිකයෙක් හැටියට සමුපකාර සමිති සංගමයක ක්‍රියා කිරීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයකට පත් වන්නට අවස්ථාව සැලසිය යුතුයි කියන එකයි අපේ අදහස.

පසුගිය රජයේ මන්ත්‍රීවරු සභාපති වුණාය, ඒ අය අකාර්යක්ෂම විධියට අසාධාරණ විධියට කටයුතු කළාය කියා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු රාශියක් චෝදනා කළා. මම මෙහිදී ප්‍රකාශ කරන්න ඕනෑ අද සමහර සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩලවල සභාපතිවරු හැටියට එක්සත් ජාතික පක්ෂයේ සංවර්ධන සභා සභාපතිවරු සිටින බව. ඒ අයත් එක්තරා විධියක මන්ත්‍රීවරු. ඒ අය විශාල ලෙස දේශපාලන වශයෙන් පළිගන්නා බවත් ඉතාම අකාර්යක්ෂම හා අසාධාරණ විධියට ක්‍රියා කරන බවත් පැහැදිලිව සඳහන් කරන්නට පුළුවන්කම තිබෙනවා. එම නිසා මගේ අදහස නම් දේශපාලන පක්ෂ භේදය සමුපකාර සමිති තුළින් සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතුව තිබෙනවා කියන එකයි. සමුපකාර සමිතිවලට දේශපාලනය බලපාන්නට ගියොත් පොදු ජනතා ව්‍යාපාරයක් හැටියට ඉදිරියට යන්නට සමුපකාර ව්‍යාපාරයට පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ.

විශේෂයෙන්ම අක්මීමන විවිධසේවා සමුපකාර සමිතියේ සහෝදර සේවක මහත්වරුන්ට විඳින්නට සිදු වී තිබෙන කරදර රාශියක් පිළිබඳව පළාතේ මන්ත්‍රීවරයා හැටියට මට පැමිණිලි රාශියක් ලැබී තිබෙනවා. 11 වන වාරයේ ආහාර මුද්දර ගෙන ඒම සඳහා උප දිසාපති කාර්යාලයට ගිය සමහර සේවකයින්ට ප්‍රමාද වී පැමිණීම ගැන රු 75 ක දඩයක් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නියම කර අය කර ගෙන තිබෙනවා. ඒ ප්‍රමාදය සිදු වී තිබෙන්නේ උප දිසාපති කාර්යාලයේ ඇති වූ ප්‍රමාදයක් නිසයි. ඒ නිසයි, ඒ සේවකයින්ට ඒ දඩ මුදල ගෙවන්නට සිදු වී තිබෙන්නේ. මෙන්න මේ වගේ ඉතා අසාධාරණ විධියේ පළිගැනීම්වලට ලක් වන කොටසක් හැටියට සමුපකාර සේවකයින් හඳුන්වන්නට පුළුවන්. එම නිසා මෙන්න මේ කරුණු ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

*එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.*
*එතැන් සිට විවාදය 1983 අගෝස්තු 11 වන බ්‍රහස්පතින්ද පවත්වනු ලැබේ.*

*அப்போது பி. ப. 7 மணியாகிவிடவே அலுவல்கள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திப்போடப்பட்டது.*

*விவாதம் 1983, ஓகஸ்ட் 11 வியாழக்கிழமை மீளத் தொடங்கும்.*
*It being 7 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Thursday, 11th August 1983.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
**(Mr. M. Vincent Perera)**

I move,

"That the Parliament do now adjourn."

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මෙරිල් කාරියවසම් මහතා (අගලවත්ත)**
*(திரு. மெரில் காரியவசம்—அகலவத்த)*
**(Mr. Merril Kariyawasam–Agalawatta)**

ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නයක් ඇසීමට කල් දී තිබෙනවා. පසුගිය කලබලකාරී අවස්ථාවේදී සිදුවුණු නොයෙකුත් පාඩු අතර සිංහල චිත්‍රපටවලටත් විශාල හානියක් සිදු වී තිබෙන බව දැනගන්නට ලැබී තිබෙනවා. ලංකාවේ තිබුණු සිංහල චිත්‍රපටවල ගර්භය වශයෙන් හඳුන්වන්නට පුළුවන් වන්නේ විජය ස්ටුඩියෝ සහ සිලෝන් ස්ටුඩියෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යත ආයතන දෙකයි. මේ අලාභ හානි කිරීමේදී, පෙන්නා තිබුණු හා ඉදිරියේදී පෙන්වන්න තිබුණු චිත්‍රපට රාශියක් නොයෙක් අය විසින් ගෙන ගොස් තිබෙනවා. එසේ නැත්නම් ඒවා ගින්නෙන් පිළිස්සී තිබෙනවා. හුඟාක් අවස්ථාවලදී ඒ අවට පුද්ගලයන් නොදන්නා කමින් මේ චිත්‍රපටවලට හානි කර තිබෙන බව ආරංචි වී තිබෙනවා. මේ චිත්‍රපට හැදීමට පාවිච්චි කර තිබෙන ද්‍රව්‍යවල රිදී මිශ්‍රණයක් තිබෙනවාය කියන විශ්වාසය උඩ ඇතැම් කාන්තාවන් පවා මේ චිත්‍රපට අඩංගු පෙට්ටි ගෙන ගොස් තිබෙන බව දැනගන්නට ලැබී තිබෙනවා.

මේ නිසා අවුරුදු තිස් පහක පමණ ඉතිහාසයක් මුළුල්ලේ ඒකරාශි වුණු චිත්‍රපට විශාල ප්‍රමාණයක් අද ඒ ඒ තැන්වල විසිර තිබෙනවා. මේ අවස්ථාවේදී චිත්‍රපටයට හිතකාමී පුද්ගලයන් පිරිසක් ඇවිත් මේ චිත්‍රපටවලින් විශාල ප්‍රමාණයක් බේරාගෙන තිබෙනවා. ඒ අය අතර, ඇලරික් ලයනල් ප්‍රනාන්දු මහත්මයා චිත්‍රපට කැන් 3500 ක් පමණ බේරාගෙන තිබෙන බව ආරංචියි. තිල් රූපසිංහ, සනත් රූපසිංහ, බැප්ටිස්ට් ප්‍රනාන්දු, විජය කුමාරතුංග, සනත් ගුණතිලක, රවින්ද්‍ර රත්දෙනිය යන මහත්වරුත් මාලනී පොන්සේකා මෙනවියත් විශාල වශයෙන් මහන්සි වී චිත්‍රපට රාශියක් බේරා ගත් බව දැනගන්නට තිබෙනවා.

මෙසේ බේරා ගත් චිත්‍රපට කැලණියේ සරසවි චිත්‍රාගාරයේදී තෝරමින් පිරිසක් මහන්සි ගන්නවා, මේ චිත්‍රපට මොනවාද කියා දැනගන්නට. ඇත්ත වශයෙන්ම කොයිතරම් දුරට මේ හානිය සිදු වී තිබෙනවාද කියතොත් එය කොයිතරම් බරපතලදැයි ඒවායේ නිෂ්පාදකයන් පවා දන්නේ නැහැ. මේවා එකතු කර තෝරා බේරා බැලුවාට පසුවයි හානියේ ප්‍රමාණය දැනගන්නට පුළුවන් වන්නේ.

කෙසේ හෝ ඉදිරියේදී පෙන්වන චිත්‍රපට හැට ගණනක් තිබුණු බව අපට විශ්වාස කරන්නට පුළුවනි. ඒවායේ නෙගටිව් පිටපත් තිබුණේ මේ චිත්‍රාගාරවල. මේ නෙගටිව් පිටපත් සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් හෝ නැති වී තිබෙන බව අපට පිළිගන්න වෙනවා. ඒ නිසා මේ නිෂ්පාදකයන්ට දරන්නට සිදු වී තිබෙන පාඩුව අප්‍රමාණයි.

මම මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ප්‍රශ්නයක් වශයෙන් ඉදිරිපත් කරන්නේ මේ කාරණයයි. මේ චිත්‍රපට නිෂ්පාදකයන්ට දරන්නට සිදු වුණු පාඩුව වෙනුවෙන් යම් සහනයක් සැලසීමක් වශයෙනුත්, මේ කර්මාන්තයට අත හිත දීමක් වශයෙනුත්, ගරු ජනාධිපති උතුමාණන් විසින් ඇති කර තිබෙන පුනරුත්ථාපන අධිකාරිය මගින් මේ සම්බන්ධයෙන් යම්කිසි දෙයක් කරන්නට බැරිද යන ප්‍රශ්නය මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා.

**දිනේෂ් ගුණවර්ධන මහතා** (මහරගම)
*(திரு. தினேஷ் குணவர்த்தன—மஹரகம)*
(Mr. Dinesh Gunawardene–Maharagama)

පසුගිය ද ඇති වුණු කලබලකාරී තත්ත්වය නිසා සේවකයන් දහස් ගණනකගේ සේවාවන් ඔවුන්ට අහිමි වුණ තත්ත්වයක් ඇති වී තිබෙනවා. කර්මාන්තශාලා ගණනාවක සේවකයන්ට සහ සාප්පු සහ කාර්යාල පනත යටතේ ආවරණය වන සේවකයන් දහස් ගණනකටත් රැකියා කර ගන්නට බැරි තත්ත්වයක් අද ඇති වී තිබෙනවා. සේවකයන් හැටියට ඒ අයගේ වරදකින් නොවෙයි මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ. මේ තත්ත්වය යටතේ, නීතිය අනුව සේවය කිරීමේ අයිතිය ඔවුන්ට ලැබිලා නැහැ. ගිය මාසයේ පඩි ලබා ගැනීමට පෙර මේ සිද්ධිය වුණු නිසා, ගිය මාසයේ වැටුප් නොලැබුණු විශාල සේවක ප්‍රමාණයක් සිටිනවා. සමහර අයට ඒ වැටුප් ලබා දීමට කටයුතු කරගෙන ගියත් බොහෝ ආයතනවල එම වැටුප් තවම සම්පූර්ණයෙන්ම ලබා දී නැහැ. ඒ අතර තව ඉදිරියටත් මෙම සේවකයන්ට කොපමණ කාලයකට වැටුප් ලබා දෙන්නට පුළුවන්ද යන ප්‍රශ්නයත් මතු වී තිබෙනවා. මන්ද, තමන්ගේ ජීවිකාව කරගෙන යන්නට, නාගරික ප්‍රදේශවල ජීවත් වන අයට තිබුණු එකම ආදායම් මාර්ගය හැටියටයි මේ රැකියා මාර්ගය තිබුණේ. එයින් ඇති වී තිබෙන ප්‍රශ්නය සුළු ප්‍රශ්නයක් නොවෙයි. විශාල ප්‍රශ්නයක්. මා හිතන විදියට, මා දන්නා විදියට, අපට තිබෙන ආරංචිවල විදියට සේවක පිරිස 5000 කට වැඩියි. විශේෂයෙන් ගරු කම්කරු ඇමතිතුමා නිවේදනයක් කර තිබුණා, ප්‍රමාණය හරියාකාර දැන ගැනීමටත්, ඒ අයගේ විශේෂයෙන් ආදායම ගැන ගෙන තිබෙන පියවරවල් සහ ගන්නට හදන පියවරවල් ගැන දැන ගැනීමටත් කම්කරු අමාත්‍යාංශයට පැමිණ, ලියාපදිංචි කිරීමක් හෝ දැනුම් දීමක් කරන්නටය කියා. එසේ පියවර ගැනීමට නොහැකි තත්ත්වයක් මතුවනවා නම්, හාම්පුත්තු මගින් හෝ මාස කීපයකට වැටුප් ගෙවන්නට හැකියාවක් ඇති වෙනවාද, නැද්ද යන ප්‍රශ්නය ගැනත් සොයා බැලිය යුතුයි. ඒ ප්‍රශ්නය මත ඔවුන්ගේ ජීවත් වීමේ ප්‍රශ්නය අර්බුදයක් වෙනවා. මහා වැඩ වර්ජනයෙන් රැකියා අහිමි වුණු සේවකයන්ගේ ගණයට වැටී, ඉදිරි කාලයේදී ඔවුන් උන් හිටි තැන් නැති, කර කියා ගන්නට දෙයක් නැති පිරිසක් බවට පත් වෙනවා.

පුනරුත්ථාපන වැඩපිළිවෙල යටතේ කර්මාන්තශාලා යථා තත්ත්වයට ගෙන ඒමට හෝ ඒ අයට ජීවත්වීම සඳහා සම්පූර්ණ වැටුප ලබා දෙන්නට ආණ්ඩුවට මැදිහත් වන්නට නොහැකි නම්, අඩු වශයෙන් ඔවුන්ගේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගන්නට පුළුවන් ආකාරයේ වැඩපිළිවෙලක් හෝ කම්කරු ඇමතිතුමාගේ මැදිහත් වීමෙන් ඇති කරනවා නම් අඩු වශයෙන් එය තාවකාලික සහනයක්වත් වෙනවා. මේ සේවකයන්ගේ ශ්‍රමයේ වටිනාකමින් මහා ධන කුවේරයන් බිහිවුණු බව මම ආණ්ඩුවටත්,ගරු කම්කරු ඇමතිතුමාටත් ·කියන්නට කැමතියි. මාස කීපයකට වැටුප් ගෙවීම භාර ගන්නට බැරියයි කීමට හාම්පුතුන්ට හැකියාවක් නැහැ. එසේම ඒ විදියට වැටුප් නොලැබෙනවා නම් මේ පුනරුත්ථාපනය කරන කර්මාන්තශාලා සහ වෙළඳ ආයතනවල වැටුප් නොලැබෙන කාලයට අඩු වශයෙන් අළුතෙන් හදන කර්මාන්ත ශාලා අයිතියේ කොටස් කාරයන් හැටියට හෝ මේ සේවකයන් පරිවර්තනය කරන්නට ආණ්ඩුව හෝ කම්කරු ඇමතිතුමා හෝ මැදිහත්වී ක්‍රියා කරාවියයි මම බලාපොරොත්තු වෙනවා.

මම විශේෂයෙන් මෙම ප්‍රශ්නය මතු කරන්නේ මගේ මහරගම ආසනයේ හයිඩ්‍රාමනී නැමැති කර්මාන්ත ශාලාවේ දහස් ගණනක් සේවය කළ නිසයි. ඒ කම්හල අද ගිනිබත් වෙලා. ඒ සේවකයන් සී සී කඩ ඇවිදිනවා. උදේට රක්ෂා හොයා ගෙන දහස් ගණනක් පාරවල්වල ඇවිදිනවා. සමහර අයට සමුපකාරයෙන් බෙදූ කෑම ඒක ගන්නට ආදයම නැහැ. කලබල වෙයි කියලා මුල් දවස් හතරේ පහේ වැඩිපුර වියදම් කර බඩු වැඩියෙන් තබා ගත්තා. දැන් ඒ නිසා වියදම් කරන්නට මුදල් නැහැ. මේ ගැන මැදිහත් වෙන ලෙස ගරු කම්කරු ඇමතිතුමාගෙන් මා විශේෂ෴ෙන් ඉල්ලා සිටිනවා. ඒ අයට හේතුවක් නැතිව අහිමි වී තිබෙන රැකියා සහ ආදයම් ලබා දීමට හෝ එසේ ආදයම් ලබා දීමට නොහැකි තත්ත්වයක් තිබෙනවා නම් ඔවුන්ට ජීවත්වීමට හැකි තත්ත්වයක්—ආහාර ලබා ගැනීමට හැකි තත්ත්වයක්—සහතික කරන්නටත් වැටුප් නොලැබෙන කාලයට අළුතෙන් ඉදිවන කර්මාන්ත ශාලාවල ඔවුන් කොටස් කාරයින් හැටියට පරිවර්තනය කරන්නටත් බැරිද යන්න සලකා බලන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ආචාර්ය ආනන්දතිස්ස ද අල්විස් මහතා (රාජ්‍ය ඇමතිතුමා)**
*(கலாநிதி ஆனந்ததிஸ்ஸ த அல்விஸ்—இராசாங்க அமைச்சர்)*
(Dr. Anandatissa de Alwis–Minister of State)

Mr. Speaker, Sir, in regard to the question raised about the Vijaya Studio, the Film Corporation is in charge of His Excellency the President. I discussed this question with him and I am directed to say that under the new Rehabilitation Authority that has been gazetted under His Excellency the President, steps will be taken to take over the Vijaya Studio as state property for the present. It is then proposed to appoint a Board consisting of people who have long been in the film industry, the purpose of which is to get back the valuable film materials that have been taken away. What had been burnt, of course, is beyond remedy. It is also then proposed to rehabilitate this studio. But the Government intends to have a substantial share in the future undertaking that will continue the studio,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ආනන්දතිස්ස ද අල්විස් මහතා]

and arrangements will be made for people in the Sinhala film industry to have a control of its functioning and its ownership together with the former owner, Mr. Gunaratnam.

**එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (කම්කරු නියෝජ්‍ය ඇමතිතුමා)**

*(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா—தொழிற் பிரதி அமைச்சர்)*

(Mr. M. Joseph Michael Perera–Deputy Minister of Labour)

ගරු කථානායකතුමනි, මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් දීමට බලාපොරොත්තු වෙනවා. පසුගිය දිනවල ඇතිවූ කලබලවලින් කර්මාන්ත ශාලා කීපයකටම විශාල වශයෙන් අලාභ හානි සිදු වුණා. ඒ වගේම ඒවායේ විශාල පිරිසක් රැකියාවල් කළා. ඒ විශාල පිරිසට අද රැකියාවල් නැති වී තිබෙනවා. මේ පිළිබඳව අපි දැනට සංඛ්‍යා ලේඛන එකතු කරගෙන යනවා. දැනට ලැබිල තිබෙන සංඛ්‍යාලේඛන අනුව විශාල ප්‍රමාණයේ කර්මාන්ත ශාලා 70 කුත් ඒ වගේම කඩ සාප්පු ඇතුළු සුළු ව්‍යාපාර 2500 ක් පමණත් මේ ප්‍රශ්නයට ගොදුරු වී තිබෙනවා. ඒ වගේම දැනට ලැබී තිබෙන සංඛ්‍යා ලේඛන අනුව 24,000 කගේ පමණ රැකියාවත් නැතිවී තිබෙනවා.

සේවකයන්ගේ ජූලි මාසයේ වැටුප පිළිබඳව—වැඩ කළ මාසයක වැටුප පිළිබඳව—ගරු මන්ත්‍රීතුමා විශේෂයෙන්ම මතක් කළා. ඒ පිළිබඳව අපි දැනට කටයුතු කරගෙන යනවා. කොළඹ 'සිත්ටෙක්ස්' ආයතනය, මහාරාජා සංවිධානය, හයිඩ්‍රාමනී, සෙන්ට් ඇන්තනීස් යනාදී ආයතනවල ජූලි මාසයේ වැටුප් දැන් ගෙවා ගෙන යනවා. සමහර කොටස්වලට දැන් ගෙවා අවසානයි. තවත් අපට ප්‍රශ්නයක් තිබෙනවා. සමහර අයිතිකරුවන් තවමත් පුනරුත්ථාපන කඳවුරුවල ඉන්නවා. කෙසේ වුණත් ඉතාම ඉක්මණින් ඒ වැඩ කළ මාසයේ වැටුප ගෙවන්නට කටයුතු කරනවා. ඒ පිළිබඳව අපට නීත්‍යානුකූලව කටයුතු කරන්න පුළුවන්. විශේෂයෙන්ම ප්‍රශ්නයක් වී තිබෙන්නේ කර්මාන්ත ශාලා නැවත සකස් කරන තුරු මේ අයට ලැබෙන ආදායම පිළිබඳවයි. ඒ පිළිබඳව වහාම වැඩපිළිවෙලක් සකස් කරන්නට රජය දැනට සාකච්ඡා කරගෙන යනවා. ඒ අනුව ඒ අයට ජීවත්වීමට යම්කිසි පිළිවෙලක් සකස් කර දීමට රජය අදහස් කරනවා. ඒ පිළිබඳව දැනටමත් වැඩකටයුතු කරගෙන යනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා.7.15 ට 1983 අගෝස්තු 11 වන බ්‍රහස්පතින්ද අ.භා. 3 වන තෙක් කල් ගියේය.*

*அதன்படி, பி. ப. 7.15 மணிக்கு பாராளுமன்றம், 1983 ஓகஸ்ட் 11, வியாழக்கிழமை பி. ப. 3 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 7.15 p.m. until 3 p.m. on Thursday, 11th August, 1983.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1983 අගෝස්තු 24 වන බදාද**

**නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.**

***குறிப்பு***

***அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு***

***1983 ஓகஸ்ட் 24, புதன்கிழமைக்குப் பிந்தாமற்***

***கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.***

**NOTE**

**Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD,**

**not later than**

**Wednesday, 24th August 1983**

* * * * * * * * * * *

| | | |
|---|---|---|
| **Contents of Proceeding** | **:** | **From 6.00 p.m. on 09.08.1983 to 7.15 p.m. on 10.08.1983** |
| **Final set of manuscripts received from Parliament** | **:** | **10.00 p.m. on 10.08.1983** |
| **Printed copies despatched** | **:** | **11.08.1983 afternoon** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org